ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 අපේ ඉරණම් නිමේෂය



08 උඩුගම්පළ සා. පීතරේ වංශ කථාව



12 කතෝලික අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම




# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07




ශ්‍රී ලංකා අපෝස්තුළුවර භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන්ගේ උපන් මංගල්‍ය දිනය අදයි



ලෝක දේව කැඳවීම් යැදුම් දිනය අදයි

(කිතුනු පවුල් තුළින් අප දූ පුතුන් හට තව තවත් දේව කැඳවීම් ලැබේවා! යි අයදිමු)

ක්‍රි.ව. 2013 ක් වූ අප්‍රේල් 21 ඉරිදා 147 වෙළුම 45 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/51/NEWS/2013 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## "මිදුම කියන්නට වහල් දනන් හට - සමිඳු වසර පවසන්නට දුගිනට "

# එන්න මගෙ පුතේ - එන්න මගෙ දුවේ

### ලෝක දේව කැඳවීම් යැදුම් දිනය සැමරුම මෙවර වෙනස් මඟක් ගනී

**කිතුනු පවුල මූලිකකොට ගෙන මෙවර ලෝක දේව කැඳවීම් යැදුම් දිනය වෙනස් මුහුණුවරකින් සැමරීමට කලාපීය මට්ටමින් සියලු කටයුතු සූදානම්කොට ඇති බව එකී අංශ භාර පදවි නාහිමි අතිගරු ජේ. ඩී. ඇන්තනි පියතුමා ඥානාර්ථ ප්‍රදීපයට පැවසීය.**

කැඳවීම් හා කැපවීම් ජීවිත අර්ථ ගන්වාලන්නට විධිමත් වැඩපිළිවෙලක් දැනටමත් සකස් වී ඇති බව පවසන පියතුමා පවුල මූලික කොටගෙන පෞද්ගලිකවම දරුවන හට කථා කෙරුමට විධිමත් වැඩ පිළිවෙලක් දියත් කොට ඇති බවත් එහි ප්‍රතිඵල මෙවර කලාපීය මට්ටමින් පැවැත්වෙන රැළි තුළින් පැහැදිලිව දැක ගත හැකි බවද වැඩි දුරටත් අවධාරණය කර සිටී. විවිධ පදවි මට්ටමින් මේ සඳහා වැඩමුළු සංවිධානය කොට ඇති බව ඒ ඒ පදවි ආරංචි මාර්ග සඳහන් කරයි.

අගරදගුරු පදවියේ කොළඹ කලාපයේ ප්‍රධාන රැළිය හා ප්‍රදර්ශනය අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ මූලිකත්වයෙන් කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරු පරිශ්‍රයේ දී පැවැත්වේ.

ධර්මදාන කලාපයේ රැළිය අති උතුම් මැක්ස්වල් සිල්වා සහයක රදගුරු හිමිපාණන්ගේ මූලිකත්වයෙන් වැලිවේරිය දෙව්මැඳුරු පරිශ්‍රයේ පැවැත්වෙන අතර සීදුව "සුපුවත් අරණ" පරිශ්‍රයේදී මීගමුව හා ජා-ඇල කලාපීය රැළිය හා ප්‍රදර්ශනය අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු සහයක රදගුරු හිමිපාණන්ගේ මූලිකත්වයෙන් සිදුකැරේ.



අද ලොව පුරා පූජක, පැවිදි ජීවිත ගත කරන උතුමන් වෙනුවෙන් එක්ව යදින දිනයයි. විශ්ව සභාව තුළ පූජකවරය පතා පැමිණෙන්නන්ගේ සංඛ්‍යාවේ ඉහළ යාමක් පෙන්වා ඇති බව විශ්ව සභාවේ සංඛ්‍යා ලේඛන සනාථ කරයි.

ඊයේ පෙරවරුවේ කොළඹ අගරදගුරු පදවියටත් නවක පූජක පුතුන් දොළොස් නමක් පත්වීම් ලද අතර අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මෙම පූජකවර දානය කොළඹ කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේදී සිදුවිය.

### කතෝලික ළමා නිවාසවල ප්‍රමිතිය ඇගයීමට ලක්වේ

# කකුළෙන් සාමාන්‍ය පෙළ ලියූ දුලාංජලී ඉහළින්ම සමත්

### "ඒ" 6 යි, "බී" 1 යි, "සී" 2 යි

**කළුතර කටුකුරුන්ද "මාක් ශ්‍රී" සරණ සේවා නිවහනෙහි කුඩා කල සිට හැදී වැඩුණු දුලාංජලී ආරියතිලක දැරිය මෙවර පැවැත්වූ අ.පො.ස. සා.පෙළ විභාගය ඉහළින්ම සමත් වී මුළු මහත් කතෝලික ළමා නිවාසවල ප්‍රමිතිය පිළිබඳව ද ඉහළින්ම අගැයීමක් ලබා දීමට පෙ-රමුණ ගෙන සිටින බව ගරු ජූලියන් තිසේරා පියතුමා පවසයි.**

එකී ළමා නිවාසයේ නිර්මාතෘ රීටා පෙරේරා මහත්මිය ද මේ ප්‍රතිඵල ගැන මහත් සොම්නසින් පසුවන්නීය.

මාක් ශ්‍රී සරණ සේවා ආයතනයේ සිටින සිය ගණනක් දරු දැරියන් අතර දුලාංජලි සුවිශේෂී දැරියකි. උපතින්ම දැත් අහිමි වූ ඇයට තිබුණේ යන්තමින් සවිය ඇති කුඩා පා යුවළක් පමණි. ඒ පා යුගළින් ඈ බොහෝ දේ කළාය.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට ඇය පිළිතුරු ලීවේ ද ඒ එක් කකුළකිනි.

15 පිටුවට »



# ජාතික පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන් බඳවා ගැනේ

දිවයිනේ ජාතික පාසල්වල පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් 2013 අප්‍රේල් මස 12 වන දින ගැසට් පත්‍රයෙහි අයදුම්පත් කැඳවා ඇත. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් භූගෝල විද්‍යාව, ඉතිහාසය, තර්ක ශාස්ත්‍රය, චිත්‍ර, නාට්‍ය හා රංග කලාව, ගෘහ ආර්ථික විද්‍යාව, තොරතුරු තාක්ෂණය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය හා කෘෂි විද්‍යාව යන විෂයන් සඳහා පුරප්පාඩු පවතින බව පළ කර ඇත.

2013. 05.03 දිනට විශ්ව විද්‍යාල කොමිසන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක වලංගු උපාධියක් ලබා තිබීම, අ.පො.ස. සා. පෙළ දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 3 ක් සහිතව මව්බස හා ගණිතය ද ඇතුළත්ව විෂයන් හයකින් එකවර සමත් වීම හා අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් එක් වරකදී විෂයන් 3 ක් සමත්වීම අවශ්‍ය සුදුසුකම් වේ.

2013. 05. 03 වන දින හෝ ඊට ප්‍රථම නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් විභාග දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර 2013 අප්‍රියෙල් මස 12 දින ගැසට් පත්‍රයෙන් ලබා ගත හැකි අතර අගරදගුරු පදවි කතෝලික අධ්‍යාපන කාර්යාලයෙන් ද විමසා දැනගත හැකි බව (බ.ප.) කතෝලික පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරි ගරු රංජිත් මදුරාවල පියතුමා ප්‍රදීපයට පැවසීය.

## 2013 - ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේ නව පත්වීම්

**සභාපති** - අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ, **උප සභාපති** - අති උතුම් රායප්පු ජෝශප් රදගුරුහිමි, **මහා ලේකම්** - අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරුහිමි,

**නිත්‍ය කමිටුව** - අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් - අති උතුම් රායප්පු ජෝශප් රදගුරුහිමි - අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරුහිමි - අති උතුම් වියානි ප්‍රනාන්දු රදගුරුහිමි - අති උතුම් හැරල්ඩ් ඇන්තනි රදගුරුහිමි,

**මූල්‍ය කමිටුව** - අති උතුම් ජේ. වින්ස්ටන් එස්. ප්‍රනාන්දු (දි.ස.නි.) රදගුරු හිමි (සභාපති) - අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා රදගුරු හිමි (උප සභාපති) - අති උතුම් පොන්නයියා ජෝශප් රදගුරුහිමි,

**අධ්‍යාපන, ධර්මෝපදේශ සහ බයිබල් දූත සේවා** - අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා රදගුරුහිමි (සභාපති) - අති උතුම් පොන්නයියා ජෝශප් රදගුරුහිමි (උප සභාපති),

**ධර්මදූත කටයුතු** - අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා (සා.බෙ.නි.) රදගුරු හිමි (සභාපති) - අති උතුම් පොන්නයියා ජෝශප් රදගුරුහිමි (උප සභාපති),

**ජනවන්දනාව සහ සංස්කෘතික කටයුතු** - අති උතුම් වියානි ප්‍රනාන්දු රදගුරු හිමි (සභාපති) - අති උතුම් පොන්නයියා ජෝශප් රදගුරු හිමි (උප සභාපති),

**දෙව්සත්හල්, පූජක, පැවිදි හා ලෞකික කටයුතු පිළිබඳ ආයතනය** - අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ (සභාපති) - අති උතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි. රදගුරු හිමි, අති උතුම් එෆ්. ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමි

**ජනසන්නිවේදනය** - අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ රදගුරුහිමි (සභාපති), අති උතුම් එෆ්. ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරුහිමි (උප සභාපති), **ගිහි කටයුතු** - අති උතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි. රදගුරු හිමි (සභාපති), අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා (සා.බෙ.නි.) රදගුරුහිමි (උප සභාපති), අති උතුම් එෆ්. ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරුහිමි (උප සභාපති)

**යුක්තිය, සාමය හා මානව සංවර්ධනය** - අති උතුම් වියානි ප්‍රනාන්දු රදගුරුහිමි (සභාපති) - අති උතුම් රායප්පු ජෝශප් රදගුරුහිමි (උප සභාපති),

**සභා එකමුතුව හා සංවාදය** - අති උතුම් එෆ්. ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරුහිමි (සභාපති), අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා (සා.බෙ.නි.) රදගුරුහිමි (උප සභාපති),

**සංක්‍රමණික, සෞඛ්‍ය, බන්ධනාගාර හා සංචාරක දූත සේවාව** - අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රදගුරුහිමි (සභාපති) - අති උතුම් එෆ්. ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමි (උප සභාපති),

15 පිටුවට »

## දේව කැඳවීම, විශ්වාසය මත පදනම් වූ බලාපොරොත්තුවේ සංකේතයකි

# ආගමික සහජීවනය සඳහා පූජ්‍ය පක්ෂයේ අවංක ආදර්ශය වෙනුවෙන් කැපවෙමු

## කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණෝ පවසති

**"සැදැහැවත් බෞද්ධ හා කතෝලික ජනතාව අතර ආගමික සහජීවනය සඳහා පූජ්‍ය පක්ෂයේ අවංක කැපවීම හා ආදර්ශය ඉතා වැදගත් වෙනවා. ඒ සඳහා කැපවීමෙන් කටයුතු කරන බව" කුරුණෑගල රදගුරු හිමිපාණන් නොබෝදා පොතුහැර චන්ද්‍රසේන මහා පිරිවෙනේ ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා බැහැදැකීමට ගොස් පැවති සුහද හමුවේ දී පැවසූහ.**

වැඩිදුරටත් අදහස් දක්වමින් රදගුරු හිමිපාණන් වහන්සේ ජනතාව අතර ආගමික සහජීවනය වෙනුවෙන් අපගේ ක්‍රියාකාරිත්වය ඉතා වැදගත් වෙනවා. අපගේ ධර්මයන් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම සහ ඒවාට ගරු කරමින් සහ ජීවනයෙන් යුතුව ක්‍රියා කිරීම නිසා අප ආගම් දෙක අතර කිසිදු මත භේදයක් ඇති වන්නේ නැහැ. එමෙන්ම අපගේ කාර්යභාරය වන්නේ සැදැහැවත් ජනතාවගේ ආධ්‍යාත්මය වර්ධනය කිරීම සඳහා වත් පිළිවෙත්, ඇදහිලි කෙරේ ඔවුන් යොමු කිරීමයි.

ඒ සඳහා සාකච්ඡා සම්මන්ත්‍රණ සහ මෙවන් හමුවීම් ඉතා වැදගත් වෙනවා. විශේෂයෙන් පොතුහැර චන්ද්‍රසේන පිරිවෙනේ ප්‍රවීනාචාර්ය පරිවෙනාධිපති අති පූජ්‍ය මාණික්කඩවල සුමන ස්වාමින් වහන්සේගේ ආගමික අධ්‍යාපන හා සමාජ මෙහෙවර අගය කරන බවත් සුහදශීලි හස්තය අප වෙත දිගු කිරීම යුග මෙහෙවරක අරුණෝදයක් බවත් පැවසීය.

චන්ද්‍රසේන පිරිවෙනේ පරිවේනාධිපති හිමියන් අනුශාසනාවක් කරමින් ආගමික නායකයකු ලෙස කුරුණෑගල රදගුරු හිමිපාණන්ගේ පැමිණීම ඉතා අගය කරන අතර ආගමික සහජීවනය වෙනුවෙන් එතුමාගේ කැපවීම හා සුහදත්වය අගය කරන බවද පැවසීය.
**(බී. කේ. ටී. රෙජිනෝල්ඩ්)**





මත්තුමගල වින්සන්ද පාවුලා සමිතියේ සාමාජිකාවන් මෙවරත් චතාරිකය වෙනුවෙන් හැඳල ලාදුරු රෝහලට වියළි ආහාර බෙදා දෙන ලදි. මීසම් සේවක පියතුමා වන ගරු ඇන්සලම් ශිරාන් පියතුමා ද මේ සඳහා සහභාගි විය.
**(සේයා - ටයිටස්)**

## පේර්ලන්ද කිතුනු පවුල් ව්‍යාපාරයේ නියමුවෝ

පේරලන්ද ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරයේ සංවත්සර රැස්වීම සහ වාර්ෂික සුහද හමුව පසුගියදා පේරලන්ද මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි. පියතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

එහිදී තේරී පත් වූ 2013 / 2014 නව නිලධාරි මණ්ඩලය මෙසේය.

අනුශාසක - මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි. පියතුමා, සභාපති - නිශාන්ත - දිනුෂා ඇන්තනි යුවල, ලේකම් - ඩඩ්ලි - සුජීවා සිල්වා යුවල, භාණ්ඩාගාරික - නෙල්සන් සහ බර්නි සිල්වා යුවල, නිරීක්ෂක - ඩික්සන් - අයිරාංගනී ඇන්ටනි යුවල. **(සී. ආර්. ඩික්සන් ඇන්ටනි)**

## ජෙනෝවා නගරයේ පාස්කුව අර්ථවත්

ඉතාලියේ ජෙනෝවා නගරයේ සා. ඩීනා දෙව්මැඳුරෙහි උඩුමහල් ශාලාවක මහ බ්‍රහස්පතින්දා දින පළමු වරට අපෝස්තුළුවරුන්ගේ පාද දෝවනය හා දිව්‍ය පූජා මෙහෙය ගරු ජෝර්ජ් දිසානායක පියතුමා හා උපාධ්‍ය ගරු ප්‍රැන්සිස් සේරම් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

2013 වසර, ශුද්ධවු සතිය තුළ දී, ගොබ් ඉරුදින ද මහා බ්‍රහස්පතින්දා හා ජේසුස් වහන්සේ උත්ථාන වූ මහා මංගල දින ද අර්ථවත් අන්දමින් හා උත්සවශ්‍රීයෙන් යුක්තව, මෙම මෙහෙයන් ගරු පියතුමන් විසින් සංවිධානය කළ අතර, මෙවර පාස්කු උලෙළ ජෙනෝවා ශ්‍රී ලාංකික කිතුනු සංඝය තුළ සැබෑ ක්‍රිස්තු ශ්‍රාවකත්වයක් එළිදක්වනු ලබමින් ජනවන්දනාව පිළිබඳව සැබෑ අරුතක් ලබාදෙමින් පවත්වන ලදි.
**(සිල්වෙස්ටර් කැනීසියස් ප්‍රනාන්දු - ජෙනෝවා)**

## සාන්ත වින්සන්ද පාවුලු ජාතික සභාවේ මංගල රැස්වීම



ජාතික නිලවරණයෙන් පසු සාන්ත වින්සන් ද පාවුලු ජාතික සභාවේ නව නිලධාරින් හා ජාතික උපාධ්‍ය ගරු ලියෝ පෙරේරා පියතුමාගේ සහභාගිත්වයෙන් මංගල රැස්වීම සයවන පාවුළු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

ඡායාරූපයේ වමේ සිට ජාතික ලේකම් රොෂාන් ගුණරත්න, ජාතික සභාපති ලියෝන් ප්‍රනාන්දු, ජාතික භාණ්ඩාගාරික ඒ. ඒ. ජී. රාජේන්ද්‍රම් යන මහත්ම මහත්මීන් හා ජාතික උපාධ්‍ය ගරු ලියෝ පෙරේරා පියතුමා ද වෙති. **(තියබෝල්ඩ් සමරතුංග)**

## සලාපුර විසෙන්ති පාවුලා වාර්ෂික ධර්ම විවේකය

"අද තිබෙන ලොකුම පාපය ඇති නැති පරතරය තේරුම් නොගැනීමයි. පිරිසක් අධික ලෙස සැප විඳිද්දී තව පිරිසක් ඉතා අසරණ ජීවිත ගත කරනවා. ඇතැම් පිරිස් මුදල් වැඩිකම නිසාත් දුක් විඳිනවා. සමහර අයට මුදල් වැඩිවන විට දෙවිඳුන් අමතක වෙනවා. සෑම අයෙක්ම දිළින්දෙක් කියල කියනවා. අපි අන් අයට උදව් කළත් අපිත් දිළිඳුයි කියා තේරුම් ගැනීමයි තිබෙන ලොකුම දේ."

සලාපුර රදගුරු අති උතුම් වැලන්ස් මෙන්දිස් හිමිපාණන් එලෙස පැවසුවේ පසුගියදා කෝට්ටපිටිය ශු. අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ පැවැති හලාවත පදවි සා. වින්සන්ද පාවුලා කොන්ෆරන්ස සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් පැවති තුන්දින වාර්ෂික ධර්ම විවේකයේ ප්‍රධාන දේශනය කරමිනි.

මෙම ධර්ම විවේකය ගරු ලසන්ත ආබෲ ජේ. නි. පියතුමා විසින් පවත්වන ලද අතර සියයකට ආසන්න සාමාජික සාමාජිකාවන් පිරිසක් එයට සහභාගි වූහ. සලාපුර පදවි විසෙන්ති පාවුලා සමිති අධ්‍යක්ෂ ගරු කුවින්ටස් ප්‍රනාන්දු පියතුමා ද කෝට්ටපිටිය මීසම් සේවක ගරු ක්‍රිස්ටි පෙරේරා පියතුමා ද මෙය සාර්ථක කර ගැනීමට කටයුතු කළහ.

**(කේ. නිහාල් ප්‍රනාන්දු)**

## තුඩැල්ල දිසා මරිය හමුදා කැපවීමේ උත්සවය



තුඩැල්ල දිසාවේ මරිය හමුදා සාමාජිකයන්ගේ හා සහකාර භටයින්ගේ වාර්ෂික කැපවීමේ (ආචියස්) උත්සවය තුඩැල්ල දිසා මරිය හමුදා අධ්‍යක්ෂ ගරු තරංග සම්පත් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් මාකෙවිට දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ දෙව්මැඳුරේදී පැවැත්වූහ.

පාලක සභා නිලධාරි මණ්ඩලය මෙය සංවිධානය කළ අතර මරිය හමුදා ධජය මත අත තබා මරිය භටයින් මෙසේ කැපවූහ.
**(බෙන්ජමින් කිරිහෙට්ටි)**

## මඩු කඳවුරට උස්වැටකෙයියාවෙන් පානීය ජල ටැංකි





මරදු මඩු සිද්ධස්ථානය වෙත පැමිණෙන වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස ලීටර් 2000 වතුර ටැංකි හතක් මෙවර මාර්තු 15 මඩු මංගල්‍යය නිමිත්තෙන් උස්වැටකෙයියාව මීසම් වාසී සැදැහැවතුන්ගේ අනුග්‍රහයෙන් පරිත්‍යාග කරන ලදි.

රුපියල් එක් ලක්ෂ අසූ දහසක් පමණ වටිනා එම වතුර ටැංකි මඩු කඳවුර වෙත භාර දුන් නියෝජිත පිරිස සිද්ධස්ථාන පාලක ගරු එමලියානුස් පිල්ලේ පියතුමන් හා කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන් සමඟ සේයාරුවකට පෙනී සිටි අයුරු... **(පස්කල් ජයමාන්න - උස්වැටකෙයියාව)**

## ජපමාලයට මුල් තැන දීමක්



තල්විල සා. තෙරේසා දේවස්ථානයේ හිටපු මීසම් සේවක ගරු නෙවිල් සෙබස්තියන් පියතුමා 2013 වසර සියලුම කරදර ආපදා වලින් ගම, නගරය, රට, ලොවම බේරා දෙන්නැයි සිතා එලෙස ඉල්ලමින් ජපමාලයට මුල් තැන දෙමින් මීසම් වාසීන් සමඟ ජපමාලය උච්චාරණය කරයි.

දේවස්ථානයට ඇතුළුවන ප්‍රධාන දොරටුව අසළ අඩි 40 ක් පමණ උස සහ අඩි 20 ක් පමණ පළල ජපමාලයක් තනා ඇත. එය සාදා ඇත්තේ ප්ලාස්ටික් බෝල වලිනි. කොන්ත පන්ති වෙන් කරන ස්ථානයේ ඇති බෝලය පාපන්දු බෝලයකට තරමටත් අනික්වා කුඩාවටත් දිස්වේ.
**(ඩබ්. ඒ. ඩී. ඩේවිඩ් අප්පුහාමි)**



තලවිල සා. ආනා ජාතික සිද්ධස්ථානය වෙත වන්දනාවේ පැමිණෙන බැතිමතුන් හට එහි අර්ථය නියමාකාරව පහදා දෙනු සඳහා හලාවත පදවි ධර්මදූත ළමා සමාජයේ සජීවක සජීවිකාවන් විසින් එම තේමාව ඔස්සේ වීදි නාට්‍යයක් රඟ දක්වන ලදි. තෙදිනක් පුරා තලවිල පුදබිමේ පැවති මෙම නාට්‍ය මාලාව පදවි ධර්මදූත අධ්‍යක්ෂ ගරු නිශාන්ත ජානක පියතුමාගේ මඟ පෙන්වීම යටතේ සංවිධානය කරන ලදි. **(කොකුම් ජයරුවන්)**

## දැලතුර වැඩිහිටි සංගමය




දැලතුර වැඩිහිටි සංගමයේ වාර්ෂික සමුළුව පසුගියදා දැලතුර ප්‍රජා ශාලාවේදී පළාත් සභා මන්ත්‍රී සිරිකමල් මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

ග්‍රාම සේවා කොටස් දෙකටම මූලික අරමුදලක් පිහිටුවීම වෙනුවෙන් සංවිධානය කළ ලොතරැයි දිනුම් ඇදීම ද එදින පළාත් සභා මන්ත්‍රී තුමන්ගේ සහභාගිත්වයෙන් සිදු කළ අතර එම ලොතරැයි දිනුම් ඇදීමේ පළමු ත්‍යාගය හිමිකරගත් ගොන්සාල්වෙස් විදුහලේ පියුමි පෙරේරා මෙනෙවියට ප්‍රථම ස්ථානයට හිමි ත්‍යාගය පිරිනැමූ අවස්ථාව සේයාරුවෙන් දැක්වේ.
**(ඩබ්. ටී. සී. පෙරේරා)**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2013 අප්‍රේල් 21 ඉරිදා

# දේව කැඳවීම් දිනය

අද ලෝක දේව කැඳවීම් දිනයයි. මුළු මහත් විශ්ව සභාව එකම පවුලක් සේ එකට බැඳෙමින් අතීතය ආවර්ජනය කරමින් , වර්තමානය විශ්වාස කරමින් අනාගතය බලාපොරොත්තුවෙන් දල්වාලන්නට මේ දේව කැඳවීම් දිනය යාච්ඤා බරිතව පසු කරන කාල හෝරාවක් බවට නිරතුරුවම පත් කොට ඇත. මේ උතුම් දිනය නිමිති කොට 2012 ඔක්තෝම්බර් 6 වැනි දින විශ්‍රාමික සසුන් පියාණන් විසින් නිකුත් කළ පණිවිඩය ගෙවුනු සතියේ 'ඥානාර්ථ ප්‍රදීපය' සම්පූර්ණයෙන්ම පළ කරනු ලැබුවේ ''දේව කැඳවීම විශ්වාසය මත පදනම් වූ බලාපොරොත්තුවේ සංකේතයකි'' යන්න එහි මූලික තේමාව අද දිනයේදී භාවනාත්මකව මෙනෙහි කරන්නට විශ්වාසයේ සියලු ජනතාවට ඉඩ ප්‍රස්ථා ඇති කෙරුමටමයි. එනයින් ගෙන කල්පනා කරද්දි මේ සිතිවිලි ද පහළ වේ.

දේව සේවයත් සසුන් මෙහෙවරත් උදෙසා කැපවූ දිවිය පිළිබඳව යැදීම සඳහා පාස්කුවත් සුදත් වැඩුමත් අතර පැවැත්වෙන මෙම දිනය නිමිත්තෙන් වැඩිහිටියන් වෙතත් පැවිදි හා පූජක පිරිස් වෙතිත් කැරෙන ඇරයුම එක් දිනක දෙව් යැදුමකට පමණක් සීමා වන්නක් නොවන බවයි. පැතුමේ මෙන්ම පැවැත්මේ දැහැන ගැනද මේ පණිවුඩය කිතුනු ලොවේ සැලකිල්ල වෙත යොමු කරන්නේ දේව කැඳවීම් මං ගැන්වීම සම්බන්ධයෙන් පවුල නැමැති තෝතැන්න තුළ පැවතිය යුතු වූ පුබුදු ආකල්පයේ වැදගත්කම මතු කරන්නට බවයි.

මෙහිදි ''දේව ජනතාවගේ ජීවිතයට හා ශුද්ධත්වයට අත්‍යවශ්‍යව තිබෙන පූජකවරයට හා කැපවුනු දිවියට කැඳවනු ලැබීම් නිරතුරුවම ආධ්‍යාත්මිකත්වයටත්, දූතික ක්‍රියාවන්ටත්, සැදැහැවතුන්ගේ යාච්ඤාවලටත් කේන්ද්‍රීව කරගන්නට අවැසි සියළු දෑ කිරීම අවශ්‍යව ඇත'' යන්න සසුන් පියා මතක් කරවන කරුණ කිසිවිටෙක හෑල්ලු කොට තැකිය හැකි නොවේ. ශුද්ධත්වයට ප්‍රමුඛත්වය දෙන්නැයි කරන ආයාචනා වල නිමක් නොමැත්තේ මන්ද යන්නත් ඒ හා සමගම විමසීමක් කරන ලෙසටද සසුන් පියා විමසීමක් කරයි. නව ධර්මදූනයේ මූලික සුදුසුකම මේ හා සමග දැඩිව රැඳී පවතී.

සභාවේ සෑම කැඳවීමක්ම ශුද්ධත්වයට මඟ සලසතත් පූජකවරයට හා කැපවුණු දිවියට කැඳවීම් වැනි ඇතැම් ඒවා ශුද්ධත්වයට මඟ සලසා දෙන්නේ මුළුමනින්ම විශේෂිත ඇරයුමකිනි. ඒ කැඳවීම් සඳහා වැඩි වැඩියෙන් යාච්ඤා කරමින් ඒවාට විශේෂ අවධානය යොමු කෙරුමට අදවැනි දිනක් සුවිශේෂි වන්නේ එම නිසාමයි.

නමුත් සංකීර්ණ වෙමින් පවතින සමාජ රටාවලිය තුළ අද කථා කරන වටිනාකම් අනුව යන තැනැත්තේ හුදු උපහාසාත්මක හාස්‍යයකට යොමු කොට ඇති බවක් පෙනී යනු ලබයි. විශ්වාසයට සාක්ෂ්‍ය දැරීම කෙසේ වෙතත් තමන්ගේ ලබ්ධියේ අනන්‍යතාව පිළිබඳ ඉඟියක් හෝ දක්වාලන්නට ඉදිරියට එන තැනැත්තන් , තැනැත්තියන්ගේ හිඟ කමක්ද වැඩි වෙමින් පවතී. පාසල් පරිසරයන් තුළ එකී වටිනාකම් පිලිබඳ විශාල හිඩැසක් ඇත. ආගමික දෘෂ්ටිය තුළ ගමනක් ගිය තැනැත්තා තැනැත්ති තම පහසුව තුළ එකී දහම් පණිවිඩය තමන්ට පමණක් රිසි හිතකර රාමුවක තද කොට හිර කර ගන්නේ තමන් අනුගාමී වන පසු පරම්පරාව ඒ දෘෂ්ටිය තුළ පමණක්ම වෙලී දහම් පණිවිඩය ලබාගත යුතු බවට තර්ජනයක්ද කරමිනි. කැඳවීම් තෝරා බේරා ගන්නට නිනව්වක් නොමැති වුවන් හා ඒ පිළිබඳ වෛරී සිතක් රෝපනය කර ගන්නවුන් ඉගැන්වීමේ කාර්යයක යෙදෙන්නෙ නම් තත්ත්වය තවත් දරුණු වනවා පමණක් නොව උගැනුම ලබන්නන්ද ඒ හා සමඟම අන්ද මන්ද වීමත් වළකාලිය හැකි නොවේ.

එම නිසා "දේව කැඳවීම විශ්වාසය මත පදනම් වූ බලාපොරොත්තුවේ සංකේතයකි" යන්න උධෘත පාඨය වශයෙන් ගෙන සසුන් පියා විවරණය කරන ගැඹුරු අර්ථය සොයා යන්නට මූලික වශයෙන්ම අද කැඳවීමක් ලත් තැනැත්තන් උත්සුක විය යුතු බව පොදු මතය වී ඇත. මන්ද විශ්වාසයේ එකමුතු දිශානතිය එක් දිසාවක් එල්ල කොට ගෙන පමණක් යා යුතු බව සමස්ත සභාවම පුන පුනා අවධාරණය කරන බව පැහැදිලිව පසක් වන බැවිනි.

එම නිසා හුදෙක් කැඳවීම් පතා කරන යාච්ඤාවේ දිනයක් පමණක් නොව ඊට ඔබ්බෙන් ඇති පවුරු වළලු දෙසත් බලා නිර්නය කරවීමක් තුළ විශ්වාසය වර්ධනයේ කිතුනු සංඝයක් බිහි කර ගැනීමත් අද යුගයේ අවශ්‍යතාව වී ඇත. එයත් මූලික දේව කැඳවීමක් සේ සලකා මේ දිනය සමරන්නට අත් වැල් බැඳ ගනිත් නම් පටු විවේචන, වපර ඇස් වලින් එහා ගොස් දේව රාජ්‍යයේ වටිනාකම් මතුකර ගැනීමේ සාංඝික කැඳවීමක් කරාද සැමට ගමන් කිරීමට යෝධ බලයක් ඒ විශ්වාසයෙන්ම උරුම වන බව ඒකාන්තයි.

# අපේ ඉරණම් නිමේෂය

සෑම පරම්පරාවක්ම සුවිශේෂ වූ අභියෝග වලට මුහුණ දෙතැයි මම විශ්වාස කරමි. එහෙත් ඒවා අතරින් වඩාත් බරපතළ සහ වඩාත් නිශ්චිත වන්නේ සදාචාරය සහ ධෛර්යයට අදාළ අභියෝග යි. ඒ නිමේෂය යම් හෙයකින් අතහැරුණොත් එම පරම්පරාව සහ සමහර විට තවත් පරම්පරා ගණනාවක් අප සිතනවාට වඩා නපුරු සහ අප්‍රසන්න ලෝකයකට නියම කෙරේ. 1930 දශකයේ අවසාන භාගයේ නිදහස් ලෝකයේ බොහොමයක් දෙනාට, පෝලන්තය ආක්‍රමණය කළ මොහොත සහ පර්ල් වරායට බෝම්බ හෙළු මොහොත, එවැනි අවස්ථා විය. එය මගේ සීයාගේ පරම්පරාවට පැත්තකට වී බලා සිටින්නේ ද නැතහොත් වෙනත් කෙනෙකුගේ හේතුවක් වෙනුවෙන් ගොස් සටන් වදින්නේ ද යන්න තීරණය කළ යුතු මොහොතක් විය.

ඔවුන්ගේ වාසනාවට, එම තේරීම අපහසු එකක් නොවුණි. මන්දයත් ඔවුන්ගේ ආණ්ඩු ඔවුන් වෙනුවෙන් ඒ තීරණය ගෙන තිබුණු බැවිනි. මගේ සීයා ද ඇතුළු දස ලක්ෂ ගණන් පිරිමි, ඔවුන්ගේ ලෝකය ජාතිවාදයෙන් සහ අත්තනෝමතිකත්වයෙන් ගලවා ගනු වස් සාගර තරණය කොට කාන්තාර වලට සහ කැලෑවට ගියෝය. 1960 දශකයේ ඇමරිකාවට ඒ නිමේෂය ඇඳී තිබුණේ ස්ථානයකට අදාළවයි. ඒ වියට්නාමය විය. එමෙන්ම එය සදාචාරමය තේරීමක් විය. ඇමෙරිකාව ඒ තීරණය ගත්තේ ය. එහෙත් ඒ දස ලක්ෂ ගණනක් වියට්නාම් ජාතිකයන් සම්බන්ධයෙන් ගත් කල තරමක් ප්‍රමාද වූවක් විය.

එහෙත් ශ්‍රී ලංකාවට මීට වසර තිහකට පෙර ඒ ඉරණම් හෝරාව එන විට අපේ මාපියන්ගේ පරම්පරාව අප අතරමං කළේය. දශක ගණනාවක් තිස්සේ දෙමළ ජනයාට එරෙහිව දියත් වෙමින් තිබූ අන්තවාදී වාග්ලාප එම ජනයාට එරෙහි කායික හිංසාවක් බවට අවසානයේ පරිවර්තනය වෙද්දී අපේ මාපියෝ ඒ දෙස බලා උන්හ. නීතිය යටතේ සුළු ජාතිකයන්ට හිමිව තිබූ ආරක්ෂණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කරන විට ඔවුහු කිසිවක් නොකීහ. තමන් අවට පැතිරෙමින් තිබූ



ජාතිවාදය සහ වෛරය ඉදිරියේ ඔවුහු මුනිවත රැක්කෝය. පහරදීම්, ඝාතනය කිරීම්, දූෂණය කිරීම් සහ හිංසන "කළු ජූලිය" නමින් අද දන්නා විනාශයේ පරිපාකයට පැමිණෙන විට ඊට එරෙහිව ඔවුහු කිසිවක් නොකළෝය.

අපේ මව්පියන් එතරම් හීලෑ වුණේ දුර දක්නා නුවණින් එතරම් දුප්පත් වුණේ සහ තමා ඉදිරියේ ඇති

## ඩේවිඩ් බ්ලැකර් විසිනි

තේරීම් සම්බන්ධයෙන් ඔවුන්ට එතරම් වැරදුණේ ඇයිද යන්න, වසර තිහක් තිස්සේ අපේ සිත් පෙළූ ප්‍රශ්නයකි. අපේ රට, මිනිස් බෝම්බ සහ ළමා සොල්දාදුවන්ගෙන්, යුද ටැංකි සහ කාලතුවක්කුවලින් ද දෙකඩ වෙනු අපි බලා සිටියෙමු.

අවුරුදු තිහකට පසු ඔරලෝසුවේ වේලාව නැවත දොළහට මිනිත්තු පහට පැමිණ ඇත. සිංහල බෞද්ධයන් සඳහා පමණක් මේ රට අයිති කර ගැනීමට ජාතිවාදියෝ හිංසනය කැඳවති. ඉතා කුඩා සුළුතරයකට තමන්ගේ ජීවන ක්‍රමය වෙනස් කරගන්නැයි ඔවුහු බල කරති. නොඑසේ නම් මේ රටින් පිටව යන්නැයි තර්ජනය කරති. වන්දනාමාන සඳහා ඔවුන්ට ඇති අයිතිය සීමා කිරීමට වලිකති. මේ ඉල්ලීම් වලට අනුගත නොවුණහොත් හිංසනය මුදාහරින බවට බිය ගන්වති. අපේ ආණ්ඩුව වඩාත් හොඳින් කියන්නේ නම් නිහඬය. වඩාත් නරකට ගත්තොත් ඊට හවුල් ය. මුස්ලිම් භක්තිකයන්ට පහර දෙන විට පොලීසිය බලාගෙන සිටී. අත්අඩංගුවට ගැනීම් කිසිවක් නැත. හෙළාදැකීම් නැත. යුක්තියක් කියා දෙයක් නැත.

අවසාන වරට මෙය සිද්ධ වන විට මගේ වයස අවුරුදු එකොළහකි. දේවල් හරියට තේරුම් ගත නොහැකි දරුවෙකි. ඒ ජූලි මාසයේ ගිනි ජාලාවක් මැද්දෙන් මා මෝටර් සයිකලයේ හිඳුවාගෙන අන්තරායකින් තොරව මාව ගෙදර එක්කගෙන ගිය මගේ පියා, දෙමළ මිනිසුන්ට සහ මගේ රටට කෙරෙමින් තිබූ ඒ අපරාධය නතර කිරීමට අසමත් වුණේ මන්දැයි මම මගෙන්ම ප්‍රශ්න කරගෙන ඇති වාර අනන්තය. ඔහු බිය වුණිද? නැත්නම් තමාට අදාළ නැති දෙයක් වශයෙන් එය ගණන් නොගෙන සිටියේ ද? අද පවා ඒ ප්‍රශ්න මම මගෙන්ම විමසමි. ඒ ගිනිදැල් වෙතට නැවත දිවෙන මගේ රට නතර කිරීමට මා කිසිවක් නොකරන්නේ ඇයි? එම ප්‍රශ්නය මාගේ මිතුරන්ගෙන් විශේෂයෙන් බෞද්ධ මිතුරන්ගෙන් මගේ සගයන්ගෙන් සහ මගේ පෙම්වතියගෙන් මම විමසමි.

ඔබ කිසිවෙක් ජාතිවාදී නොවේ යයි මම සිතමි. මුස්ලිම් ජාතිකයන් වධ හිංසාවට පත් කළ යුතු යැයි ඔබ කිසිවෙක් විශ්වාස නොකරතියි මම සිතමි. එහෙනම් ඊට එරෙහිව ඔබ ක්‍රියා නොකරන්නේ ඇයි? ඊට එරෙහිව ඔබ විරෝධය නොපාන්නේ ඇයි? අපේ ගෙවල්වලින් අප වීදි බස්සවා ඒ මැරයන්ට මුහුණ දීමට කඳුළු ගෑස්වලට, වතුර බෝම්බ වලට සහ මුනිස්සම් වලට මුහුණ දීමට තරම් අප තල්ලු කරන කිසිවක්ම ඇත්තේ නැද්ද? අපට ලැජ්ජාව කියා දෙයක් නැද්ද?

යුද්ධයේ රුදුරුම මොහොතේ දී එය මගේ වරදක් නිසා සිදුවන්නේ නොවේ යැයි කියා මම හිත හදා ගත්තෙමි. ඒ යුද්ධය මගේ තේරීමක් නොවේ යැයි මම මටම කියාගතිමි. එහෙත් දැන් ඇත්තේ මේ මොහොතයි. මේ සිටින්නේ දැන් මමය. මේ සිටින්නේ දැන් අපය. මේ අපේ රටයි. අපේ ඉරණම් නිමේෂය මෙයයි. ඇයි අප කිසිවක් නොකර ඉන්නේ?

**2013 අප්‍රේල් 02 වැනිදා "කලම්බු ටෙලිග්‍රාෆ්" වෙබ් අඩවියේ පළවූ ලිපියක් ඇසුරින් උපුටා ගැනීමකි.**

කැමිලස්ගේ — තිත්ත ඇත්ත



මීසමෙන් මීසමට

# කිතුනුකම අපේ කතාවෙන් සහ ක්‍රියාවෙන් පිළිබිඹු විය යුතුයි

## කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ අවධාරණය කරති



"කතෝලික දහම ජනතා හදවත් තුළ ජීවත් කරවීමට විවිධ ක්‍රම සහ විධි අප අතර තිබෙනවා. ඒ අතුරින් නාට්‍යයට සුවිශේෂී තැනක් හිමිවෙනවා. පාස්කු සමයට විවිධ පාස්කු නාට්‍යයන් එළිදැක්වෙනවා. මේ හැම දෙයක් තුළින්ම අපේක්ෂා කරන්නේ අප ජීවිත දෙවිඳුන්ට වඩ වඩාත් සමීප කරවීමයි. එසේ නොමැතිව නාට්‍යයක චරිත වලට පමණක් පණ දී අපට නතරව ඉන්න බෑ. ක්‍රිස්තියානිය අපේ කතාවෙන් සහ ක්‍රියාවෙන් පිළිබිඹු විය යුතුයි. අප ජීවිත නිරන්තරයෙන් පරිවර්තනයකට බඳුන් විය යුතුයි. ඇතුළාන්ත වෙනස් වීමක් සමඟ ඇතිවන ජීවිත පරිවර්තනය උදා කරගැනීමට හැකිවන්නේ නම් පාස්කු නාට්‍ය රඟ දැක්වීම තුළින් දෙවිඳුන්ට ප්‍රසන්න ජීවිත ගත කරගැනීමට නියත වශයෙන්ම ඉඩ ලැබෙන්නේ යැ"යි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවසූහ.

කටාන - හල්පේ ආඬිමුල්ල මීසම් පවුල මීසම් වාසී 200 දෙනකුගේ සහභාගිත්වය ඇතිව පස්වන වරටත් එළිදක්වනු ලැබූ "අහෝ මාගේ සෙනඟෙනී" පාස්කු දැක්මේ මුල් දිනයේ එහි ප්‍රධාන ආරාධිතයා වශයෙන් පැමිණි කාදිනල් හිමිපාණෝ එහි පැවති උත්සව සභාවේදී උක්ත ප්‍රකාශය කළහ. කටාන දිසානායක සහ හල්පෙ මීසම් සේවක ගරු අමිල් ගෝමිස් සහ මීසම් සහයක ගරු සුරංග ෆොන්සේකා පියවරු මෙහි අනුශාසකත්වය දරති. සමාරම්භක දිනය සනිටුහන් කරමින් කාදිනල් හිමිපාණෝ පහන් දල්වා පාස්කු දැක්ම ආරම්භ කළ අයුරු සහ එහි විශේෂ අවස්ථාවක් මෙහි දැක්වේ. **(සිසිල් ඩැනීසියස්)**

## ගොඩැල්ල මීසම් පවුලේ මඩු වන්දනා ගමනක්

ගොඩැල්ල මීසම් පවුලට අයත් තඹරවිල නිර්දෝෂ දේමාතා දෙව්මැඳුර, ගොඩැල්ල සා. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුර, මොරැක්කුලිය උත්ථාන වූ සමිඳුන්ගේ දෙව්මැඳුර හා දංකොටුව ජේසු සමිඳුන්ගේ දෙව්මැඳුරු යන දේවස්ථාන සතරට අයත් ගොඩැල්ල මීසම් පවුලේ එකමුතුවෙන් ප්‍රථම වරට මැයි මස 31 දින මැයි මංගල්‍යයත්, ජුනි 01 දින මඩු ජපමාල දෙව්මව් වෙනුවෙන් සන්ධ්‍යා මෙහෙයත් පසුදින ජුනි 02 ඉරිදා මංගල්‍යයත් ඉතාමත් උත්සවාකාරයෙන් මඩු සිද්ධස්ථානයේ දී පැවැත්වීමට මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් මංගල්‍යය කමිටුවක් පත් කරගෙන ඇති අතර මෙම මංගල්‍යය සඳහා සැදැහැවත් සැමගේ සහභාගිත්වය ද අපේක්ෂා කැරේ.

**(ඩබ්ලිව්. හෙක්ටර් ප්‍රනාන්දු)**

## රදගුරු හිමි මීසම් බැහැදකී

කුරුණෑගල පදවියේ රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ පසුගියදා කුරුණෑගල පැල්ලන්දෙනිය මීසම බැහැදකින ලදි.

රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් එදින දිව්‍ය යාගය පුද කළ අතර මීසමේ සියලු අපෝස්තලික සේවා සහ දේවස්ථානය අසළ පිහිටි කිතුනු ඒකකයන් ද බැහැදුටහ. සියලු කටයුතු මීසම් සේවක ගරු චන්දන හපුආරච්චි පියතුමා මෙහෙයවීය.

**(ගීතානි රණසිංහ)**



දැලතුර මීසම් සභාව විසින් සංවිධානය කළ මෙවර මහා සිකුරාදා සවස මෙහෙය "ශ්‍රී වාක්‍ය හත" දේශනා කර කුරුස ප්‍රතිමාව උකුත් වීම දැලතුර ක්‍රීඩාපිටියේ වේදිකාවක් මත සිදුකරන ලදි. මීසම් සේවක නොයෙල් සම්පත් පියතුමාගේ ආරාධනයෙන් නුවර අම්පිටිය දෙව්සත්හලේ ගරු ට්‍රෙෂාන් ප්‍රියදර්ශන සහෝදරතුමා තුන් පැය ධ්‍යානය මෙහෙය වන ලදි.

**(ඩබ්. ටී. සී. පෙරේරා)**

## ජන සිත් අවදි කළ ගොල්ගොතාවේ යාගය



මෙවර මහ සිකුරාදා දින බඩල්ගම මීසමේ වරාදල, මැල්ලවගෙදර, මේස්ලන්ඩ්, කෙහෙල් ඇල්ල, ගොඩිගමුව, බඩල්ගම යන සභා හයම එකට එකතු වී "ගොල්ගොතාවේ යාගය" නමින් මහා පාස්කු නාට්‍යයක් රඟදක්වන ලදි. ප්‍රවීන නාට්‍ය ශිල්පී නෙල්සන් කන්නන්ගර මහතා මෙම නාට්‍යය අධ්‍යක්ෂණය කරන ලද අතර ක්‍රිස්තු චරිතය නිරූපනය කරන ලද්දේ ජනප්‍රිය නළු රාජසිංහ ලෝලුවාගොඩ මහතාය. මෙහි සියළු කටයුතු බඩල්ගම මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් පියතුමාගේ මඟ පෙන්වීම යටතේ සිදුවිය.

**(මරිස් මදුරාවල)**

# දේව දයාවේ නොවාන බැතිය



"ඔබ සියළු දෙනාම ජේසුස් වහන්සේගේ දයාව, කරුණාව අයදින අද දින, මා ඔබට මතක් කර සිටින්නේ ශුද්ධගිනිස්ථානයේ සිටින කිසිවකුගේ පිළිසරණක් නොමැති ආත්මයන් සිහිකරන්න. එම ආත්මයන් උදෙසා යාච්ඤා කරන්න. ඔවුන්ට පිහිට වන්න, සැම ආත්මයක් සඳහාම, විශේෂයෙන් අසරණ පවුකාරයන් උදෙසා යාච්ඤා කරන්න. එවිට ඔබට, ඔබගේ පවුලේ සැමටම ජේසුස් වහන්සේගේ දයාව, කරුණාව බහුලව ලැබෙනු ඇත."

වෙන්නප්පුව ජෝශප් වාස් විදුහලේ ප්‍රාථමික අංශයේ විදුහල්පති ගරු බෙනට් ශාන්ත ප්‍රනාන්දු පියතුමා එසේ පැවසුවේ ගොඩැල්ල සා. සෙබස්තියන් දෙව්මැඳුර් පැවති දේව දයාවේ මංගල්‍ය දිව්‍ය පූජාව අවස්ථාවේදීය.

මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා විසින් දේව දයාවේ නොවාන බැතිය 2013 ජනවාරි 04 සිකුරාදා සවස 2.45 ට ආරම්භ කළ අතර එතැන් සිට සතියේ සෑම සිකුරාදා දිනකම මෙම නොවානය පවත්වන ලදි. දේව දයාවේ බැතිය ආරම්භයේ සිටම ජනතා සහභාගිත්වය වර්ධනය වූ අතර එදින මංගල දිව්‍ය යාගයෙන් පසුව ජේසු සමිඳුන්ගේ ප්‍රතිමාව රැගෙන ආසිරි ගැන්වීම ගරු බෙනට් පියතුමන් විසින් සිදු කරන ලදි.

**(එච්. ඒ. සිරිල් පෙරේරා)**



පසුගිය ගොඩ් ඉරුදින දූව, පිටිපන වීදිය කිතුනු සංඝයේ සැදැහැවත් ජනතාව අනෝරා වැස්සේ තෙමි තෙමී ගම් හරහා මහා පාද නමස්කාරයක් පැවැත්වූහ.

අළු බදාදා සිට ගොඩ් ඉරුදින දක්වා චතාරික සමය මුළුල්ලේ සෑම නිවසකම මිදුලේ කුරුසියක් සිටුවා තිබිණි. ගොඩ් ඉරුදින සෑම පවුලක්ම තම කුරුසිය රැගෙන මෙම පාද නමස්කාරයට සහභාගි වූ දර්ශනය ආදර්ශමත් කිතුනු වටිනාකමක් ඇති ක්‍රියාවකි. දූව මීසම් සේවක ගරු ෂෙල්ටන් ඩයස් පියතුමාගේ සංකල්පනාවක ප්‍රතිඵලයක් ලෙස දහස් ගණනක් කුරුස ඔසවා ගත් පවුල්, මෙම මහා සුවිශේෂිත වූ පාද නමස්කාරය අර්ථවත් කළේය.

**(සේයා - ගාමිණී පීරිස්, සටහන - ඇබ්ඩන් මිහිඳුකුල)**

## ක්ලෙමන්ට් ප්‍රනාන්දුගේ "JESUS" පාස්කු ගීතාවලිය එළිදකී

දූව කියූ සැනින් අපට මතකයට සිහිගැන්වෙනුයේ පාස්කුවයි. ඒ දූව පාරම්පරික ඓතිහාසික පාස්කු සංදර්ශනය නිසාවෙනි. දූව සෞන්දර්ය රංග කේන්ද්‍රය මගින් "JESUS පාස්කු ගීතාවලිය" සංයුක්ත තැටිය එළිදක්වා ඇත.

මෙහි නිර්මාතෘ වනුයේ දූව පාරම්පරික පාස්කු දර්ශනයේ අධ්‍යක්ෂ, දූව සෞන්දර්ය රංග කේන්ද්‍රයේ සභාපති ක්ලෙමන්ට් ප්‍රනාන්දු මහතා විසිනි. මෙහි ගීත 12 ක් අන්තර්ගත වන අතර මෙහි අඩංගු සියලු ගීතයන්හි ගේය පද රචනය සහ සත්සර නාද රටාවන් ක්ලෙමන්ට්ගෙනි සංගීත අධ්‍යක්ෂණයෙන් දිනේෂ් සුබසිංහ දායක වී ඇති අතර ගායනයන් සඳහා විශාරද නන්දා මාලනී සමඟින් සුනිල් ප්‍රනාන්දු, ෆ්‍රෑන්ක් ප්‍රනාන්දු, හර්මන් කුරේරා (නගරාධිපති), ක්ලෙමන්ට් ප්‍රනාන්දු, සහ දූව සෞන්දර්ය රංග කේන්ද්‍රයේ ගායක පිරිසගේ දායකත්වය ලැබී ඇත. මේ සඳහා අනුග්‍රහක දායකත්වය ආගමික හා සදාචාර වර්ධන කටයුතු අමාත්‍යාංශය මඟින් ලබා දී ඇත.

**(කුමර නයනජිත්)**

# රන්පොකුණගම කන්‍යාමරිය රාජේශ්වරියගේ දෙව්මැඳුර 300 වැනි සදාසරණ නොවානය

පුදබිමක අසිරිය

පසුගියදා නිට්ටඹුව රන්පොකුණගම කන්‍ය මරිය රාජේශ්වරියගේ දෙව්මැඳුරේ 300 වැනි සදාසරණ නොවානය මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ජයකොඩි පියතුමාගේ ආරාධනය පරිදි ප්‍රැන්සිස්කාන නිකායේ ශ්‍රී ලංකා ප්‍රාදේශාධිපති අතිගරු මාක් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

මීසම් සහයක ගරු තුෂාර සම්පත් පියතුමා ද මෙයට සහභාගි විය. උන්වහන්සේ සුමිහිරි ගීයකින් ජනතා හදවත් පිබිද වූහ. වසර 20 කට පෙර ඔබ කොහේ සිටියේ දැයි ප්‍රශ්නයක් නඟමින් ගීතය ගායනා කළහ. එදින නිමැවූ දර්ශනීය සදාසරණ දේවමාතා මණ්ඩපය මුළු දෙව්මැඳුරටම අලංකාරය ගෙන දෙන්නක් විය.

එහිදී "පිටින් එදා අපි ඔහේ ගෙවා
ඉන්නා අතරේ ඔබ හමුවුණා
අපි දිහා බලා කිව්ව දේ නිසා
අපි වෙනස් වුණා."

ගරු පියතුමන් මේ ගීතය විස්තර කරමින් පිට පළාත් වලින් පැමිණි ජනතාවට දෙවියන් වහන්සේට පුද පූජා පවත්වන්නට ස්ථානයක් නොමැතිව අසරණ වූ මොහොතේ දේව අම්මා අප දෙස නෙත් යොමුකර අප ජීවිත වෙනස් කළ බවත් අප සැම එකමුතු කළ බවත් අවධාරණය කළේය.

1994 සිට 2002 දක්වා ගරු රංජිත් මදුරාවල පියතුමා එවකට ගම්පහ දිසානායක, වර්තමාන අගරදගුරු පදවි කතෝලික පෞද්ගලික පාඨශාලා සාමාන්‍යාධිකාරි (බ.ප.) යටතේ මීසම පාලනය විය.

එතුමන්ගේ එකම අභිලාෂය වූයේ රන්පොකුණගම ජනතාවට දේවස්ථානයක් ඉදිකර දීමයි. ඒ සඳහා පියතුමන් නිරන්තරයෙන් දේව මෑණියන්ට යාච්ඤා කරමින් දිළිඳු පවුලකට නිවසක් සාදා දෙන බවට එතුමිය සමඟ ගිවිස ගත්තේය. ඒ ගිවිසුම වචනයේ පරිසමාප්ත අයුරින්ම ඉෂ්ට විය.

ගරු රංජිත් මදුරාවල පියතුමාගේ ආරාධනය පරිදි එවකට රාගම කලාපීය අනුනායක, වර්තමාන ඇක්වයිනස් සරසවි විද්‍යායතනයේ අදියුරු ගරු ප්ලැසිඩස් ද සිල්වා පියතුමා විසින් 2002 අගෝස්තු මස 11 වන දින නව දෙව්මැඳුරට මුල් ගල තබා ආසිරි ගැන්විය. එතුමන් දේවස්ථානයේ ඉදිකිරීම් කටයුතු මහත් උද්යෝගයකින් හා වගකීමකින් ඉටු කළේ ය.



දේවස්ථානය සාදා වහලේ වැඩ නිම කරමින් සිටින අතර එතුමා නිට්ටඹුව මීසමෙන් සමුගත්තේය.

2002 වසරේ ගරු පැට්‍රික් කාරියවසම් පියතුමා නිට්ටඹුව මීසමට පත් විය. පසුව දේවස්ථානයේ බිම සකස් කර, දෙපැත්තේ මොගොප්පු දෙක වෙනස් කර ඉතිරි වැඩ කොටස ද නිමාවට පත් කරමින් එවකට කොළඹ අගරදගුරුව සිටි වත්මන් විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් අතින් 2004 ජුනි මස 05 දා දෙව්මැඳුර විවෘත කර ආසිරි ගැන්වීය.

2006 වසරේ නිට්ටඹුව මීසම් සේවක වූ ගරු ලෙස්ටර් නෝනිස් පියතුමාගේ සංකල්පය අනුව 2006 ජුනි මස 7 බදාදා සදාසරණ නොවානය ආරම්භ විය. 300 වැනි නොවානය සමරන මීසම් වාසීන් බැතිබරින් සදාසරණ නොවානය අර්ථාන්විතව තවදුරටත් පවත්වා ගෙන යන්නෝය.

**(මයිකල් සෙබස්තියන් සෝමරත්න)**

## සත්‍යාගමේ ගිනිසිළුව දැල්වූ

# ශ්‍රී ලාංකේය මුනිවරයා



හා. ජුසේ වාස් පියතුමා උපන් ස්ථානය

**ජන්ම දිනය අදයි**

**අද දින ලාංකේය ශු.සභා මාතාව ලංකා අපෝතුළුවර භාග්‍යවත් ජුසේවාස් මුනිදුන්ගේ 362 වෙනි උපන් මංගල්‍යය සිදුකරන්නීය. වර්තමාන ලාංකේය ශු.සභාවේ පදනම හා අඩිතාලම අනුරපුර යුගයේ හෝ පෘතුගීසි යුගයේ නොව ඕලන්ද පීඩන සමයේදීය. විසිරී ගිය ශු. සභාවක් බිඳ වැටුනු දේශයක් තුළ යලි ශු. සභාව ගොඩනැගීම සඳහා මේ යුගයේදී තෝරා ගන්නා ලද දේව සේවකයෙකු වූවේය.**



ජුසේ වාස් පියතුමන් ප්‍රසාද ස්නාපනය ලැබූ එතුමන්ගේ උපන් ගමෙහි පිහිටි දෙව්මැඳුර

එතුමාණන් තුළින් දෙවිඳාණෝ ඕලන්ද පීඩන සමය තුළ වසර 30 කට ආසන්න කාලයක් පුරාවටම මංමුළාවූ බැටළුවන් සේ, විසූ අපගේ මුතුන් මිත්තන්ගේ විශ්වාසය යළි දෙවිඳුන් තුළ ගොඩනගා සත්‍යාගමේ ගිනි සිළුවෙන් ඔවුන්ගේ හදවත් දැල්වූවේය. මෙහිදී එතුමාණන් ඉටුකළ මෙහෙවර අද්විතීය වූද, ප්‍රශංසනීය වූද මෙහෙවරකි. මෙරට කතෝලිකයන් ලෙස අද අප හට ඒකරාශීව සිටිමට අවැසි පදනම හා අඩිතාලම භාග්‍යවත් ජුසේවාස් මුනිදුන් දැමූ පදනම මත පිහිටා තිබෙන්නේය. ආසියාකරයෙන් බිහිවූ අග්‍රගන්‍ය ධර්මදූතවරයාණන් ලෙස ද සැලකෙන්නේ ලංකාවේ අපෝස්තුළුවරයාණන් හා ගෝවාපුර හා ඩමාන්හි නාම සාන්තුවරයාණන් ලෙස සැලකෙන භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන්ය. ඒ පිළිබඳව ලාංකේය ශු. සභාව සදා එතුමාණන්ට ණයගැතිය.

මේ විපැරුම එතුමාණන්ගේ ළමා කාලය පිළිබදවයි. ගෝවා පුරයේ සැල්සෙට් ප්‍රදේශයේ, සැන්කෝලයේ, වර්ෂ 1651 අප්‍රේල් මස 21 වැනි දින ජුසේ වාස් පියතුමා උපත ලද්දේය. ඉන්දියාවේ ස්වකීය අධිරාජ්‍ය අහිමි වූ පසුවත් මේ භූමිය පෘතුගාලයට අයත් වූ ප්‍රදේශයක් විය. ජුසේ වාස් පියතුමාගේ දෙමව්පියන් වූයේ ක්‍රිස්ටෝපර් වාස් හා මාරියා මිරන්ඩා නැමති බ්‍රාහ්මණ කුලයේ කොන්කානි බැතිමත් ඉන්දියානු යුවලක්ය. පැරණි කතෝලික පවුලක් වූ මොවුන් තම ආගම කෙරෙහි දැක්වූ විශ්වාසයනීයත්වය හා භක්තිවන්ත භාවය සඳහා ප්‍රසිද්ධියක් ඉසිලීය. එවක විසූ සම තත්ත්වයේ අනෙකුත් ඉන්දියානුවන්ට වඩා අධ්‍යාපනයක් ලද ක්‍රිස්ටෝපර් වාස් ඔහුගේ උගත්කම හා මහත්මා ගතිගුණ හේතුකොටගෙන සියල්ලන්ගේම ගෞරවයට පාත්‍ර විය. ජනප්‍රවාදයන්ට අනුව, තම පුතණුවන්ගේ උත්පත්තියේදී දෙවියන් වහන්සේ විසින් ළදරුවාගේ අනාගත නියමය පිළිබඳව ඔහු දැනුවත් කළ බවක් සඳහන් වේ. මෙහි සත්‍යතාවය තවදුරටත් තහවුරු කිරීම සඳහා ක්‍රිස්ටෝපර් වාස් විසින් සටහන් කරන ලද එදිනෙදා සිදුවීම් අතර සඳහන් වන ''1651 අප්‍රේල් මස 21 වැනි දින මා හට දාව උපන් පුතු අට වැනි දින බෞතීස්ම කරන ලදී. අනාගතයේ ඔහු උතුම් පුද්ගලයකු වන බැවින් ඔහු හට ජුසේ යන නම තැබීමි'' යන වැකිය උපයෝගී කරගත හැක.

තම මව් පාර්ශවයේ මිත්තනුවන්ගේ නිවසේදී ජුසේ මෙලොවට බිහි විය. මෙය උසස් කුළයේ ඉන්දියානුවන් විසින් සාම්ප්‍රදායිකව රැකගත් සිරිතකි. ජයසින්ත් පෙරේරා පියතුමා විසින් ඔහු බෞතීස්ම කරන ලදී. ඒ බෙනුවාලිම්හි පිහිටි ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ට කැපවූ දේවස්ථානයේය.ඔහුගේ ළදරු අවධිය පිළිබඳ දත් තොරතුරු ඔහුගේ දක්ෂතා හා මහත් වූ භක්තිය හෙළි කරයි. ඔහුගේ සම වයසේ දරුවන් කෙළිදොලින් කාලය ගත කරද්දී ඔහු වඩාත් ප්‍රිය කළේ නිසල ස්ථානයකට වී යාච්ඤා කරන්නටය. දිනපතා දේව මෙහෙයට සහභාගි වූ ඔහු, පූජාප්‍රසාදිතුමා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රෝගීන් වෙත ගෙන යන අවස්ථාවලටද සහභාගි විය.

එසේම මළවුන් සොහොන් භූමිය වෙත ගෙන යන අවස්ථාවලට සහභාගි වීමට වඩාත් ප්‍රියකළ මොහු, රාත්‍රී කාලයේ දැන හඳුනන සියල්ලන් වෙත ගොස් ඔවුන්ගේ යාච්ඤා වලටද විශේෂයෙන් මළවුන් වෙනුවෙන් යාච්ඤා ඔප්පු කරන මෙන් ඉල්ලා සිටියේය. යාච්ඤාවේ නිරත වීමට මෙතුමාණන්ට වේලාවක් නොවීය. ඇතැම් අවස්ථා වලදී රාත්‍රී කාලයේ පවා දේව ලැදියාව නිසාම මෙතුමා තම පියාගේ නිවසට යාබද කෝර්ටාලිම් ගමේ පිහිටි ශු. පිලිප් හා සිමියොන් යන අපෝස්තුළුවරුන්ට කැපවූ දේවස්ථානයට ගියේය. මෙතුමා මෙම දේවස්ථානයට යන කල්හි එහිදී වසා තිබූ දේවස්ථානය මෙතුමා අතතැබූ සැනින්ම විවෘත වූ බව සඳහන් වේ. දිළිඳුන් හට ත්‍යාගශීලී වූ කුඩා ජුසේ

**අසේල දසනායක විසිනි**

බොහෝවිට තම දෙමව්පියන්ට රහසේ තම රාත්‍රී ආහාරය දන් දුනි.

ජුසේ වාස් පියතුමාගේ ළමා විය පිළිබඳව මෙයට වඩා තොරතුරු රැසක් අපවෙත නොමැත. එකල සැන්කෝලයේ විසූ වයස්ගත පුද්ගලයෙකු වූ අන්තෝනියෝ කර්ඩෝසෝ කුඩා ජුසේ පිළිබඳව නිතර පැවසූ දෙයක් නම් ''අහෝ සැන්කෝලය, නුඹට උරුම වූ වූ ආශිර්වාදය පිළිබඳව නුඹ නොදන්නෙහිය. එහෙත් උතුම් වූ දෙව්පියාණන් වහන්සේ විසින් ඔහුගේ දෙමව්පියන් වෙත දුන් පොරොන්දුව ඉටුකරන දිනයක් පැමිණෙනු ඇත'' යන්නයි. ඔහුට මහත් ආදරයක් දැක්වූ ගැමියෝ ඔහු ඇමතුවේ ''ශුද්ධ වූ ළදරුවා'' යන නමිනි. (පුංචි සාන්තුවරයා) සැන්කෝලේහි හි පෘතුගීසි පාසලකට ගිය ජුසේ ගේ මව් බස වූයේ කොන්කානි බසයි. තම දරුවා පිළිබඳ ශුභාරංචිය කල්තියා දැනගත් ක්‍රිස්ටෝපර් හා මරියාගේ එකම බලාපොරොත්තුව වූයේ ඔහු පැවිදි දිවියට ඇතුලත් කරවීමය. මෙම බලාපොරොත්තුව ඇතිව, ඔවුහු ලතින් භාෂාව ඉගැන්වීම සඳහා කුඩා ජුසේ බෙනවූලිම් හි පාසලකට ඇතුලත් කළෝය. එහිදී ඔහු ව්‍යක්ත ලෙස කියැවීමේ හා ලිවීමේ ශාස්ත්‍ර ඉගෙන, ගෝවේ හි විශ්ව විද්‍යාලයට ඇතුලත් විය.

මෙය ජේසු නිකායිකයන් විසින් පවත්වාගෙන යනු ලැබූ සුප්‍රසිද්ධ විද්‍යාලයකි. දෛනික අධ්‍යාපන කටයුතු සඳහා යන එන විටදී ජපමාලය උච්චාරණය කිරීම තරුණ ජුසේ පුරුද්දක් කොටගෙන තිබිණි. ඉහත කී පාඨමාලාව හැදෑරීමෙන් පසු ඔහු සාන්ත තෝමස් ඇක්වයිනස් අධ්‍යාපන පීඨයට




ගෝවා, සැන්කෝලෙහි ජුසේ වාස් පියතුමන්ගේ නිවස

ඇතුලත්ව වසර හතරක් දර්ශණ විද්‍යාව හා දේව ධර්ම ශාස්ත්‍රය හැදෑරීය. මේ කාලය තුල ඔහු ජීවත් වූයේ වැඩිහිටි පූජක ආවාසයකය. මෙය අයත් වූයේ ජපමාලයේ අප ස්වාමිදුගේ දේවස්ථානයටය.

ගෝවේ හි අනෙකුත් දේවස්ථාන හා සැසඳීමේදී කුඩා මෙන්ම ඉතා දිළිඳු බවක් ඉසිලූ මෙම දේවස්ථානයෙහි ෆ්‍රැන්සිස් සේවියර් මුනිවරයාණන්ගේ දේහය තැන්පත් කොට තිබූ බැවින්, කතෝලිකයන් හට වැදගත් ස්ථානයක් විය. මෙම ස්ථානය වනාහි ජුසේ වාස් පියතුමා තම උසස් අධ්‍යාපනය ලබන කාලයේ බොහෝ විට යාච්ඤාවෙහි යෙදී සිටි බවට සඳහන් වන ජපමාලයේ අප ස්වාමි දුගේ දේවස්ථානයේ ෆ්‍රැන්සිස් සාවියෙර් මුණිවරයාගේ සිරුර තැන්පත්කොට තිබූ බව මෙම ග්‍රන්ථයේ සඳහන් වුවද, පැරණි ගෝවේහි ස්මාරක යන කෘතිය එම නමින් වර්තමානයේ ඇති දේවස්ථානයේ මුනිවරයාගේ සිරුර තැන්පත් කොට තිබූ බවක් සඳහන් නොවේ. එහෙත් මෙහි ඇති සොහොන් ස්මාරකයක් වූ දෝන කැතරිනාගේ (ගාර්ෂියා ප්‍රතිරාජයාගේ බිරිඳ) විවාහය සිදුකරන ලද්දේ සාවියර් මුනිවරයාණන් විසින් බව සඳහන් වේ.

වර්තමානයේ ෆ්‍රැන්සිස් සාවියර් මුනිවරයාණන්ගේ සිරුර තැන්පත් කොට ඇත්තේ යහපත් ජේසු තුමාණන්ගේ බැසිලිකාවෙහිය. ( බෝම් ජේසු බැසිලිකාව )

මෙය තුළ වූ කුඩා දෙව්මැදුරක් ෆ්‍රැන්සිස් සාවියර් මුනිවරයාණන් හට කැපකොට එහි එතුමාගේ සිරුර තැම්පත්කොට ඇත. ඇත පෙරදිගින් ගෙන ආ පසුව මෙය සාන්ත පාවුළු දේවස්ථානයේ කලක් තැන්පත් කොට තිබිණි. ඉන් පසුව 1624 දී මෙය බෝර්ජා හි සාන්ත ෆ්‍රැන්සිස් තුමාණන්ට කැපකොට එහි ඔහුගේ සිරුර තැන්පත් කරන ලදි.

1655 දී නැවත මෙය වර්තමානයේ තැන්පත්කොට ඇති යහපත් ජේසු තුමාණන්ගේ බැසිලිකාවෙහි තැන්පත් කරන ලදී. තරුණ ජුසේවාස් හට ශු. ෆ්‍රැන්සිස් හා සාවියෙර් මුනිදුන්ගේ දේහය දකින දකින සෑම විටම එතුමාණන්ගේ අරමුණ වූයේ මෙතුමා මෙන් ධර්මදූත මෙහෙවරේ යෙදී සමිඳුන් උදෙසා තම මුළු දිවියම දෙවිඳුන්ට පුද කිරීමටය. මෙලෙස දේවස්ථානයේ සාණ්ඨාරය ඇසෙන නෑසෙන තරම් දුරක වෙසෙමින්, ජුසේ වාස් සමිඳුන් හා සබැඳි බැතිමත් ජීවිතයක් ගතකළේ මෙවැනි දැහැමි පරිසරයකය. ඔහු ධර්ම දේශනා කිරීමට භාවිතා කළ කුඩා ධර්මාසනයත්, දිව්‍ය පූජාව ඔප්පු කළ කුඩා අල්තාරයත් අදත් මෙතැන්හි දක්නට ලැබේ.

සුදු හුණු ආලේපිත බිත්ති තුළින් මතුවන්නාවූ, විස්තර කිරීමට උගහට නිශ්චලත්වය, මෙම දේවස්ථානයට පැමිණෙන බැතිමතුන්ගේ සිත් නිරතුරුවම බැතිමත් බවින් පුබුදු කරන ලදී. මෙවැනි වාතාවරණයක් තුළ තරුණ ජුසේ ගත කළ ජීවිතය, පසුකාලීනව ඔහුගේ ධර්මදූත සේවයේ අධ්‍යාත්මික කැපවීම සඳහා බලපෑමක් ඇති කළා විය හැක.

මෙම කුඩා දේවස්ථානයේ හි දී රැය පහන් කළේ අල්තාරයේ තරප්පු පෙල මතය.මෙලෙස ලාංකේය කිතුනු අනන්‍යතාව හා විශ්වාසයේ දේව තිළිණය අප වෙත උදා කළ දේව ප්‍රේමයේ ප්‍රතිමූර්තිය වූ අප අපෝස්තුළුවරයාණන්ගේ මහඟු දිවිමගේ ආදර්ශය හා ධර්මදූතික ක්‍රියාදාමය අප දිවියට ආදර්ශයක් ලෙස ගනිමින් විශ්වාසයේ වසර ලෙස ශුද්ධාසනය විසින් නම් කර ඇති මේ වසරේ දී, අපගේ ම සහෝදර සහෝදරියන් ලෙස විශ්වාසයේ දේව තිළිණය මාංශගත කරන්නට වෙර දරමු.

එළෙස ම ආසියාවෙන් බිහි වූ අග්‍රගන්‍ය ධර්මදූතවරයාණන් හා ධර්ම ප්‍රචාරකයාණන් ලෙස සැලකෙන අප ආදර මුණිවරයාණන් කඩිනමින් විශ්ව සභා මාතාව තුළ දිදුලන සසුන් තරුවක් විලස බැබලෙන්නට වරම් පතා අඛණ්ඩව යදිමු.

**භාග්‍යවන්ත ෆෙඩ්රික් ඔසානම් තුමාගේ 200 වන ජන්ම ශත සංවත්සරය වෙනුවෙනි**

# "ඔබේ ඇදහිල්ල වචනයෙන්, දේශනයෙන් නොව ක්‍රියා පටිපාටියෙන් පෙන්නුම් කරන්න."

සාන්ත වින්සෙන්ති ද පාවුලා දයා සේවාවේ නිර්මාතෘවරයාණන් වන භාග්‍යවන්ත පෙඩ්රික් ඔසානම් තුමාගේ 200 වන ජන්ම ශත සංවත්සරය 2013 වසරේ අප්‍රේල් මස 23 වන දිනට යෙදී ඇත. ප්‍රංශයේ විසූ ඔගස්ටින් ඔසානම් සහ මාරි කැන්ටස් යුවළට දාව මෙලොව එළිය දුටු එතුමා දරුවන් 14 දෙනෙකු සිටි පවුලකට නෑකම් කීවා.

ඔගස්ටින් සහ මාරි භක්තිමත් කතෝලිකයන් වූහ. වෛද්‍ය වෘතිකයකු වූ ඔගස්ටින් සහ ඔහුට සහාය වූ මාරි තුළ දුප්පතා කෙරෙහි සැබෑ කැපවීමක් තිබූ නිසා ඔවුන්ගේ මුළු ජීවිතයම දුෂ්කර ස්වභාවයක් ඉසිලීය. දරුවන්ගේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් ද අවස්ථාව සලසා දුන් එම මව්පිය යුවළ පවුලේ පස්වන දරුවා වූ ඇන්තනි පෙඩ්රික් ඔසානම් ලියොන්ස්හි රාජකීය විද්‍යාලයට ඇතුළත් කරන ලදි. ඉගෙනීමේ කටයුතු විශිෂ්ටව නිම කර පියාගේ බලවත් ආශාව ඉටුකරලීම පිණිස නීතිඥයකු වීම සඳහා ප්‍රංශයේ නීති විදුහලට සහ ඉන්පසු වැඩිදුර අධ්‍යාපනය සඳහා සෝර්බොන් සරසවියට ඇතුල් විය.

වර්ෂ 1833 පමණ වෙද්දි ආගමික නියමයන් පිළිනොගත් ජන කොටසක් ද, සෝර්බෝන් සරසවිය තුළ බිහි වී ව්‍යාප්ත වෙමින් පැවතිණ. කිතුනු සභාවේ දුගී දුප්පත් ජනතාවට ලැබෙන සහනය කුමක්ද? "ඔබේ ඇදහිල්ල වචනයෙන් දේශනයෙන් නොව ක්‍රියා පටිපාටියෙන් පෙන්නුම් කරන්න" යන කිතුනුවනට මුහුණ දීමට සිදුවූ අභියෝගයට පිළිතුරු



දීමට අධිෂ්ඨාන කරගත්, පෙඩ්රික් ඔසානම් හිතවත් සමීපතරයන් 6 දෙනකු රැස් කරගෙන, යාච්ඤා සාකච්ඡා තුළින් ඇඟට දැනෙන අයුරින් යමක් කරන්නට කතිකා කර ගනිමින්, මෙම පුංචි කණ්ඩායමේ මුල් පරිත්‍යාගය ලෙස තමන් ශීත කාලයේ පාවිච්චිය සඳහා රැස්කරගෙන තිබූ දරටික දුගී පවුලකට පරිත්‍යාග කිරීමට සූදානම් කර එසේ කිරීමට තීරණය කළා.

1841 ජුනි මස 23 වන දින එමිලි සවුලා ක්‍රොයික්ස් සමඟ විවාහ ජීවිතයට ඇතුළත් වූ පෙඩ්රික් ඔසානම් ට ඇයගේ සහයද නොමඳව ලැබිණි. දුප්පතා ඔහු මෙන් නොව, ඔහුට වඩා ශ්‍රේෂ්ඨ බව නිතරම සිතූ එතුමා දීමනාවන් පිළිගන්නා තැනැත්තා දීමනාකරුට මහත් උපකාරයක් කරන බව එතුමාගේ අදහස විය.

1846 වසරේ බලවත් ලෙස රෝගාතුර වූ එතුමා තම බිරිඳගේ බලවත් ඉල්ලීම ලෙස විවේකීව සිටීමට සුවය ළඟා කර ගැනීමට තම මව් රට බලා යෑමට තීරණය කළේය.

මාර්සෙල්ස් වෙත පැමිණීමෙන් පසු නැවතත් රෝගී වූ එතුමා දෙවියන් වහන්සේට තම ජීවිතය පුද කරමින්. තම දෙනෙත් පියා ගත්තා. ඒ 1853 සැප්තැම්බර් 8 වනදායි. 1997 අගෝස්තු 22 වන දින දෙවන ජුවාම් පාවුළු සුදොතුම් පියාණන් විසින් භාග්‍යවරයට ඔසවනු ලැබුවා.

ජාත්‍යන්තර සංවිධානයක් වන ලෝ පතල සා. විසෙන්ති දයා සේවාව රටවල් 148 ක 750,000 සාමාජික සාමාජිකාවන්ගෙන් යුක්තය. ශ්‍රී ලංකාවේද පදවි 12 ක කොන්ෆරන්ස 326 කින් සමන්විතය. පෙඩ්රික් ඔසානම් තුමා මෙලොව එළිය ලබා වසර 200 ක් සපිරෙන අතර, සගසුව දිනා වසර 160 ක් සපිරේ. එලෙසම දයා සේවාව අරඹා වසර 180 ක් සපිරේ.

කොළඹ පදවියේ සා. ලුසියා ආසන දෙව්මැඳුරේ සා. ලුසියා කොන්ෆරන්සය 1905 වසරේ ද, යාපනය පදවියේ සා. මරියා සහ නවන්තුරේ සා. නිකුලස් කොන්ෆරන්සය 1910 වසරේ ද, මඩකලපුව පදවියේ සා. මරියා කොන්ෆරන්සය 1912 වසරේ ද ආරම්භ කර දැනට 100 වසර සපුරා ඇත. මෙම හේතුන් නිසාවෙන් 2013 වසර සියළුම වින්සෙන්තියානුවන්ට විශේෂ මංගල අවස්ථාවක් විය යුතුය.

**✍ එච්. මාරි ප්‍රනාන්දු**
**සා. වි. පාවුලා ජාතික සභාව**

දෙවියන් හා බැතිබර සංවාද
ප්‍රදීපය
ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

**පසුගිය සතිය හා සබැඳේ...**

(ආ) වගන්ති 11-20
ගීතිකාකරු තම වේදනාවේ ගැටලුව පිළිබඳ ගැඹුරු මෙනෙහි කිරීමක යෙදී සිටියදී යැදුම තුළින් සහන් එළියක් දකින අන්දම මේ දෙවැනි කොටසින් පැහැදිලි කෙරේ. දෙවියන් වහන්සේ අතීතයේ තමන් වහන්සේගේ ජනතාව වෙනුවෙන් පුදුම දේ සිදුකොට ගැලවීම සලසා දුන් සේක. ඒ ලෙසම දෙවි සමිඳාණන් අනාගතයේ දී ද සිය ජනතාව වෙනුවෙන් මැදහත් වන බව ගීතිකාකරුගේ විශ්වාසය වන්නේ ය.

ඔබේ ක්‍රියා මාර්ග :
දෙවියන් වහන්සේගේ පුදුම ක්‍රියාවන් විදහා දක්වන්නේ උන්වහන්සේගේ ශුද්ධවන්ත බව සහ බලයයි. උත්තරීතර දෙවි සමිඳාණන් මිනිස් ජනතාවට සමීප වූ දෙවි කෙනෙක් බව මෙහිදී අවධාරණය වේ. (ගීතා 71:19-20, නික්ම. 2:23-25)

හාස්කම්පාන දෙවි සමිඳාණෝ
පුරාණ ගිවිසුම් පසුබිමෙහි දෙවියන් වහන්සේගේ පුදුම ක්‍රියා උන්වහන්සේගේ දිව්‍යමය අනන්‍යතාව පෙන්නුම් කරන්නේ ය. උන්වහන්සේ සොබා දහම තුළ ද මිනිස් දිවිය තුළ ද එලෙසින් ප්‍රකාශ වන සේක. (ගීතා 72:18, නික්ම. 6:2-8).

බලවත් හස්තයෙන් :
උන්වහන්සේ සිදු කළ ක්‍රියා වලින් උච්චතම ක්‍රියාව වන්නේ මිසරයේ වහල් කමින් තමන් වහන්සේගේ ජනතාව මුදවා ගැනීමේ ක්‍රියාවයි. (ගීතා. 136: 10-26, නික්ම. 14:31).

ජලධාරාවෝ ඔබ දුටු විට :
වගන්ති 17-20 දක්වා කොටස් ප්‍රබල කාව්‍යමය ශෛලියකින් දෙවියන් වහන්සේ මහිමවත් ප්‍රකාශ වීම බයිබලීය සංකේත යෙදුම් තුළින් ඉදිරිපත් කරයි (ගීතා 18:8-6, නික්ම. 14:21-22)

මඟ පෙන්වීම ඇතිව :
දේව ජනතාවගේ සැබෑ නායකයාණෝ දෙවියන් වහන්සේ වන සේක. ජනතාව තෝරා ගත් අය ඒ සඳහා එතුමන්ගේ මාධ්‍ය වේ (ජෝෂුවා 1:5, ජෙරමි. 1:8)

**යැදුම**
මිනිස් අප මවා, අප ජීවිත සෙනෙහසින් ද ප්‍රඥාවෙන් ද හසුරුවන දෙවි පියාණන් වහන්ස, ජීවිතයේ සිදුවීම් තුළින් අපට සමීපව අප ආසිරි ගැන්වීම ගැන ඔබවහන්සේට තුති පැසසුම් දෙමු. අප ජීවිත සසල කරවන අභියෝග පීඩාකාරී

ගීතාවලිය



ශුද්ධ ලියැවිලි වසර

**(49)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

අවස්ථාවල ඔබ මතම විශ්වාසයෙන් රඳා පවතින්නට වරම් දුන මැනව.

ඉදිරියට...

ගරු හෙන්රි සිල්වා පියතුමා

**75**

# පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය



**පසුගිය සතිය හා සබැඳේ**

## 67 වන තෙහිලි ගීය

**සාහිත්‍යමය ස්වරූපය**

බහුල අස්වැන්නක් ලබා දී තමනට මෙන්ම තම සංඝය වෙත ද ආසිරි වස්වාලීම වෙනුවෙන් තෙහිලි ගීත කතුවරයා මෙහිදී සමිඳාණන්ට තුති පුදන බව 6 - 7 වගන්ති පැහැදිලිව පෙන්නුම් කරයි. තෙහිලි ගීතය සපුරාම ප්‍රශංසාවේ මූලයන් අන්තර්ගත වෙයි. මෙවැන්නක් තුති දීමේ තෙහිලි ගීත බහුතරයකට ආවේනික ලක්ෂණයකි.

**ජීවන පසුතලය**

ඉහත සඳහන් කරුණු මඟින් පෙන්නුම් කරනුයේ බහුල පලදාවක් වෙනුවෙන් සාංඝික තුති පිදීමක් ලෙස සම්පාදනය වී ඇති බවය. තෙහිලි ගීතයේ කතුවරයා සංඝ නියෝජිතයකු මෙන් කතා කරන නිසා ඔහු සංඝයක නායකයකු බව පෙනේ. පෙන්තකොස්ත වැනි අස්වැන්න මංගල්‍යයක් ආශ්‍රිතව මෙම ගීතය දේව මාළිගය තුළ ජනවන්දනාව සඳහා පසුකාලීනව භාවිත කරන ලද බව උපකල්පනය කළ හැකිය.

**බෙදුම**

1-2 : නොකඩවා සංඝයට ආසිරි වස්වන මෙන් දෙවියන් වහන්සේට කෙරෙන යැදුමකි.
3-5 : ඉශ්‍රායෙල්හි දෙවිඳාණෝ සියල්ලන්ගේ සමිඳාණන් බව සියලු ජාතීන් පිළිගෙන ඔවුන් වහන්සේට ප්‍රශංසා කරත්වා යනුවෙන් කෙරෙන පැතුමකි.
6-7 : තුතිපිදීමට හේතු දැක්වීම

**විග්‍රහය**

1 : මෙම වගන්තිය ගණන් කථාව 6:25 සඳහන් කරන පූජක ආශීර්වාදයේ ආභාෂය ලබා ඇති බව පෙනේ.

2 : සමිඳාණන් ඉශ්‍රායෙල් ජනතාව වෙනුවෙන් කටයුතු කළ ආකාරය
පෙන්වා දී ඇත්තේ ඊශ්‍රායෙල්ගේ දෙවියන් වහන්සේ සතු විමුක්තිදායක ස්වරූපය හරහා ය. ඔවුන් වහන්සේ ගැලවීමේ දෙවියන් වහන්සේ වන නිසාය. සියලු ජාතීන් මෙම සාධකය පිළිගනිත්වා යන්න කතුවරයාගේ ප්‍රාර්ථනය වෙයි.

4 : දෙවියන් වහන්සේ ගෝත්‍රික දෙවි කෙනෙකු නොවන බැවින්, සියලු ජාතින් මෙන්ම පොළෝ වැසි සියල්ලන්ද මත ඔවුන් වහන්සේ සතු ආධිපත්‍යය මෙම වගන්තිය මඟින් අවධාරණය කෙරේ.

**පණිවුඩය**

දෙවියන් වහන්සේ විවිධාකාරයෙන් අප මත ආසිරි වස්වා ඇත. අප ඔවුන් වහන්සේ වෙත අපගේ තුති ප්‍රශංසාව පුද කරන අතරම අන් අයද ඔවුන් වහන්සේගේ උදාරත්වය පිළිගෙන තුති පුද කරන පිණිස ඔවුන්වහන්සේ සතු යහපත් බව අප අන් අය හට ප්‍රකාශ කිරීම වැදගත් ය.

☛ ලබන සතියට

ඉරුදින මෙනෙහි කිරීම

# සදාතන ජීවනය දෙන බැටළු එඬේරාණෝ

## අප්‍රේල් 21 - උත්ථාන සමයේ සතරවැනි ඉරුදින

**දෙවියන් වහන්සේගේ වචනය පළමුකොට ජුදෙව්වන්ට ප්‍රකාශ කිරීමට යුතුව තිබුණද ඔවුන්ගේ ඊර්ෂ්‍යාව නිසා පාවුළු තුමා විජාතින් වෙතට මේ සුපුවත ගෙන යන ආකාරය පළමු කියවීමෙන් පෙන්වා දෙයි.**

අදහාගත්තවුනට බැටළු පෝතකයාණන් තුළ ලැබෙන ස්වර්ගීය සම්පත් පිළිබඳව හෙළිදරව්වක් ගෙන හැර පායි.

උත්ථාන සමයේ සතරවන ඉරුදිනට නියමිත දේව වචනය තුළින් අපව කිතුනු දිවියේ හදවත වෙත කැඳවයි. එනම් උත්ථාන වූ කිතු සමිඳාණෝ ඔවුන් වහන්සේ හා ගැඹුරු සබැඳියාවකට අප කැඳවන සේක. කුරුසියේ මරණය තුළින් පාපයේ වන්දිය ගෙවූ ඔවුන් වහන්සේ, අජරාමර උත්ථානය තුළින් නව ජීවිතයකට අප කැඳවන සේක. එම ජීවිත ගමනේ ද මඟ පෙන්වන්නා සහ රක්ෂස්ථානය ද ඔවුන් වහන්සේම වන සේක. ඒ බව අදට නියමිත සුපුවත මෙසේ පැහැදිලි කරයි.

ක්‍රිස්තුන් වහන්සේ යහපත් බැටළු එඬේරාණන් වන සේක. ඔවුන් වහන්සේ යහපත් බැටළු එඬේරාණන් වීමට බොහෝ කාරණා බලපායි. එනම් ඔවුන් වහන්සේ හුදු එඬේරෙකුවත්, කුලීකාරයෙකුවත් මෙන් නොවී එන හැම සතුරු අභියෝගයක්ම හමුවේ බැටළුවන් වෙනුවෙන් සටන් කරන්නටත් අවැසි ඕනෑම වෙලාවක තම ජීවිතය පවා බැටළුවන්ගේ ආරක්ෂාව පතා පුද දෙන්නටත් සැදී පැහැදී සිටින එඬේරෙකි. එයට ප්‍රධානතම හේතුව වන්නේ මේ බැටළුවන් අනුන් සතු වස්තුවක් නොව මොවුන්, තමන් හා තම පියාණන්



සතු වස්තුවක් වන හෙයිනි. එබැවින් මොවුන්ගෙන් එකෙකුවත් විනාශ වනු දැකීම ඔවුන් වහන්සේගේ කැමැත්ත නොවෙයි. මන්ද එසේ වුවහොත් එම අඩුව ඔවුන් වහන්සේට හොඳින් දැනෙයි. ඒ ඔවුන් වහන්සේ මේ හැමෙකකුම හොඳින් දන්නා හඳුනන නිසාවෙනි.

බැටළුවන් ද ඔවුන් වහන්සේගේ කටහඬ හඳුනන හෙයින් ඔවුන් වහන්සේ පසුපස එති. එසේ යාමටත් බලපාන ප්‍රධාන හේතු සාධක ඇත. එනම් මේ බැටළුවන් නිල් තණබිම්, ජලය සොයා සමහර විට බොහෝ දුර ගෙවා යයි. මෙසේ යන ඔවුනට තමන් ආගිය පරක් තෙරක් පිළිබඳව කිසිදු නිනව්වක් නැත. නමුත් ඔවුන් තුළ විශ්වාසයක් ඇත. ඒ තමන්ගේ යහපත් එඬේරාණෝ තමන් නිසි කලට නිසි තැනට නිශ්චිතව ගෙන යන බවයි. තමන් රක්ෂාකර පරිස්සමින් යළි නැවතුම් පොළ කරා ගෙන යන බවයි.

එබැවින් කිතුනු අපගේ ජීවිත ගමනේ ද සමහර විට අප ගෙවන දිවිය පිළිබඳව අපටම අවබෝධයක් නොමැත. අපගේ ගමනේ මඟ පවා අපට අමතක වී ඇත. නමුත් ක්‍රිස්තුන් වහන්සේ අද අපට ආරාධනා කරන්නේ ඔවුන් වහන්සේගේ කටහඬ හඳුනාගෙන ඒ තුළ ගමන් කරන්නටයි. මන්ද ඔවුන් වහන්සේ යහපත් බැටළු එඬේරාණන් ලෙස තමන් එක බැටළුවෙකුවත් විනාශ වන්නට ඉඩ නොදී නිසි රක්ෂස්ථානයට ඔවුන් පමුණුවන හෙයිනි. කළ යුත්තේ සාවධානව ඔවුන් වහන්සේ තුළ හොඳ අවබෝධයකින් දිවි ගෙවීමයි.

අම්පිටිය ජාතික දෙව්සත්හලේ
ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ
✍ **ගරු නිලන්ත රංජුල සහෝදරතුමා**

# මිළ කළ නොහැකිය, ඒ තිළිණය

**මීට වසර 12 කට පමණ පෙර ඇමරිකා එක්සත් ජනපදයේ, චිකාගෝහි දුක්ප්‍රාප්ති තාපසාරාමයේ ලෝරන්ස් බ්‍රවුනින් පියතුමා ලියූ කුඩා පත්‍රිකාවක් මා අතට පත් විය. එය කියැවූ විට ජේසු සමිඳුන් අප හට තිළිණ කළ දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳව නොමැකෙන සටහනක් මා හදවතේ ඇඳුනි. ආධ්‍යාත්මික මාතෘකා රැසක් යටතේ මෙවැනි පත්‍රිකා පළ කළ එතුමා බලාපොරොත්තු වූයේ අප සැමට ජේසු සමිඳුන්ගේ ආදරය වඩ වඩාත් අත්දැකීමට සැලැස්වීමය. එතුමා මීට කලකට පෙර සමිඳු සෙවනේ සදා සාමය අත්කර ගත්හ.**

"දිව්‍ය සත්ප්‍රසාදය: ජේසු සමිඳුන් තමාවම අපට තිළිණ කිරීමකි" යන මාතෘකාව යටතේ ලෝරන්ස් බ්‍රවුනින් පියතුමා අපට කියා දුන්නේ වටිනා පණිවුඩයකි. මා අතට ද පත් එය, ඔබ සමඟ කලකට පසු හෝ මෙලෙස බෙදා ගන්නට මා මෙහෙය වූයේ සුදුසුම යයි සිතමි.

"දිව්‍ය පූජා යාගයේ කැපකිරීමේ ශ්‍රී වචන වලින් පසුව පූපය වෙනස් වේ. එවිට එම පූපය යම් දෙයක් නොව යම් කෙනෙකි. එසේ පවසනුයේ දිව්‍ය සත්ප්‍රසාදයෙහි දෙව් පුත් ජේසු සමිඳාණන්ගේ ශ්‍රී ශරීරය, ශ්‍රී රුධිරය, ආත්මය හා දෙවීකය අන්තර්ගත නිසයි.



දිව්‍ය පූපයෙහි අඩංගු වන්නේ ජීවමාන ප්‍රේමවන්ත පුද්ගලයෙකි. වේදනාව, උණුසුම, සීතල, අපහාසය දැනුනු, කළගුණ නොසැලකීමෙන් වේදනාවට පත් එම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේමය; තමන් වහන්සේ ද මෙලොව සිටියදී එවන් දේ අත්දුටු නිසා, අපගේ කරදර තේරුම් ගන්නා පුද්ගලයෙකි. ඉතා මුදු හදවතක් ඇත්තෙකි. ඇත්තෙන්ම ඔවුන් වහන්සේ දෙවරක් හැඬූ බව සුපුවත සඳහන් කරයි.

දිව්‍ය පූපය තුළ වැඩ සිටින්නේ මුළු ලෝකයේම සියළුම පාපයන් දර්ශනය කළ එයින් මහත් මානසික සංවේගයකට පත් වී ගෙත්සමෙනි උයනේදී ලේ දහඩිය හෙළු එම ජේසු සමිඳාණන්මයි; දරුණු කස පහර නිසා ඉරී, ගැඹුරු තුවාල ඇති වීමෙන් ඇඩි ලේ ගැලීමකට භාජනය වූ වේදනාවෙන් කෙඳිරි ගෑ අපහසුවෙන් හුස්ම ගත් එම දේව තැනැන් වහන්සේම යි. කටු ඔටුන්නක් හිස මත තබා ලී වලින් එයට ගසා, ඒ කටු හිසේ සම තුළට පසාරු වීම නිසා වේදනාවෙන් හිස පෙළුනාවූ එම සමිඳුන්මයි. කඳුලින් දෙනෙත් පිරී ඉතිරී, එම කඳුළු විරූප වූ හා තුවාල වූ කම්මුල් මත සෙමින් සෙමින් ගලා ගිය ගැලවුම්කරුවාණන්මයි.

කල්වාරි ගමනේ දී කුරුසිය බරින් පැකිලී වැටුණු එම ජේසු සමිඳාණන්මයි දිව්‍ය පූපයේ වැඩ සිටින්නේ. කෙළ ගසා සාපලත් අවමාන ලැබූ එම ජේසු සමිඳාණන්මයි; අත් හා දෙපා හරහා උල් ඇණ පසා වෙද්දී මුහුණ සුදුමැලි වී, කෙඳිරි ගාමින් අපහසුවෙන් හුස්මගත් එම ජේසු සමිඳාණන්මයි; තමන් කුරුසියේ එල්ලී සිට ප්‍රාණය පුද දෙද්දී තමාගෙම ජනයා කුරුසිය වටා සිට අපහාස සාප කරනු දැක අතිශය වේදනාවෙන් පෙළුණු ජේසු සමිඳාණන්මයි; කුරුසිය මත ප්‍රාණය පුද දෙද්දී එතුමන්ගේ විනිවිද පෙනෙනා දේව බැල්මෙන් සිය මස් හරහා අප එකිනෙකා දුටු ඒ ජේසු සමිඳාණන්මයි; එතුමනට විරුද්ධව පවු කරන, එතුමන් අතහැර යන දිව්‍ය සත්ප්‍රසාද තිළිණය නොසලකන අප දැකීමෙන් එතුමන්ගේ මොලොක් හදවත දුකෙන් වෙළුණි. ආත්මිකවත්, ශාරීරිකවත් අතිශය දුක්විඳි, අපට ඇති ආදරය නිසා අවසානයේදී කුරුසිය මත ප්‍රාණය පුද කළ ඒ ජේසු සමිඳුන්මයි.

පොදුවේ මිනිස් වර්ගයාටම ප්‍රේම කරන නමුත් එතුමනට ප්‍රේමය දැක්වීමට කෙනෙක් නැතුවාසේ අප එකිනෙකාට, තනි තනිවම පෞද්ගලිකවම ප්‍රේම කරන එම ජේසු සමිඳාණෝ දිව්‍ය පූපයේ වැඩ සිටිති. එලෙසම මේ මොහොතේ හා නොකඩවාම අප ගැන සිතන, සදාතනික ආදරයකින් අපට ප්‍රේම කරන ඒ ජේසු සමිඳාණෝමයි. දිව්‍ය පූපයේ වැඩ සිටින්නේ.

**ගරු ලෝරන්ස් බ්‍රවුනින් පියතුමා**
පරිවර්තනය - ඉවෝන් අමරසේකර

# සුදොතුම් පියතුමා පදවි ප්‍රාප්ත දේව මෙහෙයේදී අප අවබෝධ කරගත යුතු කාලීන පණිවුඩයක් අපට දෙයි

**කතුතුමනි,**

**"සුසුන් පිය පදවි ප්‍රාප්ති මෙහෙය චාම්; එහෙත් අභිමානවත්! යන හිසින් 2013 "ඥානාර්ථ ප්‍රදීපය" "විශේෂ පාස්කු අතිරේකයේ පල කර තිබූ නව සසුන් පිය පදවි ප්‍රාප්තිය පිළිබඳ ප්‍රවෘත්තිමය විශේෂාංගය අපගේ අවධානයට ලක්විය.**

එහි වූ පදවි ප්‍රාප්ති දිව්‍ය යාගයේ දී අති උත්තම ෆ්‍රැන්සිස් සසුනිසුරාණන් කළ දේශනයේ සම්පිණ්ඩනය අතිශය වැදගත්ය.

එහි තේමාව වී තිබුණේ "දෙවියන් වහන්සේගේ තිළිණයේ රැකවල්කරුවන් වෙමු." යන්නයි.

"....දෙවියන් වහන්සේගේ මැවිල්ලේ සැම එකකට ගරු සරු දක්වන අතරේම අප ජීවත්වන පරිසරයට ගරු බුහුමන් දැක්විය යුතුය..." ශුද්ධෝත්තම පියතුමන් පරිසරයට ගරු සරු දැක්වීමේ අතිශය වැදගත්කම මෙහිලා පෙන්වා දී ඇත.

අද ලොව තුළ පරිසරය විනාශ කිරීම, දූෂණය කිරීම විශාල ලෙස සිදුවන බව රහසක් නොවේ. අප කුඩා දිවයින තුළ ඊට ඕනෑ තරම් උදාහරණ ඇත.

"... එහි තේරුම නම් ජනතාව ආරක්ෂා කිරීම, සෑම පුද්ගලයකු කෙරේ ප්‍රේමය දැක්වීම, විශේෂයෙන් බාලයන් සහ වැඩිහිටියන් මෙන්ම අවශ්‍යතා සහිත අය බොහෝ විට අප අවසානයේ අවධානය යොමු කරන පිරිස් ගැන වැඩි සැලකිල්ලක් දැක්විය යුතුය."

පරිසරයට ගරු සරු දැක්වීම තුළින් ජනතාව ආරක්ෂා කිරීම, සැමට ප්‍රේමය දැක්වීම හා විශේෂයෙන් බාලයන් හා වැඩිහිටියන් ගැන සැලකිල්ලක් දැක්වීමේ අවැසියාව සුදොතුම් පියාණෝ පෙන්වා දුන්හ.

ජනතාව සුරැකීම හා සැමට ප්‍රේමය දැක්වීම වත්මන් ලොව තුළ අවම වී ඇත. ජීවිත හානි. බාලයන් අපයෝජනය, දූෂණය භීෂණය ලොව පුරාම සිදුවන වකවානුවකි මේ. මේ කරුණ ද බෙහෙවින් අප රටට ද බලපා ඇත.

"...අප පවුල්වල එකිනෙකා කෙරෙහි එකිනෙකා ආරක්ෂා කර ගන්නා කල දෙමාපියන් ලෙස ඔවුන් තම දරුවන් කෙරේද දරුවන් නිසි කලදී තම දෙමාපියන් ද රැක බලා ගනු ඇත. මෙහි අරුත නම් අන්‍යෝන්‍ය විශ්වාසයෙන් අවංක මිත්‍රත්වයත්, ගරුත්වය සහ යහපත සඳහා රැක ගැනීමයි. ..."

ශුද්ධෝත්තම පියතුමා පවුල තුළ එකිනෙකා ආරක්ෂා කර ගන්නා කල දෙමාපියන් දරුවන් ද, දරුවන් නිසි කලදී දෙමාපියන් ද රැක ගැනීමේ වැදගත්කම පෙන්වා දෙයි. මෙම දේශනයෙන් වර්තමාන ලෝකයට අතිශය වැදගත් වූත් කාලීන වූත් පණිවුඩයක් ලබා දෙති

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
පේරලන්ද

# මෛත්‍රීය කරුණාව වෙනුවට වෛරය වැපිරවීම

**කතුතුමනි,**

**"දේශයේ කතෝලික අනන්‍යතාවය අනතුරේ" මැයෙන් අප්‍රි. 14 වන ඉරිදා ප්‍රදීපයේ මහ පුවතින් ප්‍රකාශ වූ කරුණු කාරණාත් එදිනම ප්‍රදීප කතු වැකිය තුළින් දැඩි ලෙස ඉස්මතු කරන ලද කරුණු කාරණාත් දේශීය කිතුනුවන්ගේත් සභා පාලකයන්ගේත් ඇස්, කන්, අවදි කරවන්නක් විය යුතුය.**

කිතුනු අනන්‍යතාවය පෙරදැරි කරගෙන විවිධ නම් මඟින් සංවිධාන අටවාගෙන හුදෙක් ආර්ථික ලාභ ප්‍රයෝජන සඳහා පමණක් කටයුතු කරන පුද්ගලයන් කිතුනු පූජක නිල ඇඳුම පවා පැළඳගෙන කරන සමාජ විරෝධී, නීති විරෝධී දූෂණ ක්‍රියා ගැන නිවැරදි සත්‍ය හා යථාර්ථය හරි හැටි සොයා නොබලා හුදෙක් ද්වේශය, වෛරය පමණක් පෙරදැරි කරගෙන අපේ බෞද්ධ සංවිධාන හා හෙළ උරුම සංවිධානයේ බෞද්ධ නායක ස්වාමීන් වහන්සේලා කරන ප්‍රකාශ සමස්ත කිතුනුවන්ම හෙළා දැකිය යුත්තෙමු.

යම් සිද්ධියක සත්‍ය කතාව පසෙක තිබියදී මතු පිටට පෙනෙන දේ පමණක් උලුප්පවාගෙන කිතුනුවන්ට හා කිතුනු සභාවට එල්ල කරන අද්භූත ද්වේෂ සහගත චෝදනා හා අවමානයන් මෛත්‍රීය හා කරුණාව පෙරදැරි කරගෙන අපේ බෞද්ධ සංවිධාන හා හෙළ උරුම සංවිධානයේ බෞද්ධ නායක ස්වාමීන් වහන්සේලා කරන ප්‍රකාශ සමස්ත කිතුනුවන්ම හෙළා දැකිය යුත්තෙමු.

යම් සිද්ධියක සත්‍ය කථාව පසෙක තිබියදී මතුපිටට පෙනෙන දේ පමණක් උලුප්වාගෙන කිතුනුවන්ට හා කිතුනු සභාවට එල්ල කරන අද්භූත ද්වේෂ සහගත චෝදනා හා අවමානයන් මෛත්‍රීය හා කරුණාව පෙරදැරි කරගෙන බුදුන් වහන්සේ දේශනා කළ නිර්මල බුදු දහමට පවා ඔවුන් කරන බලවත් අපහාසයක් හා නින්දාවකි.

භික්ෂු ශීලය, විනය හා භික්ෂු ගරුත්වය කෙලෙසමින් මහ පාරේ භික්ෂූන් පෙළපාලි යමින් කරන ලද අශෝභන හැසිරීම හා ක්‍රියා එමටයි. නමුත් මේ කිසිම ක්‍රියාවක් ගැන මෙරට කිසිම අන්‍ය ආගමික නායකයකු හෝ සභාව විසින් හෝ එම සිද්ධීන් දඩමීමා කරගෙන බෞද්ධ දර්ශනයට හෝ බෞද්ධ භික්ෂූන්ට අපහාස උපහාස හෝ පරිභව කිසිදාක කර නැත්තේ ය.

ආගමික නායකයන් හෝ ආගමික අනුගාමිකයන් කරන වැරදි හා විනය විරෝධී ක්‍රියා ගැන කිසිම ආගමික ශාස්තෘවරයකුට හෝ එම දහමට දොස් පැවරීම හා අපහාස කිරීම ශිෂ්ට සමාජයක යුතුකම නොවන්නේ ය. මෙරට කිතුනුවන් එය හැමවිටම වටහාගෙන ඇත්තේ ය.

එහෙත් කොහේ හෝ යන වල්මත් වූවෙක් අටවාගත් සංවිධාන තුළින් කරන අමන ක්‍රියා ඉස්මතු කරගෙන මෙරට කිතුනු අනන්‍යතාවයට කරන අපහාස උපහාස චෝදනා තව දුරටත් ඉවසා සිටිය නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බව පෙනේ. මෙරට ආගමික සමඟිය හා සංහිඳියාව ඉවසා සිටිය නොහැකි හෙළ උරුමයේ සමහර භික්ෂූන් වහන්සේලා උද්ගත වන සිද්ධීන්වල කරුණු කාරණාවල යථාර්ථය හරි හැටි සොයා නොබලා කරන අසාධාරණ ප්‍රකාශන හා චෝදනා මෙරට ආගමික සමඟියට සංහිඳියාවට කරන ජාතික විනාශයකි. අගතියකි.

සිල්වත් බොහෝ නායක ස්වාමීන් වහන්සේලා මෙම අසාධාරණ, අමන ප්‍රකාශන හා චෝදනා අනුමත නොකරන බව අතිගරු ජනාධිපති තුමා ද දන්නා බව එතුමා කරන ප්‍රකාශන වලින්ම පැහැදිලි වන්නේ ය.

ශ්‍රී ලංකා රදගුරු මඬුල්ල තව දුරටත් මෙම අනර්ථකාමී අවිනිශ්චිත තත්ත්වය ඔහේ ගලා යන්නට ඉඩ දී බලා නොසිට ජනාධිපති තුමා හා සාකච්ඡා කර සත්‍ය යථාර්ථය පැහැදිලි කරගත යුතුව ඇත්තේ ය. පියතුමන්ගේ නිල ඇඳුම පිළිබඳ ප්‍රශ්නයට ද නීත්‍යානුකූල නිල ස්ථාවරයක් ලබා ගත යුතුය. සුදු ලෝගුව හා කළු බඳ පටිය පැළඳිය හැක්කේ කුමන කිතුනු සභාවල පූජකයන්ට ද යන්න නිර්වචනය කර නිල ප්‍රකාශනයක් නීති ගත කර ගත යුතුය.

අපේ කිතුනු ජනසන්නිවේදන අංශයද අවදියෙන් යුතුව සභා නායකයන් අවදි කිරීමේ කාර්ය භාරය මීට වඩා ඇඩි වගකීමෙන් හා අවබෝධයෙන් කළ යුතු කාලය පැමිණ ඇත්තේ ය. අපේ ජාතික පොදු මාධ්‍ය අංශයන් බොහෝ අවස්ථාවල අපේ කිතුනු සභා නායකයන්ගේ තනතුරු හා නම් පවා හිතාමතාම විකෘති කරන ප්‍රකාශන ද වහාම නවතා දැමීමට අපේ ජනසන්නිවේදන කාර්යාංශය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වගකිව යුත්තන්ද ක්‍රියා කළ යුතුව ඇත්තේය.

**ජෝ. සංගපාලආරච්චි**
පමුණුගම

# සැබෑ කිතුනුකම යනු සමාජ සාධාරණය සඳහා ක්‍රියා කිරීමයි

**කතුතුමනි,**

ක්‍රිස්තු අනුගාමිකයකු වන්නේ නම් සමාජ යහපත සඳහා ක්‍රියා කළ යුතුමය. සැබෑ ක්‍රිස්තු අනුගාමිකයා සත්‍යය දකියි. සත්‍යය තුළ දිවි ගෙවයි. එවැන්නා සමාජය තුළ පවතින පක්ෂ, පාට, ජාති, වර්ණ, ගෝත්‍ර, සම්ප්‍රදායන් තුළ සිර නොවෙයි. මේ සඳහා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමඟ පැහැදිලි තෝරා ගැනීමකට අපි බැඳී සිටිමු.

ජේසුස් වහන්සේ උත්ථානය මඟින් අයහපත සහ අසත්‍ය පරාජය කර අදත් අප සමඟ ජීවමානව වැඩ සිටින බව අපි විශ්වාස කරමු. එසේ නම් අප දිවි ගෙවන වත්මන් සමාජ ප්‍රවාහය තුළ මුල් බැස ඇති අයුක්තිය, අසාධාරණය, වංචාව හා දූෂණය වෙනුවෙන් ජේසුස් වහන්සේ අපට පෙන්වා දෙන දහම තුළින් සාක්ෂි දරමින් මහා දූත කාර්යයක නියැලීමට උන්වහන්සේ අපව කැඳවන සේක.

කිතුනුවන් වශයෙන් අප සමාජ අසාධාරණය ඉදිරියේ උදාසීනව නිහඬව බලා සිටින්නේ නම් අයහපත හා අසත්‍යය ජයග්‍රහණය කිරීම වැළැක්විය නොහැකිය. "සත්‍ය ඔබ නිදහස් කරයි" යනුවෙන් ශුද්ධ ලියවිල්ල තුළින් අප ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරන්නේ එහෙයිනි. එ නිසා කුමන බාධක පැමිණියත් සත්‍යයට සාක්ෂි දරමින් දේව රාජ්‍යයේ වටිනාකම් සමාජය තුළ ජීවත් කරවීමට කිතුනුවන් වශයෙන් නොපසුබටවෙමු.

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල

# චතාරික සමය ගෙවුනේ සමිඳුන් සමඟද?

**කතුතුමනි,**

**අළු බදාදායින් ඇරඹුන දින 40 ක චතාරික සමය අපි ලෞකික ජීවිතයේ සියළුම අවැසිතා දෙවෙනුව සලකා, යැදුමෙන් මර්දන ක්‍රියාවෙන් සහ පුණ්‍ය ක්‍රියාවෙන් සමිඳුන් සමඟ බැඳෙමින් උන්වහන්සේ අනුව යන්නට හොඳම සමය චතාරික සමය වේ.**

සැබවින්ම ඒ දින හතලිහ තුළදීවත් එතුමන් සමඟ ජීවත් වුණාද? නොඑසේ නම් ණය යුක්තියක් ඉටු කරනු සඳහා හෝ සුපුරුදු සිරිත් අනුව යමින් චතාරික සමය ඇල්මැරුන ගතියෙන් ගෙවා දැම්මා නම් වසරක් වසරක් පාසා උන්වහන්සේ නැවත නැවතත් කුරුසයේ ඇණ ගසනු ඇත. තවද සමහර කිතුනුවන් ස්වාමින් වහන්සේ ගේ දුක් ප්‍රාප්තියට වඩ වඩා හවුල් වීමේ අරමුණ රටට හඟවා වෙනසකට මෙන් චතාරික වන්දනා ගමන විනෝද ගමනක් කරගනී. තවද චතාරික වන්දනා ගමන්, එළිමහන් පාද නමස්කාර කොතැන සිදු කළත් සමිඳුන්ට හිමි ගෞරවය එලෙසින් ලැබිය යුතුය. එය එසේම වේද?

**පී. වී. ඩී. ලුවී මයිකල්**
කපුවාගාර




# ජනවන්දනාවේ බස පිළිබඳවයි

**කතුතුමනි,**

**ජනවන්දනාවේදී බස භාවිතය පිළිබඳව පෙබරවාරි 17 වන දා ප්‍රදීපයේ ගරු ආචාර්ය හෙන්රි සිල්වා පියතුමන් ඉදිරිපත් කළ මත දැක්වීම පිළිබඳවයි.**

මෙම විෂයයෙහිලා ගරු ආචාර්ය හෙන්රි සිල්වා පියතුමන්ගේ මඟ පෙන්වීම හෙළ බසට එකඟ, නිවැරැදි ක්‍රම වේදය බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

හෙළ බසට අනුව මධ්‍යම පුරුෂය සඳහා (අප ඉදිරියේ සිටින තැනැත්තා සඳහා) පද කිහිපයක් භාවිත කැරේ. "නුඹ, තෝ, ඔබ" ඒ පදයි. ඒ අතරින් "ඔබ" යන පදය වහලකු හෝ දාසයකු ඇමතීමට මතු නොව රාජ රාජ මහාමාත්‍යාදීන් ද, දෙවිඳුන් ද ඇමැතීමට සුදුසු උතුම් පදයක් බව කුමරතුඟු පඬිරුවන පෙන්වා දුන්නේ ය. එබැවින් අප බසේ ඉතා උතුම් පදයක් වන "ඔබ" යන්න දෙවි මහෝත්තමයාණන් ඇමතීමට ඉතා උචිතයි. එය ඉංගිරිසි බසේ You යන පොදු මධ්‍යම පුරුෂ වචනයට මුළුමනින්ම සමානය.

සර්ව පරාක්‍රම දෙවියන් වහන්සේ අසමසම හා ලෝකෝත්තර වන නමුදු උන්වහන්සේ අප හා සමඟ වෙසෙන අප පියාණන් බව ජේසු සමිඳාණෝ අපට පසක් කර දුන්හ. එවැනි දයාබර පියාණන් කෙනෙකු ප්‍රේමයෙන් ඇමතීමට "ඔබ" යන්න කෙතරම් ලයාන්විත ද? දිව්‍ය පූජාවේ එන ඇතැම් යැදුම් වලට "ඔබවහන්සේ" යන්න යොදාගත හැකි නමුදු "පරමණ්ඩල යැදුම"ට උචිත වන්නේ "ඔබ" යන පදයයි.

"ඔබ" යන පදය ගරු හෙන්රි සිල්වා පියතුමා කියන පරිදිම හෙළ බසට ආවේනික රිද්මයට ද ගැලපේ. හෙළබස කාව්‍යමය බසකි. එබැවින් යැදුමක් ද කවියක් සේ රිද්මයානුකූලව හෙළ පදම ළං කළ හැකිය. "පරමණ්ඩලය" මුලින්ම සිංහලයට නැගුවේ ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාය. නූතන පරපුරට අමතක වී ඇති මුල් පරමණ්ඩල යැදුමට ගොන්සාල්වෙස් පියතුමා "වහන්සේ" නොයෙදුවේ දෙවි මහෝත්තමයාණන්ට ගෞරවය අඩුකම නිසා නොවේ "පරමණ්ඩලයේ වැඩ සිටින අපගේ පිතාවෙනි, ඔබගේ නාමය ආරාධිත වේවා, ඔබගේ රාජ්‍යය එනු ලද්දේවා, ඔබගේ අභිප්‍රාය පරමණ්ඩලයේ සිද්ධ වෙන්නාක් මෙන් භූමියේදීත් සිදුවේවා!

ගරු මෝසැසි පෙරේරා මාහිමිපාණන් තෙහිලි ගී පරිවර්තනයේදී "ඔබ වෙති මගෙ රජිඳෝ - වෙති ඔබ මගෙ දෙවිඳෝ" යැයි නොලියා "වහන්සේ" යන්න යොදාගත්තා නම් මේ ගීය ගැයීමට හැකිවේද?

කෙසේ නමුත් "වහන්සේ" වැනි ගෞරව පද යෙදීම අත්‍යවශ්‍ය තැන් තිබේ. කිතු තුමා, දෙවි තුමා වැනි පද නොගැලපේ. ඒ වෙනුවට කිතු හිමි, දෙවි හිමි, ක්‍රිස්තුන් වහන්සේ වැනි පද අවස්ථානුකූලව භාවිත කිරීම යෝග්‍යයි.

දෙවි පියාණන් හෝ කිතු සමිඳාණන් පිළිබඳ ලිවීමේදී හෝ උන්වහන්සේ ඇමතීමේදී වඩාත් වැදගත් වන්නේ අප හා උන්වහන්සේ අතර ඇති සම්බන්ධතාවයයි. යන්න මගේ අදහසයි. අපේ භාෂාවේ පද අප යොදා ගන්නේ ඒ සම්බන්ධතාවය කෙතරම් ලබැඳිද, සමීපද යන පදනම මතය. එබැවින් ජනවන්දනා යැදුම් වලට නිසි සිංහල පද වහර ගැන ඒකමතිකභාවයකට පැමිණීමට කල එළැඹ තිබේ.

මෙම ප්‍රයත්නයේදී ශුද්ධ ලියැවිල්ල පිළිබඳ හසල දැනුමක් ඇත්තා සේම හෙළ බස් යෙදුම් ගැනද නිවැරැදිව හිතන ගරු ආචාර්ය සිල්වා පියතුමන් ඇතුළු ප්‍රාමාණිකයන්ගේ මඟ පෙන්වීම ලබාගැනීම සුදුසු වනු ඇත.

**සමන් විජේසූරිය**

# කතෝලික සභාවේ විශිෂ්ටත්වය - 01

**හැඳින්වීම**

කතෝලිකයන් වන අප, ජේසු සමිඳුන් ස්ථාපිත කළ එකම ශුද්ධවූ සභාව තුළින් බෞතිස්ම ස්නාපනය ලබා ගැනීමට තරම් අති සුවිශේෂ වරම් සම්භාරයක් දෙවියන් වහන්සේගෙන් ලබා ඇත. මෙම සත්‍යතාවය ශුද්ධවූ ජොහාන් තුමා මෙසේ සනාථ කරයි. *"බලන්න, පියාණන් වහන්සේ අපට කෙතරම් ප්‍රේම කර ඇද්ද? අපි දෙවියන් වහන්සේගේ දරුවෝ යයි කියන තමරට උන්වහන්සේ අපට ප්‍රේම කළ සේක. ඇත්තෙන්ම අපි උන්වහන්සේගේ දරුවෝම ය."* (ජොහාන් 3:1). පහත සඳහන් ප්‍රශ්න සහ පිළිතුරු මගින්, කතෝලික සභාවේ බයිබලීය සහ සාම්ප්‍රදායික පදනම ද, එහි විශිෂ්ටත්වය ද, දේව වචනය සුරැකිව එය ලොවට ප්‍රකාශ කිරීම සඳහා ශුද්ධවූ සභාව විසින් දෙන ලද නිම කළ නොහැකි අගනා දායකත්වය ගැන ද සත්‍ය කරුණු වටහා ගනිමින්, ශුභාරංචිය ලොව පුරා පතල කිරීම සඳහා ශුද්ධවූ සභා මාතාව වෙත ජේසු සමිඳුන් පැවරූ වගකීම (මතෙව් 28:18-20/ මාක් 16:15/ ලූක් 24:47-49/ ජොහාන් 20:21/ ක්‍රියා 1:8) ඉටු කිරීම වෙනුවෙන් අපගේ සම්පූර්ණ සහයෝගය දෙමින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යයේ ක්‍රියාශීලි පංගුකාරයන් වීමට අපි සියලුදෙනා අධිෂ්ඨාන කර ගනිමු.

**1. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කළේ එක් සභාවක් ද නැතහොත් සභාවන් කීපයක් ද?**

මතෙව් තුමාගේ සුවිශේෂයේ 16 පරිච්ඡේදයේ 18 වගන්තියේ සඳහන් වන පරිදි ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කළේ එක් සභාවක් පමණි.

**2. ක්‍රිස්තුන් වහන්සේගේ සභාවේ සභිකයන් කවුද?**

සභාවක හෝ සමාජයක සභිකයන් අංශ තුනකට වෙන් කළ හැකිය. එනම් i. සාමාන්‍ය සභිකයන්, ii. නිලධාරින්, iii. නායකයා. මේ අංශ තුනෙන් යුත් සභාවක් ක්‍රිස්තුන් වහන්ස් පිහිට වූ ශුද්ධ බයිබලයෙන්ම උප්පු වේ. ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයන් අතරෙන්, ඇතැමෙක් ශ්‍රාවකයන් වීම සඳහා උන්වහන්සේ විසින්ම කැඳවන ලදි. (මතෙව් 4:18-22/ මතෙව් 9:9 / ලූක් 5:1-11). මොවුන් අතරින් දොළොස් දෙනකු තෝරාගෙන ඔවුන්ට ප්‍රේරිතයෝ (හෙවත් අපෝස්තුළුවරු) යන නම තැබූහ - (ලූක් 6:12-16). මෙම දොළොස්දෙනාගේ නම් නව ගිවිසුමෙහි ග්‍රන්ථවල සඳහන් කර තිබීමෙන් පෙනෙන්නේ ඔවුන්ගේ තත්ත්වය උසස් කොට සලකන ලද බවය. (මතෙව් 10:2-4 / මාක් 3:16-19/ ලූක් 6:14-16 / ක්‍රියා 1:13). අන්‍ය ශ්‍රාවකයන් හැත්තෑ දෙනෙක් ද සිටියහ - (ලූක් 10:17. ක්‍රිස්තු අනුගාමිකයන් අතර කාන්තාවෝ ද වූහ (මාක් 15 : 40 -41 / ලූක් 8:1-3). ප්‍රේරිතයන් දොළොස් දෙනා අතරින් නායකයකු ද උන්වහන්සේ පත් කළ සේක.

**3. ක්‍රිස්තුන් වහන්සේ පත් කළ සභා නායකයා කවුද?**

ශුද්ධවූ සභාවේ නායකයා ලෙස උන්වහන්සේ සීමොන් පේදුරු පත් කළ සේක.

*"ජෝනාගේ පුත් සීමොන් .... ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. පාතාලයේ දොරටුවලට වුවද, එය පරාජය කළ නොහැකි ය. ස්වර්ග රාජ්‍යයේ යතුරු ඔබට දෙන්නෙමි. ඔබ පොළොවෙහි දී යමක් බඳින්නෙහි ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේ ය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නෙහි ද එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේ ය."* (මතෙව් 16:17-19).

**4. ක්‍රිස්තුන් වහන්සේ වදාළ (ඉහත සඳහන්) වචන වලින් හෙළිවන වැදගත් කරුණු මොනවාද?**

i. මෙවැනි ප්‍රකාශයක් කරන ලද්දේ එක් ශ්‍රාවකයකු සම්බන්ධයෙන් පමණි.

ii. උන්වහන්සේ සීමොන් නම් වූ එතුමන්ට පර්වතය යන අර්ථය ඇති "පේදුරු" යන අලුත් නමක් ද දුන් සේක. මෙම පර්වතය කෙතරම් ශක්තිමත් වන්නේ ද කිවහොත්, එය පිට ක්‍රිස්තුන් වහන්සේ ගොඩනගන ශුද්ධවූ සභාව පරාජය කිරීමට මනුෂ්‍යයන් නිත්‍ය මරණයට පත් කළ හැකි බලවේගයන්ටවත් නොහැකි වන්නේ ය.

iii. *"ස්වර්ගයෙහි යතුරු ඔබට දෙන්නෙමි"* - මනුෂ්‍යයන් ස්වර්ගයට ගෙන යෑම සම්බන්ධයෙන් අසහාය වගකීමකුත් බලයකුත් මේ වචන වලින් පේදුරුතුමන්ට පැවරේ.

iv. *"ඔබ පොළොවෙහි දී යමක් බඳින්නෙහි ද.... මුදන්නෙහි ද..."* - මෙම වචන වලින් පේදුරු තුමන්ගේ ආගමික පාලන බලය වඩාත් තහවුරු වන අතර, එය ක්‍රියාත්මක වීමේදී එතුමාට නොමඟ යාමට ඉඩ නොතිබෙන බව ද ප්‍රකාශ වේ. මෙලොවෙහි දී බඳින හෝ මුදන කිසිවක් ස්වර්ගයේ අනුමත වන්නට නම්, එය නිවැරදි විය යුතුය. එබැවින් බඳින හෝ මුදන බලය භාවිත කිරීමේදී පේදුරු තුමන්ට වරදින්නට දෙවියන් වහන්සේ ඉඩ නොදෙන සේක. එනම්, එතුමාට තම ලෝකෝත්තර කාර්යය සම්බන්ධයෙන් නොවරදින සුළු බවක් ලැබෙන්නේ ය.

**5. ක්‍රිස්තුන් වහන්සේ පේදුරු තුමන්ගේ නායකත්වය ස්නාථ කරන අනිකුත් අවස්ථාවන් නම් කරන්න.**

1. *"සීමොන්, සීමොන්.... ඔබේ සහෝදරයන් ධෛර්යවත් කරන්නැ"* (ලූක් 22:31-32).

*2. "...සීමොන්, මොවුන්ට වඩා ඔබ මට ප්‍රේම කරන්නෙහිද?.... මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්නැ.... මාගේ බැටළුවන්ගේ එඬේරා වෙන්නැ.... මාගේ බැටළුවන් පෝෂණය කරන්නැ"* (ජොහාන් 21:15-17). (ඉහත සඳහන් ප්‍රකාශයන් කරන ලද්දේ පේදුරු තුමන් වෙත පමණි.)

**ලබන සතියට....**

**වික්ටර් සිල්වා**

# සා. පීතර ගම්පහ හා උ

# පාසල් ඉතිහාස

පෘතුගීසි සමයේ දී මිෂනාරී පූජා ප්‍රසාදිවරුන් විසින් ආරම්භ කරන ලද දේශීය කතෝලික පාසල් වලින් 1960 දී ගෙන එන ලද පාසල් රජයට පවරා ගැනීමේ විධි විධාන යටතේ ඉතිරි වූයේ පාසල් කිහිපයක් පමණි. ඒ අතර සභා මාතාව යටතේ ඉතිරි වූ එක් පාසලක් වූයේ බම්බලපිටිය සා. පීතර විද්‍යාලයයි. මෙසේ දේශය තුළ විරාජමානව පැවති කතෝලික පාසල් දීප ව්‍යාප්ත කිරීමේ අඩිතාලම මූලික බීජයක් ලෙස එවකට කොළඹ පදවි සහයක එඬේරාණන් වූ අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ගේ හදවතේ රෝපණය වූ අතර එවකට උසස් අධ්‍යාපන ඇමති ව සිටි ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ අනුමැතිය මත පදවි එඬේරාණන් වූ අගරදගුරු අති උතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ආශිර්වාදයෙන් ඇරඹීමට මුල් පියවර තැබිණි.

මෙම බාරදූර කාර්යය කිරීමට එවකට පැවති කතෝලික පාසල් වලට ආරාධනා කළ අතර එහි වගකීම මැනවින් වටහා ගත් එවකට සා. පීතර විද්‍යාලයේ අදියුරු පියව වැඩසිටි දුරදක්නා නුවණින් යුත් ස්වර්ගස්ථ අතිගරු ජෝ. ඊ. වික්‍රමසිංහ පියතුමා නොපැකිළව එම කාර්යය සාක්ෂාත් කර ගැනීමට මුල් අඩිතාලම යොදන ලදි. ඒ අනුව කොළඹ පැවති උසස් යැයි සම්මත පාසල් වල පසුබිමින් යුත් පාසල් සංකල්පයක් ශාඛා පාසල් ගමට ගෙන යාමේ පළමු ප්‍රයත්නය ලෙස සා.පීතර විද්‍යාලයේ ශාඛා පාසල ලෙසත් 1993 පෙබරවාරි මස 02 වන දින හිටපු සහයක රදගුරු තැන්පත් අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් අතින් ආසිරි ගන්වා කතෝලික දරුවන්ගේ අධ්‍යාපනය උදෙසා පවරා දෙන ලදි.

එවකට සා. පීතර විද්‍යාලයේ අධ්‍යාපනය බාරව මෙන්ම පාසලේ භෞතික විද්‍යා ගුරුවරයා ලෙස කටයුතු කළ මනා කළමණාකාරිත්ව දැනුමකින් යුත් තිලක් රුද්‍රිගු මැතිතුමා පළමු ශාඛා විදුහල්පති ලෙසත් දීපිකා පීරිස් ගුරුමව සහ සරෝජිනී පෙරේරා ගුරුමව යන ගුරුභවතුන් දෙදෙනෙකු යටතේ සිසුන් 46 දෙනෙකුගෙන් සා.පීතර ගම්පහ ශාඛාව ගම්පහ පුරවරයේ ගල් පල්ලිය නමින් ප්‍රසිද්ධ සිරි කුරුස දේවස්ථානය අසල ඉතා කුඩා භූමි භාගයේ තෙමහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිරියට ගොඩනැගීමේ අරමුණින් මෙසේ ආරම්භ විය.

ශිෂ්‍යයින් 46 දෙදෙනෙකුගෙන් ආරම්භ වූ සා.පීතරයේ ශිෂ්‍ය සංඛ්‍යාව 1994 වර්ෂයේදී 87 දෙනෙකු බවට පත් වූ අතර ගුරු මණ්ඩලය ද 06 දෙනෙකු දක්වා වර්ධනය විය. මෙම සිසුන් 87 දෙනාගෙන් සිසුන් 22 දෙනෙකුම වාර්ෂික ත්‍යාග ප්‍රදාන උළෙලේ ත්‍යාගලාභීන් බවට පත්වීම පාසල ලැබූ විශිෂ්ඨ ජයග්‍රහණයකි. එමෙන්ම ජෝ ඊ. වික්‍රමසිංහ හිමිපාණන් විසින් පරිත්‍යාග කරන ලද ක්‍රීඩා භාණ්ඩ කිහිපයක් උපයෝගී කරගෙන ජූඩ් වැලන්ටයින් පෙරේරා ගුරුමහතාගේ අධීක්ෂණය හා පුහුණුකරු පුෂ්ප ගුණතිලක මහතාගේ මගපෙන්වීම යටතේ කණිෂ්ඨ ක්‍රිකට් කණ්ඩායමක් ආරම්භ කරන ලදි.

1994 වර්ෂයේදී නව පාසල් එඬේරාණන් ලෙස පත්ව ආ ගරු. ෆිලීෂියන් රංජිත් පෙරේරා පියතුමා ඉදිරියේ 1994 ඔක්තෝම්බර් 20 දින දිවුරුම් දුන් සිසුන් 09 දෙනෙකුගෙ න් සා. පීතර ගම්පහ ශාඛාවේ කණිෂ්ඨ ශිෂ්‍ය නායක කණ්ඩායම ආරම්භ විය. එමෙන්ම දරුවන්ගේ නිසඟ කලා කුසලතා හා සාහිත්‍යමය හැකියාවන් ඔප් නැංවීමේ අරමුණින් 1994 නොවැම්බර් මස 17 වන දින දීපිකා පෙරේරා ගුරුමහත්මියගේ හා අර්වින් ගුණවර්ධන ගුරුමහතාගේ අනුශාසකත්වයෙන් සිංහල සාහිත්‍ය සංගමයක් ආරම්භ කළ අතර එය 1994 ඉල් මස 09 වන දින ශාඛා පාසල ප්‍රථම වරට බැහැදැකීමට පැමිණි අදියුරු පිය ෆිලීෂියන් රංජිත් පියතුමාගේ පූර්ණ මඟ පෙන්වීම යටතේ සිදු වූවකි.

එමෙන්ම 1993 ජුනි මස 06 වන දින පාසල් සංවර්ධන සමිතියේ දෙමව්පියන් විසින් සංවිධානය කරන ලද කොඩි දිනය මඟින් එකතුකර ගත් මුදලින් පාසලේ පුස්තකාලය ආරම්භ කිරීමද පාසල ලද විශාල ජයග්‍රහණයකි. 1994 නොවැම්බර් මස 23 වන දින කණිෂ්ඨ පුස්ථකාල සංගමය හා විද්‍යා සංගමය ආරම්භ කරන ලද අතර 1995 ජූලි මස 04 වන දින නව ගොඩනැගිල්ලේ තවත් පංති කාමර 02ක් කොළඹ අග රදගුරු අති උතුම් නික්ලස් මාකස් හිමිපාණන් විසින් ආශිර්වාද කර සිසු අයිතියට පැවරීම තවත් ජයග්‍රහණයකි. එමෙන්ම එතෙක් පාසලට අඩුපාඩුවක් ව පැවති පෙරදිග තූර්ය වාදක කණ්ඩායමද සුසන්ත දිසානායක ගුරුමහතාගේ හා ගීතිකා හේමනායක ගුරුමහත්මියගේ මඟපෙන්වීම යටතේ ආරම්භ කරන ලදි. ශාඛා පාසලට වසර 05ක් පිරෙද්දී සිසුන් 238ක් සහ 06 සිට 11 ශ්‍රේණිය දක්වා පන්ති මට්ටමින්ද සිසුන් ප්‍රමාණයෙන්ද විශාල දියුණුවක් ලබා සිටි විදුහල ගුරුභවතුන් 12 දෙනෙකුගෙන් සමන්විත වීම විශේෂත්වයක් වන අතර මෙම වකවානුවේ දීම පාරිසරික සංගමයක් හා සෞඛ්‍ය සංගමයක් ආරම්භ කිරීම ද වැදගත්ය. 1998 වර්ෂය සා. පීතර ශාඛා පාසලට විශේෂයෙන්ම වැදගත් වර්ෂයකි. එනම් ප්‍රථම







උඩුගම්පොල ඉදි වූ නව පාසල



විද්‍යාලයේ නිර්මාතෘ, ස්වර්ගස්ථ **අතිගරු ජෝ. ඊ. වික්‍රමසිංහ පියතුමා**

වතාවට පැහැසර නමින් සිංහල සාහිත්‍යය සංගමය මඟින් කලා උළෙලක් සංවිධානය කිරීමත් ප්‍රථම වරට සා. පීතර ශාඛා පාසලේ සිසුන් අ. පො. ස. සා/පෙළ විභාගයට පෙනී සිටීමයි. මෙම අ. පො. ස. සා/පෙළ විභාගයේ විශේෂත්වය වූයේ රෝමානු කතෝලික ධර්මය, සිංහල, සමාජ අධ්‍යයනය හා සංගීතය යන විෂයන් 100% ප්‍රමාණයටම සමත් වීමත් පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 91% අපොස උ/පෙළ සඳහා සුදුසුකම් ලැබීමත් ය.

2001 වර්ෂයේ දී බස්නාහිර පළාත් තරඟාවලියෙන් ජය ගත් කණිෂ්ඨ පෙරදිග කණ්ඩායම එම අංශයේ සේ ගී තරඟාවලියේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමත් 2002 වර්ෂයේ පී. සදීශ ප්‍රනාන්දු සිසුවා සමස්ථ ලංකා සමාජ අධ්‍යයනය තරඟාවලියේ 2 වන ස්ථානය දිනා ගැනීමත් කැපී පෙනෙන්නකි. එමෙන්ම 1998 වර්ෂයේ දී මහාචාර්ය ජනසිරි බෝධිනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විද්‍යා දිනයක් ප්‍රථම වතාවට පැවැත් වූ අතර 2002 වර්ෂයේදී ආරම්භ කරන ලද බැඩ්මින්ටන් ක්‍රීඩාවෙන් වයස අවු. 15න් පහළ ඊ ශ්‍රේණියේ ශූරතාවය දිනා ගැනීමෙන් අද දක්වා එම ක්ෂේත්‍රයේ ජයග්‍රහණයන්ට අඩිතාලම දමන ලදි. 2003 වර්ෂයේදී නවලෝක පිහිනුම් සංකීර්ණයේ පැවති අන්තර් නිවාස පිහිනුම් තරඟාවලියත් පිහිනුම් අංශයේ ද කැපී පෙනෙන ප්‍රවනතාවයක් දක්වා ඇත.

2003.06.13 දින එනම් ශු. අන්තෝනි මුනින්ද්‍රයාගේ මංගල්‍ය දින ප්‍රථම වරට ආරම්භ කරන ලද අ.පො.ස. උ/පෙළ කලා හා වාණිජ අංශ මැතිව් බර්නාඩ් ගුරු මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූ අතර එය පාසලේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුළුල් වීම සනිටුහන් කරන්නකි. 2002 වර්ෂයේ පාසල බාර ගුරු පියතුමා ලෙස සිරි කුරේ

ගෝමිස් හිමිපා
අධ්‍යක්ෂ ගරු ෆි
පාසල බාර ගර
ශාඛාවේ විදුහල
හා මගපෙන්වීම
2004 ඔක්තෝම්
ගෝමිස් හිමිපා
කිරීම පාසල් ග

එසේ උඩුගම්පො
නව ශාඛාවේ වි
ආරම්භ කල ම
කාලයේදී ප්‍රථම
මුහුණ දුන් සිසු
ස්ථානය දිනාග
කළමණාකරණ
විද්‍යාලයට තේ
ලිප්ටින් (ශක්ති
සහභාගි වූ පා
දිනා ගැනීමත් 

කලා සංග්‍රහය

# නව බිතු කැටයමින් අල්තාර පසුබිම සැකසේ



බගවන් තලාව ශුද්ධවූ ජපමාලයේ මාතාවන්ගේ දේවස්ථානයේ නව අල්තාර බිතු කැටයම එම දේවස්ථානය බාර ගරු එඩ්වින් රැද්‍රිගෝ පියතුමන් විසින් පසුගියදා විවෘත කරන ලදි. ශ්‍රී ලාංකීය බිතු කැටයම් කලාවේ නව මං පෙත් විවර කළ කිතුනු කලාකරුවකු වන ජූඩ් ජේ. ප්‍රනාන්දු මහතා අතින් නිමැවී තිබිණි.

# මහ සිකුරාදා පාද නමස්කාරය



තිඹිරිගස්යාය සා. තෙරේසා දේවස්ථානයේ මහ සිකුරාදා දින පාද නමස්කාරය සංවිධානය කරනු ලැබුවේ මීසමේ තරුණ ශිෂ්‍ය ව්‍යාපාර සෛලය මගිනි. මීසම් සේවක ගරු රොහාන් පෙරේරා (දි.ගැ.නි.) පියතුමාගේ අධීක්ෂණය යටතේ ගරු සුරේෂ් කැලුම් (දි.ගැ.නි.) පියතුමාගේ මෙහෙයවීමෙන් පැවැත් වූ එළිමහන් පාද නමස්කාරය සඳහා මීසමේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි සංසයන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයත් දක්නට ලැබුණි. - **සරෝජිනී පෙරේරා**



ප්‍රවීන පරිවර්තක, ලේඛක හා ප්‍රදීප ලේඛකයකු වූ සිසිල් රුද්‍රිගු සිය තිස්පස්වන සිංහල පරිවර්තනය වන "අභ්‍යවකාශය සහ අමරණීය ජීවිතය" ග්‍රන්ථයේ ප්‍රථම පිටපත හිටපු හමුදා ජනරාල් සරත් ෆොන්සේකා මහතාට පිළිගැන්වූ අවස්ථාව

**ප්‍රදීපය කෙටි කතාව**

# ආයෝජනයක්

"හා.... නේ මේ අපේ ජයදාස මහත්තය නේද?"

"ඔව් ඔව් නෝනා කවුද....?"

"ඇයි අඳුනන්න බැරිද..... අමරසිංහ මහත්තයගෙ..."

"හරි හරි.... මෙලෝ දෙයක් මතක නෑ දැන්.... වයසට ගියාම..."

"මාත් කල්පනා කළේ එකපාරටම මොකද උනේ කියලා.... හොඳට හිටියනෙ...."

"ඒක ඉතින් මෙහෙම කියන්න පුළුවන් කතාවක් නෙමෙයි...

අවුරුදු තිස් අටක් තිස්සෙ මොන දුකක් වින්දද... මැරි මැරි ඉපදුනා... අන්තිමෙට දෙන්න තියෙන පාරිතෝෂික දුන්නෙත් නෑ...."

"ලංගම ගැන නම් කියල වැඩක් නෑ... පාරිතෝෂිකේ ගන්න හුඟ දෙනෙක් නඩු කියනවලු නේද... උද්ඝෝෂණත් කෙරුවනෙ... අපේ මහත්තය නම් ඒ කරදරෙන් බේරුණා...."

"ඒත් ඉතින්....."

මොන කරදරයකින් බේරුණත් තමන් සමඟ එක වහල යට වැඩ කළ අමරසිංහ මහත්තයාට අත් වූ ඉරණම ගැන ජයදාස තුළ ඇත්තේ ඉමහත් අනුකම්පාවකි. එයට හේතුව කිසිවකු නොසිතූ අයුරින් ඔහු මානසික රෝගියකු බවට පත්වීමය. වසරාවසානයේ දී සිදුවන ලෝකාන්තිමය ගැන නිතර කියන්නට වූ අමරසිංහ මහත්තයාගේ රෝගය දිනෙන් දිනම බරපතල වනු කාටත් දැක ගත හැකි විය. ගෙදර වියදමට ඔරොත්තු නොදෙන පඩිපත නිසා මහත් සේ පීඩාවට පත් වී සිටි ඔහුට ලෝකාන්තිමය පෙනි පෙනී තවත් දුක් විඳින්නේ මොකටදැයි සිතී තිබුණි. ඔහු වටකරගෙන සිටි ඇතැමුන්ගෙන් සිදුවූයේ ඔහුව තව තවත් ප්‍රපාතයටම ඇද දැමීමකට වඩා වැඩි දෙයක් නොවේ.

"එතකොට අමරෙ මේදා සැරේ ලෝකාන්තිමය සිද්ධ වෙන්නෙ කොහොමද, ජලයෙන් ද? ගින්නෙන් ද?

අනේ මේක නම් විහිළුවකට ගන්න එපා... මේ බොරුවට කොළ පුරවන්නත් එපා... මේ මුකුත් කරල වැඩක් නෑ... කරන්න තියෙන්නෙ පුළුවන් තරම් සංතෝසෙන් ජීවත් වෙන එකයි....කෝ ඉතින් මේකට මේ යක්කු අපිට මුකුත් දෙන්නෙ නෑ. පඩි වැඩි කරනව කිව්වට වැඩිවෙච්ච පඩියකුත් නෑ. අපි ජීවත්වෙන්නෙ කොහොමද කියල දන්නෙ අපි විතරයි. දෙන්න තියෙන දෙයක් ලෝකාන්තිමෙට කලින් දුන්නම ඉවරයිනෙ..."

අසනීපය කොතරම් උග්‍ර අතට හැරුණු නමුදු අමරසිංහ මහත්තයා වැඩට නොපැමිණි දවසක් නැත. ඒ අනෙකක් නිසා නොව සෑම සති අන්තයකම ගෙවූ පැමිණීමේ ප්‍රසාද දීමනාව නිසාය. පෝලිමේ මුලින්ම සිට එම දීමනාව ලබා ගන්නා ඔහු අන් අය මෙන් එය රැගෙන කැන්ටිම වෙත ගිය දවසක් දැක ගත හැකි නොවීය. උදෑසන වැඩට එන විට බත් පත බැඳ ගෙන ඒමට නොහැකි වූ දිනක දී වුවද කුසගින්නේ සිටි ඔහු කැන්ටිමට ගියේ නැත. එවන් දිනක ඔහුගේ බත්පත ගෙන එන ඔහුගේ බිරිඳ එය ඔහු වෙතටම දී යන අයුරු ජයදාසට හුරු පුරුදු දසුනක් විය. ඇය අමරසිංහ මහත්තයාටත් වඩා වැහැරුණු පෙනුමකින් යුක්ත වූයේ ඔවුන්ගේ නිවස අගහිඟකම් වලින් අඩුවක් නැති මිහිපිට අපායක් වූ බැවිනි.

එහෙත් දිගු කලකට පසු ඇයව මුණ ගැහුණු විට දී ජයදාසට දෙනෙත් අදහාගත නොහැකි වූයේ කිසිවකුටත් සිතාගන්නට බැරි තරමට ඇය මුළුමනින්ම නාඹර යුවතියක් බවට පත් වී ඇති බැවිනි. ඇය සැරසී සිටියේ ද ඊටම ගැලපෙන ඇඳුම් කට්ටලයකිනි. කලකට පෙර තැනින් තැන සුදුවී එහෙන් මෙහෙන් හැලී ගොස් තිබූ ඇගේ කෙස් වැටිය ද මනාව සකසා ගානට කපා පිටුපසට රැළි ගන්වා ඇත. එක්කෝ ඇය එතෙර ගොස් පැමිණියා විය යුතුය. නැතිනම් අමරසිංහ මහතාව අතහැර දා පෝසතකු සමඟ ජීවත් වෙනවා විය යුතු යැයි ජයදාසට සිතුණි.

වසරාවසානය ළං වෙත්ම අමරසිංහ මහත්තයාට නොකර නොහැකි වූ රැකියාව කර ගැනීමට නොහැකි වන අයුරින් ඔහුගේ රෝගය උත්සන්න වූයේ ඔහුව කබලෙන් ලිපට හෙළා දමමිනි. ලෝකාන්තිමයට පෙර තමන් හට හිමි මුදල් ලබා දෙන ලෙස පෙරළි කරන්නට වූ ඔහුගේ ක්‍රියා කලාපය දුටු සියල්ලෝම ඔහුට අනුකම්පා කරන්නට වූහ. කිසිදා කිසිවකුට අනුකම්පාවක් නොදක්වන ආයතන ප්‍රධානියා තුළ ද ඔහු කෙරේ ඇති වූයේ ඉමහත් දයානුකම්පාවකි. සේවයට නුසුදුසු බවට නිර්දේශ කරවාගෙන වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමට සියලු කටයුතු සලසා දුන් ආයතන ප්‍රධානියා ඔහුට අවශ්‍ය ප්‍රතිකාර ගැනීමට සැලකිය යුතු මුදලක් ද පරිත්‍යාග කළේ සියල්ලන් විමතියට පත් කරමිනි.

"කොහොමද අමරසිංහ මහත්තයට දැන්... අස්වෙලා ගියා ගියාමයි ඇහැට දැක්කෙ නෑ..."

"ඉන්නව... ඉන්නව...."

"දැන් සනීපෙන් ද...."

"අනේ මොන අසනීපයක්වත් නෑ.... දැන් කොහේවත් යන්න වේලාවක් නෑ. අපේ පුතා දැම්මනෙ ටුවරිස් හොටෙල් එකක්.... එතන මැනේජර් අපේ මහත්තයා...."

එසේ වූයේ කෙසේදැයි සිතා ගැනීමට ජයදාසට කිසිසේත් නොහැකි විය. සේවයට නුසුදුසු බවට නිර්දේශ කරන ලද වෛද්‍ය වාර්තාවත් රැගෙන ඔහු අවසන් වරට වැඩපළට පැමිණියේ දරුවන් දෙදෙනාගේත් බිරිඳගේත් වාරුවෙනි. ඒ අනුව විශ්‍රාම ගන්වන ලද ඔහුට හිමි විය යුතු හිමිකම් සියල්ල ලබා දීමට නොපමාවම පියවර ගැනුණි. අන් කිසිවකුට ලබා ගත නොහැකි වූ පාරිතෝෂිත දීමනාව ද ඔහුට එකවරම ලබා ගත හැකි වූයේ කිසිදු ප්‍රමාදයකින් තොරවය. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදලට අමතරව ජයදාසගේ මැදහත්කමින් සියළුම සේවකයින්ගෙන් එක් රැස් කරගත් තෑගි මුදල ද ඔහුට ප්‍රදානය කෙරිනි. එහෙත් ඒ කිසිවකින් ප්‍රකෘති තත්ත්වයට පත් වන්නට ඔහුට හැකිවෙතැයි සිතූ කෙනෙක් නැත.

"එහෙම නම් ලොකු දෙයක්.... වෙනවයි කිව්ව ලෝකාන්තිමේ උනෙත් නෑනෙ..."

"මොන පිස්සු ලෝකාන්තිමයක් ද ජයදාස මහත්තය... එය කවුරුත් කියන විධියට ලෝකෙ අන්තිමෙ වෙන්නේ නෑ. ඒත් ඒ ලෝකාන්තිම නාඩගම නාවානම් මෙලහකට අපේ පවුලටම ලෝක අන්තිම වෙලා. ඕගොල්ලන්ගෙ මනුස්සකමට පිං සිද්ධ වෙන්න අපි ඒ ලෝකාන්තිමෙන් බේරුණා..."

අමරසිංහ මහත්තයාගේ බිරිඳට කතාව අවසන් කරන්නට ඉඩ නොතබමින් සුඛෝපභෝගි කාරයක් පදවාගෙන පැමිණි ඇගේ ලොකු පුතාගේ ඇමතුමෙන් ඇයට තවත් පමා වෙන්නට නොහැකි විය. ඔවුන්ගේ ලිපිනය සඳහන් කාඩ්පතක් බෑගයෙන් රැගෙන ජයදාස අත තැබූ ඇය, කාරයේ නැගී යන දෙස බලා සිටි ඔහු තුළ ඇති වූයේ නිම් හිම් නැති සතුටකි. අමරසිංහ මහත්තයා රටට ඕනෑ කරන තවත් ආයෝජකයකු බවට පත් වී තිබේ. එහෙත් තමන් හට එසේ නැතත් හුස්ම ටිකක් ගෙන ජීවත් වන්නට හැකිවන දවසක සේයාවක් වත් ජයදාසට නැත.

**පස්කල් ජයමාන්න**
උස්වැටකෙයියාව

# ළමා ලේඛක වැඩමුළු 50 ක් මෙහෙයවයි



දංකොටුව , ගෝනවිල මීසමේ කිරාගාර ශාන්ත අන්තෝනි දෙව්මැඳුරේ එළඹෙන ස්වර්ණ ජයන්තිය නිමිති කර ගෙන, ළමා ලේඛක වැඩසටහනක් සිල්වෙස්ටර් පිය දහම් ශාලාවේදී පසුගියදා පැවැත්විණි. බෝලවත්ත දිසානායක හා ගෝනවිල මීසම් සේවක ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමාගේ මඟ පෙන්වීම යටතේ දහම් පාසල් ප්‍රධානි ජයවර්ධන මහතා ඇතුළු දහම් ගුරු මණ්ඩලය විසින් මෙය සංවිධානය කරන ලදි. "ළමා ප්‍රදීපය සහ ඥානාර්ථ ප්‍රදීපය" සහය සංස්කාරක කුමර නයනජිත් මහතා මෙම වැඩමුළුව මෙහෙයවිය. ළමා ලේඛක, යොවුන් වැඩමුළු, ජනසන්නිවේදන හා පුවත්පත් කලාව, ජීවිතාවබෝධ, ශිෂ්‍ය නායක ඇතුළු වැඩමුළු 75 ක් කොළඹ, හලාවත, අනුරාධපුරය, කුරුණෑගල, බදුල්ල, මහනුවර, රත්නපුර යන පදවිවල පවත්වා ඇති කුමර නයනජිත් මහතාගේ 50 වන ළමා ලේඛක වැඩමුළුව මෙදිනට යෙදී තිබීම ද විශේෂත්වයකි. එම අවස්ථාව සැමරීමට කිරාගාර ශාන්ත අන්තෝනි දහම් පාසලේ ගුරු මණ්ඩලය කටයුතු කර තිබිණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **(ඩබ්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු)**

# ඒත්තුකාල එළිමහන් පාස්කු සංදර්ශනය

මීගමුව ඒත්තුකාල, සාන්ත සිල්වෙස්ටර් දෙව්මැඳුර, මීසම් වාසීන් විසින් සතරවන වරටත් සංවිධානය කරන ලද එළිමහන් පාස්කු සංදර්ශනය 2013 මහ සිකුරාදා දින රඟ දක්වන ලදි. මීසම් සේවක ගරු ටෙරන්ස් බෝදියාබදුගේ පියතුමා හා සහයක ගරු ක්‍රිස්ටෝපර් ප්‍රසාද් පියතුමාගේ ද සහය ඇතිව ජේසු සමිඳු දුක්ප්‍රාප්තිය හා කුරුසියේ මරණය වේදිකා ගත කරන ලදි. ද්‍රවිඩ හා සිංහල බසින් දේශනා ඉදිරිපත් කැරිණි. මේ සඳහා ගරු ඇලෙක්ස් පියතුමන්ගේ සහයද ලැබිණි. මෙම පාස්කු සංදර්ශනය සඳහා කලාකරුවන්ගේ කැපවීම ඉහළින්ම අගය කැරිණි.

**(සිල්වෙස්ටර් කැනිසියස් ප්‍රනාන්දු)**



# ජාත්‍යන්තර පාසලින් අවුරුදු උත්සවයක්



මීගමුව සා. නිකලස් ජාත්‍යන්තර පාසලේ ප්‍රාථමික අංශයේ සිසු දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් ප්‍රථම වතාවට සංවිධානය කළ අලුත් අවුරුදු උත්සවයක් ප්‍රවීන ටෙලිනාට්‍ය නිලි මොරින් චාරුනි මහත්මියගේ ප්‍රධානත්වයෙන්, ගරු ජූඩ් නිකලස් පියතුමන්ගේ හා ගරු මාරි ගැලිට් පැවිදි සොයුරියගේ විශේෂ සහභාගිත්වයෙන් පසුගියදා විදුහල් ක්‍රීඩාංගනයේදී සිදුකෙරිණි. එදින ආරාධිත අමුත්තන් දරු දැරියන් විසින් පිළිගෙන පෙරහරින් කැඳවාගෙන පැමිණි අයුරු...

**(ඇන්ටන් ජයසූරිය)**

# කොප්ටික් ඔතඩොක්ස් ආසන දෙව්මැඳුර සටන් බිමක් වී

අප්‍රියෙල් මස 07 වෙනි ඉරුදින ඊජිප්තුවේ කයිරෝ හි පිහිටි කොප්ටික් ඔතඩොක්ස් ආසන දෙව්මැඳුරේ දිව්‍ය යාගය පැවැතියේ දින කීපයකට ඉහත දී ඉස්ලාම් ත්‍රස්තයන් විසින් ඝාතනය කරනු ලැබූ කිතුනුවන් සතර දෙනාගේ ආත්මයන් වෙනුවෙනි.

දිව්‍ය යාගයේ අවසන් කොටස සිදුවෙද්දී දෙව්මැඳුරට පහර දීම ඇති විය. ගල් මුගුරු හා අත්බෝම්බ වලින් පහර දුන් කණ්ඩායම විශාල පිරිසක් විය. පිටතින් කඩා වැදුනු කිතුනුවෝ ද ප්‍රති පහර දෙන්නට පටන් ගත්හ. දිගු වේලාවක් දෙපාර්ශ්වය අතර පැවැති පහරදීම හේතු කොටගෙන එක් අයෙකු මරුමුවට පත්ව 80 වකට වැඩි පිරිසක් දරුණු තුවාල ලදහ. පොලිස් නිළධාරින් 11 දෙනෙක් ද තුවාල ලදහ. පොලීසිය විසින් කඳුළු ගෑස් යොමු කළත්, තත්ත්වය සමනය කෙරුමට පැය කීපයක් ගත විය.

තවද උතුරු කයිරෝවේ එල් කුයෙස් යන ප්‍රදේශයේ ඇත්තාවූ තවත් කොප්ටික් දෙව්මැඳුරකට ද පහර දී ඇත. එහිදී ඉස්ලාම් හා කිතුනු කොටස් දෙක අතර වෙඩි හුවමාරුවක් ද සිදු වී තිබේ. එම ගැටුමෙන් කිතුනුවන් සතර දෙනෙක් ද ඉස්ලාම් බැතිමතෙක් ද මිය ගොස් තවත් 12 දෙනෙක් තුවාල ලබා සිටිති. කිතුනුවෝ ද කෑ මොර දෙමින් වීථි සිසාරා විරෝධය පෑහ. ඔවුන් දරා සිටි බැනර්වල "අපේ ලේ පූජාවෙන් කුරුසිය දරා සිටින්නෙමු" යනුවෙන් දැක්විණි. තවද කිතුනු පීඩා නවත්වන්නැයි මොහොමද් මුර්ෂි ජනපති හා "මුස්ලිම් සහෝදරත්වය" නම් දේශපාලන පක්ෂයෙන් ඉල්ලමින් කිතුනුවෝ කෑ මොර දුන්හ. මුස්ලිම්වරුන් මෙන්මැ කොප්ටික් කිතුනු ඇදහිලි වන්තයන් ද දරුණු අන්දමින් හැසිරුනු බැව් ජාත්‍යන්තර පුවත් විසින් වාර්තා කරත. එසේ වුවද මධ්‍යස්ථ මතධාරී මුස්ලිම් නායක පිරිසක් කිතුනුවන් වෙත සහෝදරත්වය හුවා දක්වමින් ඝාතනය කරනු ලැබූ කිතුනුවන් හට අවසන් ගෞරවය දැක්වීමට පැමිණි බැව් ද වාර්තා වේ. පසුගිය වසරේ ජුනි මාසයේ දී බලයට පැමිණි මොහොමද් මුර්ෂි ජනපති විසින් කොප්ටික් කිතුනුවන්ට එල්ල වන පීඩා නවතා ලන බවට පොරොන්දු වී ඇතත් එම පීඩාවන්ගේ අඩුවක් නම් තවමැ අත් නොදකිනු ලබයි. ඊජිප්තුවේ ජනගහනය මිලියන 84 වන අතර කිතුනු ජනතාව ඉන් සියයට දහයක් පමණ වේ.

## බැන්කි මූන් ප්‍රැන්සිස් සසුනිසුරාණන් හමුවේ

එක්සත් ජාතින්ගේ සංගමයේ මහා ලේකම් අප්‍රියෙල් මස 09 වැනිදා වතිකානයේ අපෝස්තලික මාලිගාවේ දී අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන් මුණ ගැසුණේය.

එතුමා විසින් ප්‍රථමයෙන්මැ සසුනිසුරාණන් වෙත ප්‍රකාශ කරනු ලැබුවේ කතෝලික සභාව විසින් ලෝක සාමය ද මිනිස් වර්ගයාගේ යහපත ද මූලික මිනිස් අයිතිවාසිකම් ද සුරැකීම සඳහා ලබා දෙනු ලබන දායකත්වය එක්සත් ජාතීන්ගේ සංගමය මහා ඉහලින් අගයන බවයි. එම අරමුණු සාක්ෂාත් කරගැන්ම සඳහා ඉදිරි පස් අවුරුදු ක්‍රියාකාරීත්වයන් අළලා ඵලදායී සාකච්ඡාවක් කරතැයි ද වාර්තා වේ.

ගැටුම් වලට තුඩු දෙමින් සිරියාව, කොරියානු දේශ හා අප්‍රිකාව ආදී රටවලැ පවත්නා යුධ වාදී වාතාවරණයන් සංහිඳියා පැවැත්මක් කරගෙන යාමේ මං පෙත් පිළිබඳව ද සාකච්ඡා කරන ලදි.

විශේෂයෙන් දිළිඳු බවේ වහලුන් බවට පත්ව සිටිනා වනිතාවන් හා දරුවන් ගේ විමුක්තිය උදෙසා එක්සත් ජාතින්ගේ සංගමය යටතේ පවත්නා අනෙකුත් ලෝක සංවිධානයන් විසින් නොතිත් ක්‍රියාකාරකම් පවත්වාගෙන යා යුතු යයි ද අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන් විසින් අවධාරණය කරනු ලැබ ඇත.

අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන් හා පැවැති සාකච්ඡාව ගැන සිය අදහස් බැන්කි මූන් විසින් මෙලෙසින් දක්වා ඇත. "ප්‍රැන්සිස් සසුනිසුරාණන් මුණ ගැසීම පවත්නා ලෝක තත්ත්වය හමුවේ බලාපොරොත්තුව හා දිරිය වඩවන්නක් විය. එතුමා සැබැවින්මැ හඬක් නොමැති ජනතාවගේ හඬකි.

විශේෂයෙන් ලෝකයේ දුප්පත් ජනතාවන්ගේ විමුක්තිය සහ ලෝක සාමය සඳහා එතුමා දරන්නා වූ අදහස් සක්‍රීය කරවීම සඳහා එතුමා දක්වන මෙහෙයුම අතිශය වැදගත්ය. සහශ්‍ර සංවර්ධන ඉලක්ක අත් කර ගැන්ම සඳහා දින දාහක් තිබිය දී ප්‍රැන්සිස් සසුනිසුරාණන් මුණ ගැසීමෙන් එතුමන් විසින් දිළින්දන් වෙනුවෙන් දක්වනු ලබන අඛණ්ඩ මෙහෙයුම කෙරෙහි සැම දෙනා යොමු කරනු ලැබීම අති වැදගත් සංසිද්ධියකි.

විවිධ ආගමිකයන් හා ආගමිකයන් නොවන්නන් අතර සාමයේ හා සංහිඳියාවේ පැවැත්ම තහවුරු කරවීම සඳහා යුගයේ පහළ වූ සාමයේ පාලම තනන්නකු ලෙසින් එතුමා හැඳින්වීමට මා අතිශයින් සතුටු වෙනවා."

## "ඕපදූප කතාබහ එපා" ප්‍රැන්සිස් සසුනිසුරාණෝ පවසති

"කිතුනු සංඝයන් ශුද්ධාත්මයාණන්ගේ සාමය අත්දකීවා, කිතුනු සාංඝික ජනතාව අන් අයගේ වැරදි, කතා නොකොට බැහැපත්කම අත්දකීවා; එදා පැවැති එකමුතු කිතුනු සංඝය නූතන කිතුනු සංඝයන් කෙරෙහි ද වලංගු ආදර්ශයකි; ඔවුන් එදා දිවි ගෙවනු ලැබුවේ එක් ආත්මයක් හා හදවතක් ඇත්තන් ලෙසිනි. එම අලුත් ජීවිතය කරා ඔවුන් ගෙන යනු ලැබුවේ ශුද්ධාත්මයාණන් විසිනි" අප්‍රියෙල් මස 09 වෙනිදා වතිකාන කාර්ය මණ්ඩලය සඳහා පැවැති දිව්‍ය යාගයේ දී ප්‍රැන්සිස් සසුනිසුරාණෝ එලෙසින් අනුශාසනා කළෝ ය.

"ශුද්ධාත්මයාණන් අප සැමදෙනා හට නව ජීවිතයක් ලබා දී ඇත. ඒ ශුද්ධාත්ම ගමන තුළ දිරියෙන් ඉදිරියට යැම අපේ යුතුකමයි. එහෙත් ශුද්ධාත්මයාණන් පෙන්වා දෙනු ලබන මාර්ගයෙන් ඈත් වුවහොත් අප අයාලේ යනු ඇත." එතුමා එලෙසින් ද පැවැසූ සේක.

එදා මුල් කිතුනු සංඝයේ පැවැති අන්‍යෝන්‍ය සම්බන්ධතා ක්‍රම වේදයන් ද නිහතමානී හා සහෝදරාත්මක පැවැත්මද ඉස්මතු කර ගනිමින් සංහිඳියා පැවැත්මක් වර්ධනය කර ගත යුතු යැයි ද ප්‍රැන්සිස් සසුනිසුරාණෝ අවධාරණය කළ සේක.

එහෙත් එකාවන් ජීවිත පැවැත්මකට හරස් වන බොහෝ කාරණා අතර ගතු කේලාම් හා ඕප දූප කීම මහා විනාශයන්ට තුඩු දී ඇතැයි ද එතුමා විසින් පෙන්වා දෙනු ලැබීය. "එකිනෙකාගේ චරිතය හා ක්‍රියාකාරකම් පිළිබඳව ගතු කේලාම් කීම දරුණු යක්ෂ පරික්ෂාවකි. එම නපුරු ක්‍රියාවට පුරුදු වන අප සැම දෙනා දැනුවත්ව හෝ නොදැනුවත්ව කැරෙනුයේ කිතුනු සංඝයට එරෙහි දරුණු අපරාධයකි;

එමගින් කිතුනු සහෝදරත්වයත් එකිනෙකා පිළිගැනුමත් බිඳ වැටෙනු ඇත. එම අසමගි තත්ත්වය පවුල් ද මීසම් ද ජන කොටස් ද හිත මිත්‍රාදීන් ද තුළ බෙහෙවින් පවතී. එබැවින් එම සමාජ හා ජීවිත විනාශකාරී ක්‍රියාදාමය මැනැවින් වටහාගෙන ඉන් මිදීමට ක්‍රියා කළ යුතුය.

"එම නිසාවෙන් කිසිවෙකු විනිශ්චය නොකරන්න; මන්දයත් එකම විනිශ්චයකරු වන්නේ දෙවිඳුන් නිසාය. ඔබට එරෙහිව කටින් බහින් ඇතැම් දෑ වපුරන කල්හී නිහඬ වන්න; කිව යුතු දෙයක් ඇත්නම් අදාළ පුද්ගලයාට නැතහොත් කණ්ඩායමකට පමණක් පවසන්න; එසේ නොකොට කිසිවක් එකිනෙකා අතර පතුරුවා හැරීම නොකරන්න;

මේ අනුව ගතු කේලාම් පතුරුවාලීම නවතාලුවහොත් ජනතාව අතර හිත සුවය හා සහෝදරත්වය උදා කරවීමට අප සැමට දායක විය හැකිය. ප්‍රැන්සිස් සසුනිසුරාණෝ එලෙසින් ද අනුශාසනා කළ සේක.

## බල්ගේරියාවේ දුප්පත්කමේ ගින්නෙන් දිවි වනසා ගනිති



දරිද්‍රතාවය ලෝකයේ කොයි රටේ පැවැතියත් සාගින්නෙන් ඇති කරන විපාකයන් අති බිය කරුය. එසේ දිළිඳු බවින් තැලෙමින් සිය දරු පවුල් රැකගන්නට නොහැකි තැනැත්තන් සියළු බලාපොරොත්තු බිඳ වැටීමෙන්, බල්ගේරියාවේ අසරණයින් ගිනි තබාගෙන මැරෙනා අයුරු කතෝලික පුවත් විසින් වාර්තා කරනුයේ සහෝදරත්වයේ නාමයෙනි.

වර්ෂ 1989 දක්වා බල්ගේරියාවේ කොමියුනිස්ට් පාලනයක් පැවැතියා. ඉන් ඉක්බිති එරටේ සුළු ධනේශ්වර පන්තියක් බිහි වී පැතිරුණු දිළිඳු ජනතාවක් රට පුරා වර්ධනය වූවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් දුගී භාවය පැතිර ගොස් රැකියා විරහිත බව උග්‍ර වූවා. පසුගිය මාසය පුරා පවත්නා පාලනයට එරෙහිව විශාල පිරිස් වීථි බැස ඝෝෂා කළහ. එහෙත් පීඩිත ජනතාව රැක ගැන්මේ ක්‍රියාදාමයන් පෙනෙන තෙක් මානයේ නොමැත. එම නිසාවෙන් පාලන තන්ත්‍රයෙන් හා සමාජ පැවැත්මෙන් පළිගනු සඳහා දිවියෙන් සමුගැන්මේ ප්‍රබල ප්‍රමුඛතාවයක් ඉස්මතු වී තිබේ. පසුගිය සති දෙක තුන තුළදී දිළිඳු බවේ ආනිසංසයන් තව තවත් දරා ගන්නට බැරි සය දෙනෙක් සිරුරට ගිනි තබා ගත්හ. බල්ගේරියාව යුරෝපා සංගමයට අයත් දිළිඳුම රට වශයෙන් පිළිගැනෙන අතර, එම ජනතාවගේ දුක් කන්දරාවන්ට පිළිතුරු ලබා දීමෙන් වැළැකී සිටීමට යුරෝපා සංගමයට තව දුරටත් කළ නොහැකි යැයි කිතුනු පුවත් අභියෝග කරයි.

# අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන්ට ප්‍රණාමය දැක්වීමේ පාපන්දු තරගයක්



ඉතාලි පා පන්දු සංගමයත් ආර්ජන්ටිනාවේ පාපන්දු සංගමයත් මුළු ක්‍රීඩා ලෝකයත්, ප්‍රැන්සිස් සසුනිසුරාණන්ගේ පත්වීමත් සමඟ ඉමහත් ආනන්දයට පත්විය. ප්‍රැන්සිස් සසුනිසුරාණන් හා පාපන්දු ක්‍රීඩාවට දක්වනු ලබන විශේෂ ලැදියාව එක් හේතුවකි. තවද රටවල් දෙක කෙරෙහිම එතුමාගේ සම්බන්ධය හේතුකොට කණ්ඩායම් දෙකම ඉමහත් සතුටට පත්ව සිටී.

මෙ අනුව ප්‍රැන්සිස් සසුනිසුරාණන්ට ගෞරව දැක්වීමේ අරමුණින් මෙම කණ්ඩායම් දෙක අතර මිත්‍රශීලි තරගයක් පැවැත්වීමට දෙපාර්ශ්වය විසින් කරනු ලැබූ සාකච්ඡා අනුව තීරණය වී ඇත. අගෝස්තු මස 14 වැනි දින එම තරගය පැවැත්වීමට පසුගිය සතියේ තීරණයක් ගනු ලැබූවත් එදිනමැ රුසියාවේ හා දකුණු ඇමරිකාවේ පාපන්දු කණ්ඩායම් අතර ජාත්‍යන්තර මට්ටමේ තරගයක් පැවැත්වෙන හෙයින් වෙනත් දිනක් තෝරා ගැනීම සඳහා දැන් සාකච්ඡා වෙමින් පවතී.

අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන් වෙත ගෞරව දැක්වීමේ ඉතාලියානු හා ආර්ජන්ටිනියානු පාපන්දු කණ්ඩායාම් අතර පැවැත්වෙන තරගය රෝමයේදී සිදු කැරෙනු ඇත. එදිනැ දෙරටේ කණ්ඩායම් දෙකම එකම බස් රථයකින් වතිකානය කරා පැමිණෙනු ඇත. අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන් ද එම බස් රථයට ගොඩ වී දෙපාර්ශ්වයේ ක්‍රීඩකයන් සමඟ ක්‍රීඩා බිමට පැමිණෙනු ඇත. ක්‍රීඩාවේ එකමුතු දැකුම ලොවට ප්‍රකාශ කැරෙන අවස්ථාවක් ලෙසද මෙම අවස්ථාව හඳුන්වා දිය හැකි යැයිද කිතුනු පුවත් වාර්තා කරයි.

අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණෝ තරුණ වියේ සිට ආර්ජන්ටිනා "සන් ලොරෙන්සෝ" නම් පාපන්දු ක්‍රීඩා සංගමයේ සාමාජිකයෙක් වූහ. එතුමා නව සසුනිසුරාණන් බවට පත්වූ විගස, එම සංගමය විසින් එතුමාගේ පින්තූරය සහිත ජර්සියක් එතුමා වෙත පිරිනමනු ලැබීය. එම ක්‍රීඩා සංගමය 2008 වර්ෂයේදී 100 ක් වසරක පැවැත්ම ජයශ්‍රීයෙන් සමරනු ලැබීය. එම සංගමයේ ක්‍රීඩකයන් සමඟින් සමිඳුන් හට තුති පිදීමේ දිව්‍ය යාගය එතුමා විසින් එදා කාදිනල් වශයෙන් සිදු කරනු ලැබීය.

# පේරු රාජ්‍යයේ විසල් ජනකායක් ගබ්සාවට එරෙහිව මොර දෙති

පේරු දේශයේ රාජ්‍ය බලධාරිහු ගබ්සාව නීතිගත කිරීම සඳහා නීති රීතින් ගෙන ඒමට උත්සාහයක නිරත වී සිටිති. එම ප්‍රයත්නයට එරෙහිව උතුරු පේරු දේශයේ 30000 කට අධික පිරිසක් පසුගිය සතියේ මහ මඟ විරෝධතාවයන්හි යෙදුනු බැව් කතෝලික පුවත් වාර්තා කරයි.

දවස පුරා පැවති විරෝධතාවය අවසානයේදී ජෝස් ඇන්ටෝනියෝ එජුරින් අගරදගුරු හිමියෝ ජනතාව ඇමතුවෝ ය. "ගබ්සාවට එරෙහි මෙම විරෝධතාවයට සහභාගි වෙමින් ජනතා විරෝධය රජය වෙත එල්ල කිරීම පිළිබඳව කතෝලික සභාව වෙනුවෙන් සැම දෙනාට තුති පුද දෙමින් දේවාදරය ප්‍රාර්ථනා කරනවා.

දරු ගැබේ සිට ස්වාභාවික මරණය දක්වා සකල මිනිසාට ජීවිතය පිළිබඳ ඇත්තාවූ අයිතිය නීති මගින් බිඳ දැමිය නොහැකි බැව් ජනතාවන් විසින් දෙනු ලබන පණිවුඩය, බලධාරින් විසින් පිළිගත යුතුය." එතුමා එලෙසින් අවධාරණය කළ සේක. තවද ජීවිතයට ඇති අයිතිය මිනිස් ස්වභාවය තුළ ලියැවී ඇති නිසා එක්සත් ජාතින්ගේ මිනිස් අයිතිවාසිකම් කොමිෂන් සභාව විසින් එම අයිතියට එරෙහිව ගබ්සාවට සහය දැක්වීම කිසිසේත් කළ නොයුතු බැව් ද අගරදගුරු හිමිපාණන් විසින් අවධාරණය කරනු ලැබීය.

තවද උතුරු හා දකුණු කොරියාව අතර මහා විනාශයක යුද්ධයක් ද තවත් බොහෝ දේශයන්හි ජීවිත විනාශයන්ද අප්‍රිකානු හා අනෙකුත් රටවලැ පවත්නා දරිද්‍රතාවය නිසා දහස් සංඛ්‍යාවන් මිය යැමද තිබියදී පේරුහි ගබ්සාව නීතිගත කැරුම සඳහා එක්සත් ජාතින්ගේ සංගමය විසින් දක්වනු ලබන උනන්දුව තර්ක විරහිත අමානුෂික ක්‍රියාදාමයක් ලෙසින් ද රදගුරු තුමන් විසින් පෙන්වා දෙනු ලැබීය.

ගැබ්දරා සිටිනා මව්වරු විශාල පිරිසක් ද, දරුවන් බලාපොරොත්තු වන වනිතාවන් පිරිසක් ද ගබ්සාවට ලක් කැරුණු වනිතාවන් රැසක් ද එම ගබ්සා විරෝධී ජන රැල්ලට සහභාගි වූ බැව් ද කතෝලික පුවත්හි වාර්තා වේ.

බැසිල් ෆොන්සේකා විසිනි

සංවාද මණ්ඩපය

# කතෝලික සභාව මත කළු පැල්ලමක් තැවරී නැහැ

## සි. සෙ. ප්‍රනාන්දු මහතාගේ ලිපියට පිළිතුරක්

**2013. 01. 13 ලිපිය හා සබැඳේ......**

**ලිපියේ උධෘතය :**
**"එහිදී අප කතෝලික සභාව මත ද කළු පැල්ලමක් තැවරුණු බව අප පිළිගත යුතුය. කතෝලික ධනවත් දෙමාපියන්ගේ දරුවන් සඳහා පෞද්ගලික කතෝලික පාසල් අතලොස්සක් රඳවා ගැනීමත්, එමඟින් අසරණ කතෝලික දුප්පත් දරුවන්ට කතෝලික වටිනාකම් ඇති කතෝලික පාසල් නොලැබෙන තැනට වැඩ සැලසීමත් ඊට හේතුවයි."**

**පිළිතුර** : මෙය ද සත්‍ය කරුණු නොදැන හෝ වසං කර හෝ කරන චෝදනාවකි. මෙම පදනම් විරහිත චෝදනාව මීට පෙර ද ඉදිරිපත් වී ඇති බැවින් මෙම චෝදනාවට ඉතා අංග සම්පූර්ණ සහ පැහැදිලි පිළිතුරක් දී ඇති අතර එම පිළිතුර පොතේ අංක 12 සහ 13 පිටුවල සඳහන් වී ඇත. මෙම ලිපිය පමණක් කියවන්නන්ගේ දැන ගැනීම සඳහා කිව යුතුව ඇත්තේ අසරණ කතෝලික දුප්පත් දරුවන් ඉගෙන ගත් තුන් වැනි ශ්‍රේණියේ පාසල් පෞද්ගලිකව පවත්වාගෙන යෑමට කිසිම අවසරයක් නොතිබුණු බවත්, ඒ පාසල් සියල්ල බලයෙන්ම රජයට පවරා ගත් බවත් ය. එසේම ලැබී තිබුණු අවසරයෙන් උපරිම ප්‍රයෝජන ගෙන, පෞද්ගලිකව පවත්වාගෙන යෑමට හැකි උපරිම පාසල් සංඛ්‍යාව පවත්වාගෙන යෑමට කතෝලික සභාව පියවර ගත් බවය. ඒ අනුව කළු පැල්ලමක් තැවරෙන කිසිදු පියවරක් කතෝලික සභාව ගෙන නැත.

**ලිපියේ උධෘතය** : "තවද මෙම කතෝලික පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීමේ ප්‍රධාන නිර්නායකය කතෝලික ආගම නුවූ බැවින් ධනවත් සහ ධනවත් පවුල්වල නොකිතුනු දරුවන් ද ඒවායෙහි අධ්‍යාපනය ලැබූහ. ඔවුන් පවා 1961 දී ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීමේ පනත් පිහිතලය අමෝරා ගත් අතර කතෝලික පාසල්වලින්ම බිහි වූ ඔවුහු අපටම පාරා වළල්ලක් වූවෝ ය. ආධාර ලැබූ පාසල්වල සිප් සතර හැදෑරූ අප අසරණ කතෝලික දුප්පත් දරුවන් අමතක කිරීම එම කාලය තුළ දී කතෝලික නිලදරුවන් අතින් සිදුවූ අමතක නොකළ හැකි විශාල වරදකි."

**පිළිතුර** : මෙම පදනම් විරහිත චෝදනාවට, 1937 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනත උපුටා දක්වමින් දී ඇති අංග සම්පූර්ණ පිළිතුර පොතේ අංක 80 හා 81 පිටුවල සඳහන් වී ඇත. පාසල්වලට ඇතුළු වීමට පැමිණෙන දරුවන්, ඔවුන් අදහන ආගම සැළකිල්ලට ගෙන ප්‍රතික්ෂේප කිරීම නීති විරෝධී බව එම ආඥා පනතේ ඉතා පැහැදිලිව සඳහන් වී ඇත. ඒ අනුව 1961 ට පෙර පැවති කතෝලික පාසල් වලට දරුවන් ඇතුළත් කර ගැනීමේ ප්‍රධාන නිර්නායකය කතෝලික ආගම කර ගැනීම නීති විරෝධි විය. කතෝලික නිල දරුවන් නීත්‍යානුකූලව කටයුතු කර ඇතිවා විනා කිසිම වරදක් කර නොමැත. හැම මීසමකම කතෝලික පාඨශාලා පිහිටුවා තිබූ බැවිනුත් එම පාඨශාලාවලට ඇතුළු වීමට පැමිණි හැම කතෝලික දරුවකුම ඒවාට භාර ගැනුණු බැවිනුත් කතෝලික දරුවන් අමතක කිරීමක් ද සිදුවී නැත. එසේ කතෝලික දරුවන් අමතක කර නොමැති බවට විස්තර පොතේ 7 වැනි පිටුවේ ඉතා පැහැදිලිව සඳහන් කර ඇත.

**ලිපියේ උධෘතය** : "පාසල් රජයට ගත් පසු කතෝලික අසරණ දරුවන්ගේ අධ්‍යාපනය ගැන කතෝලික සභා නිල දරුවන්ගේ සිත් යොමු නොකිරීම නිසා කතෝලික ගුරු අභ්‍යාස විදුහල් පවා අප කතෝලික අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් ගිලිහී ගියේය."

**පිළිතුර** : මෙම පදනම් විරහිත චෝදනාවට සවිස්තර පිළිතුරු පොතේ අංක 21 සහ 22 පිටුවල සඳහන් වී ඇත. කතෝලික ගුරු විදුහල් වැසුනේ රජය ප්‍රතිපත්තියක් වශයෙන් ගුරු විදුහල් රාශියක් වැසූ නිසා මිස කතෝලික සභා නිලදරුවන්ගේ වරදින් නොවේ. පාසල් රජයට පවරා ගැනීම හේතුකොටගෙන සිදු වූ ආදීනව අවම කර ගැනීම සඳහා කතෝලික සභා අධ්‍යාපන බලධාරින් කර ඇති ඉමහත් කාර්යභාරයේ සාරාංශයක් පමණක් "කතෝලික අධ්‍යාපන බලධරයන්ගෙන් සිදුවූ කාර්යභාරය" යනුවෙන් ඇති 15 වැනි පරිච්ඡේදයේ සඳහන් කර ඇත. මීගමුවේ, බෝලවලානේ තිබූ කතෝලික ගුරු විදුහල වසා දැමීමට රජය තීරණය කළ විට, එය නොවසා කතෝලික ධර්මය උගන්වන ගුරුවරුන් පුහුණු කරන විද්‍යා පීඨයක් බවට පත් කරන ලෙස කතෝලික සභාව රජයෙන් ඉල්ලා සිටියද රජය එම ඉල්ලීමට ඇහුම්කන් නොදුන් බව පොතේ 21 වැනි පිටුවේ සඳහන් කර ඇත.

**ලිපියේ උධෘතය** : "නිදහස් අධ්‍යාපනය ගැන දේශපාලන පොතපත පෙරළීමේදී අප ආඩම්බරයෙන් කථා කළත් අප දේශයේ දැනට බිහි වී ඇත්තේ නිදහස් අධ්‍යාපනයක් නොවන බව නම් සක්සුදක් සේ පැහැදිලිය. උදාහරණ ලෙස ගතහොත් දරුවන් පාසල්වලට ඇතුළත් කර ගැනීමේදී දේශපාලන බලපෑම් සහ අල්ලසට අමතරව පාසලට ඇතුළත් කිරීමට ලක්ෂ ගණන් මුදල් ද දිය යුතුයි. පාසල් සංවර්ධන අරමුදල සඳහා තරගකාරීව මුදල් පරිත්‍යාග කළ යුතුය. පන්ති කාමර සහ පුටු මේසවල තීන්ත ආලේප කිරීම සඳහා මුදල් වාර්ෂිකව අය කෙරේ. පාසල් ගාස්තුද සීමාවෙන් තොරය. ඉන්පසු සල්පිල් හා ආධාර සඳහා මුදල් පරිත්‍යාග ක්‍රීඩා උත්සව ත්‍යාග ප්‍රදාන උත්සව සඳහා මුදල් ලබා ගැනීම දිගින් දිගටම සිදුවේ."

**පිළිතුර** : මෙම තත්ත්වයට වගකිව යුත්තේත් මෙම තත්ත්වය නිවැරදි කළ යුත්තේත් රජය මිස කතෝලික සභාව නොවේ. මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා පෞද්ගලික පාඨශාලා ආරම්භ කිරීම තහනම් කරමින් පනවා ඇති නීතිය සංශෝධනය කළ යුතු යැයි රජය විසින්ම පත් කැරුණු කමිටුවක් තීරණය කර ඇති බව පොතේ 109 වැනි පිටුවේ සඳහන් කර ඇත. අධ්‍යාපනය සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වය විමර්ශනයට භාජන කරමින් එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා රජය විසින් ගත යුතු පියවර "අධ්‍යාපනය පිළිබඳ රජයට විවෘත සන්දේශයක්" යන මාතෘකාව යටතේ පොතේ 16 වැනි පරිච්ඡේදයෙහි සඳහන් වේ. පෞද්ගලික පාඨශාලාවල ශාඛා ආරම්භ කිරීමට ද දැනට නීතියෙන් අවසර නොමැති බව සඳහන් කළ යුතුව ඇත.

කතෝලික පෞද්ගලික පාඨශාලා පිළිබඳව ද ලිපියෙන් නොයෙක් අදහස් ඉදිරිපත් කර ඇත. එම පාසල්වල විදුහල්පතිවරුන්ගේ දෘෂ්ටි කෝණයෙන් මෙන්ම දිළිඳු කතෝලිකයන්ගේ දෘෂ්ටි කෝණයෙන් ද මෙම ප්‍රශ්නය දෙස බලා කතෝලික විදුහල්පතිවරුන්ගේ සැලකිල්ල යොමු වීම සඳහා යෝජනා කීපයක්ම පොතේ 11 වැනි පරිච්ඡේදයට ඇතුළු කර ඇත.

කතෝලික ධර්මය උගැන්වීම සඳහා ගුරු හිඟයක් ඇති බව ද ලිපියේ සඳහන් වී ඇත. එය සත්‍යයකි. එසේ වීමට හේතුව, කිසියම් පාසලකට ආගම ඉගැන්වීමට අවශ්‍ය ගුරු සංඛ්‍යාව ගණනය කිරීම සඳහා දැනට පදනම් කර ගැනෙන 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනතට පටහැනිව නිකුත් කර ඇති 2003/36 දරන අධ්‍යාපන චක්‍ර ලේඛයයි. මෙම චක්‍ර ලේඛයේ සදොස්බව පැහැදිලි කර එය නිවැරදි කරන ලෙස, අධ්‍යාපන අමාත්‍යාංශයේ කතෝලික උපදේශක සභාව විසින් මීට වසර 3 කට පෙර ඉල්ලා ඇති බව පොතේ 97 වැනි පිටුවේ දැක්වේ.

දිළිඳු කතෝලික දරුවන්ගේ අධ්‍යාපන අභිවෘද්ධිය සඳහා කතෝලික සභාව පියවර ගත යුතු බවට ලිපියෙන් ඉදිරිපත් කර ඇති අදහස ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා මාලාවක් "කතෝලික සභා ශ්‍රේෂ්ඨයන්ට ආයාචනයක්" යන මාතෘකාව යටතේ මෙම පොතේ ඇති 18 වැනි පරිච්ඡේදයට ඇතුළු කර ඇත.

ඉහත සඳහන් තොරතුරු මෙන්ම කතෝලික අධ්‍යාපනය පිළිබඳව සහ පාසල් රජයට පවරා ගැනීම පිළිබඳව තවත් වැදගත් තොරතුරු නිවැරැදිව සහ සවිස්තරව දැන ගැනීම සඳහා එම පොත කියවන ලෙස සි. සෙ. ප්‍රනාන්දු මහතාට යෝජනා කරමි.

**ඩී. වී. සී. පෙරේරා**
**වත්තල**

# කතෝලික අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම

**උක්ත මාතෘකාව යටතේ ඩබ්ලිව්. එම්. ප්‍රනාන්දු මහතා විසින් පළ කර ඇති ග්‍රන්ථයෙහි අඩංගු කරුණුවල වැදගත්කම සැළකිල්ලට ගෙන ඒවායින් වඩාත් වැදගත් කරුණු සාරාංශගත කර කොටස් වශයෙන් මෙම පුවත්පතෙහි පළ කිරීමට තීරණය කර ඇත. අද දින පළ කැරෙනුයේ ඉන් තවත් කොටසකි.**

රජයට පවරා ගත් කතෝලික පාසල්වල කතෝලික අනන්‍යතාවයට හානි පැමිණවීම

(මෙම මාතෘකාව යටතේ කරුණු දැක්වෙනුයේ පාසල් රජයට පවරා ගැනීම නිසා කතෝලික දරුවනට මුහුණ පෑමට සිදුවූ, මීට පෙර දැක්වුනු ගැටලු වලට අමතරව තවත් ගැටලුවක් පෙන්වා දීම සඳහා ය.)

කතෝලික සභාව පාසල් රජයට පවරා ගැනීමට විරුද්ධ වූයේ. එසේ පවරා ගැනීමෙන් පසු එම පාසල් එතෙක් පැවැති කතෝලික පරිසරයට සහ කතෝලික අනන්‍යතාවට හානි සිදුවන හෙයිනි. අදාළ පනත් දෙක භාරව කටයුතු කළ අධ්‍යාපන අමාත්‍ය ගරු බදිඋද්දීන් මහ්මුද් මහතා 1960 අංක 5 දරන පළමු වැනි පනත පිළිබඳ කෙටුම්පත නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළ අවස්ථාවේ දීම එතෙක් තිබූ අනන්‍යතාව රකින බවට දුන් ප්‍රතිඥාවක් 1960 ඔක්තෝබර් 24 වැනි දින "හැන්සාඩ් වාර්තාවේ", 1594 වැනි තීරුවේ දැක්වේ. එහි සිංහල පරිවර්තනය පහත දැක්වේ:

"රජයට පවරා ගත් උපකෘත පාඨශාලාවල එතෙක් තිබූ ආගමික පරිසරය අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා ගේ පාලනය යටතේත් ඒ අයුරින්ම පවතිනු ඇත. එම පරිසරය අල්ප මාත්‍ර වශයෙන් හෝ වෙනස් නොවන්නේ ය."

එම ප්‍රතිඥාව ක්‍රියාත්මක කරවීම සඳහා, රජයට පවරා ගත් කතෝලික පාසල්වල කතෝලික භක්ති අභ්‍යාස පැවැත්විය හැකි බවට ද වෙනත් ආගමික භක්ති අභ්‍යාස පැවැත්විය නොහැකි බවට ද විධි විධාන 1961 අංක 8 දරන පනතේ 7 වැනි වගන්තියට ඇතුළු කරවා ගැනීමට කතෝලික සභාව සමත් විය. එහෙත් අහෝ ඛේදයෙකි! ගරු අධ්‍යාපන ඇමැති තුමා එම ප්‍රතිඥාව දී වසර දෙකක් ගත වන්නටත් පෙර සිදුවූයේ එම ප්‍රතිඥාවේ සඳහන් දෙයට - අදාළ පනතේ දැක්වෙන කොන්දේසියට - මුළුමනින් ම ප්‍රතිවිරුද්ධ දෙයකි. එනම්, රජයට පවරා ගත් ඇතැම් කතෝලික පාසල්වල කතෝලික ආගමික වත් පිළවෙත් නොව වෙනත් ආගමික වත් පිළිවෙත් පැවැත්වීමය. එසේ එකඟත්වයට සහ කොන්දේසිවලට පටහැනිව කටයුතු සිදු වූ බව, කතෝලික රදගුරුතුමන් ඉදිරිපත් වී අදාළ බලධරයන්ට කරුණු ඉදිරිපත් කර "ආගම ඉගැන්වීම සහ ආගමික උත්සව" යන මැයින් වූ 1963 ඔක්තෝබර් 5 වැනි දින "දිනමිණ" පුවත් පතේ "කතෝලික පාසල්වල බෞද්ධ උත්සව බැහැ" යන ශීර්ෂය යටතේ එම චක්‍රලේඛය පිළිබඳ ප්‍රවෘත්තිය පළ වීමෙන් ද සනාථ වේ.

ඉහත දැක්වුණු අයුරින් නීති සම්මත වී තිබුණ ද, චක්‍රලේඛ නිකුත් වී තිබුණද, රජයට පවරා ගැනුණු ඇතැම් කතෝලික පාසල්වල කතෝලික වත් පිළිවෙත් පැවැත්වීමට ඉඩ නොලැබීමත්, වෙනත් ආගමික වත් - පිළිවෙත් පැවැත්වීමත්, ඇතැම් අධ්‍යාපන නිලධරයන්ගේ සහ විදුහල්පතිවරුන් ගේ ආශිර්වාදය මැද දිගින් දිගටම සිදුවෙයි. මීට පෙර ලිපියකින් පෙන්වා දී ඇති පරිදි, රජයට පවරා ගත් කතෝලික පාසල් සැලකිය යුතු සංඛ්‍යාවක් විදුහල්පතිවරුන් අකතෝලිකයන් වීම ඊට ප්‍රධාන හේතුවක් විය.

ඉහත දැක්වුණු පරිදි රජයට පවරා ගැනුණු ඇතැම් කතෝලික පාසල්වල කතෝලික පරිසරයට බරපතළ හානි සිදු වී ඇති අතර, කතෝලික අනන්‍යතාව නැති කිරීමේ සූක්ෂම ව්‍යාපාරයක් ද ඉතා සාර්ථකව සිදු වෙමින් පවතී. කතෝලික සිසුන් බහුතරයක් ඇති පාසල්වල පවා විදුහල්පතිවරුන් අකතෝලිකයන් වූ විට මෙන් ම ගුරු මණ්ඩලයෙන් බහුතරය අකතෝලිකයන් වූ විට ද කතෝලික දරුවනට තමන් ගේ ආගම වෙනුවට වෙනත් ආගමක් ඉගෙනීමට සිදු වන්නේ නම් එම පාසලේ ඇත්තේ කවර ආකාරයේ කතෝලික අනන්‍යතාවක් ද?

ඒ පමණක් නොවේ. පාසලේ කතෝලික අනන්‍යතාව පළ කැරෙන කතෝලික ප්‍රතිමා හා පින්තූර ද ආදිය ඇතැම් කතෝලික පාසල් වලින් ඉවත් කර ඒ වෙනුවට අකතෝලික ප්‍රතිමා හා පින්තූර ආදිය තැබීම ද රජයට පවරා ගැනුණු බොහෝ කතෝලික පාසල්වල අඩුවක් නොමැතිව සිදු විය. ර්බීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ම, "හැම පාසලක ම බුදු මැදුරක් ඉදිකිරීමට පියවර ගත යුතුය. යනුවෙන් චක්‍රලේඛ නිකුත් කරන ලදි. කෙසේ වුවද වරද පෙන්වා දුන් විට එය පිළිගෙන එම චක්‍රලේඛය අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම පිළිබඳව අදාළ නිලධරයනට අප ස්තුතිවන්ත විය යුතුය.

රජයට පවරා ගැනුණු කතෝලික පාසල්වල කතෝලික පරිසරයට සහ කතෝලික අනන්‍යතාවට හානි පැමිණ වීම ඉහත දැක්වුණු පියවර වලට පමණක් සීමා නො වීය. රජයට පවරා ගන්නා අවස්ථාවේ කතෝලික පාසලේ තිබූ නම පවා ඒ අයුරින් ම තිබෙන්නට ඇතැම් බලධාරීහු ඉඩ නොදුන් හ. කතෝලික පාඨශාලාවක් හැඳින්වුණේ ජේසු සමිඳුනට හෝ නිමල මරියතුමියට සබඳකමක් ඇති නමකින් හෝ සාන්තුවරයකු ගේ හෝ නමිනි. එසේත් නැත හොත් එම පාසල ඉදි කිරීමට මූලික වූ හෝ එම පාසල පරිත්‍යාග කළ පැවිදිවරයකුගේ හෝ දානපතියකුගේ හෝ නමිනි. එසේ යොදා තිබූ නාමයන් අත්තනෝමතික ලෙස වෙනස් කරනු ලැබ, දේශපාලනඥයන් හෝ අධ්‍යාපන නිලධරයන් හෝ කැමති නම් වලින් ඒ පාසල් හැඳින්වීමට කටයුතු සැලැස්විණ. පහත දැක්වෙනුයේ බස්නාහිර පළාත තුළ පමණක් රජයට පවරා ගන්නා අවස්ථාවේ තිබූ, කතෝලික අනන්‍යතාව පළ කැරෙන නම්, එසේ අත්තනෝමතික ලෙස වෙනස් කැර ඇති පාසල්වලින් කීපයෙකි: රජයට පවරා ගැනුණු දැනට භාවිත අවස්ථාවේ නාමය සහ කැරෙන නාමය පිළවෙලින් මෙසේය.

01. සා. සෙබස්තියන් විදුහල, කොළඹ - සාන්ත සෙබස්තියන් මුස්ලිම් මහා විද්‍යාලය, කොළඹ,
02. සේදවත්ත රෝ.ක. විදුහල - සේදවත්ත සිද්ධාර්ථ ම. ම. වි.,
03. ගොඩිගමුව රෝ. ක. ම. වි. - ගොඩිගමුව මහා විද්‍යාලය,
04. මඩම්පැල්ල රෝ. ක. වි. - පහළ මඩම්පැල්ල විද්‍යාලය,
05. නෙළුම්පිටිය රෝ.ක.වි. - තිඹිරිගස්කටුව දෙමළ මිශ්‍ර වි.,
06. මාකවිට රෝ. ක. විද්‍යාලය - මාකවිට පණ්ඩුකාභය ප්‍රා. වි.,
07. වැලිකඩ රෝ. ක. විද්‍යාලය - වැලිකඩ ධර්මපාල ප්‍රා. වි., 08. බණ්ඩියාගමුව රෝ. ක. වි. - බණ්ඩියාග මුව ගජබා වි., 09. මිරිස්වත්ත රෝ. ක. වි. - කැප්පෙටිපොළ මහා විද්‍යාලය, 10. මොරගෙ ාඩ රෝ. ක. වි. - මොරගෙ ාඩ විමලධර්මසූරිය වි., 11. නාකඳපොළ රෝ. ක. වි. - නාකඳපොළ මිශ්‍ර විද්‍යාලය, 12. බුරුල්ලපිටිය රෝ.ක. වි. - බුරුල්ලපිටිය මහා විද්‍යාලය, 13. බොල්ලත රෝ. ක. වි. - බොල්ලත ධර්මපාල ම. වි., 14. තිබ්බටුගොඩ රෝ. ක. වි. - බොල්ලත ධර්මපාල ම. වි., 15. උතුරු කළුතර රෝ. ක. වි. - උතුරු කළුතර සුගත කනි. වි., 16. උතුරු පයාගල රෝ. ක. වි. - පයාගල බණ්ඩාරනායක ම. වි., 17. අලුත්ගම රෝ. ක. වි. - අලුත්ගම සංඝමිත්තා බාලිකා වි., 18 - දික්ඕවිට රෝ. ක. වි. - දික්ඕවිට ශාස්ත්‍රාලෝක කනි. වි.

රජයට පවරා ගැනීමෙන් පසු, පවරා ගන්නා අවස්ථාව වන විට පාසලේ තිබූ ආගමික පරිසරය අල්ප මාත්‍ර වශයෙන් හෝ වෙනස් වන්නට ඉඩ නොදෙන බවට අධ්‍යාපන ඇමැති තුමා විශේෂයෙන් පාර්ලිමේන්තු සභා ගර්භයේ දී ප්‍රසිද්ධියේ දුන් ප්‍රතිඥාව, පසුගිය අඩ වස තුළ ක්‍රියාත්මක වී ඇති අපූරුව ඉහත දැක්වෙන තොරතුරු වලින් මැනැවින් පැහැදිලි වේ.

# පාතිමා මෑණියන් හෙළිදරව් කළ රහස්

**ඒ දින 1917 වසරේ මැයි මස 13 දා මද්දහන විය. පෘතුගාලයේ පාතිමා නුවර අල්ජුස්ත්‍රා ගම්මානයේ විසූ ලුසී, ජසින්තා හා ෆ්‍රැන්සිස් යන එඬේර දරු තිදෙනා බැටළුවන්ට තණ කැවීමට කෝවා ඩේ ඊරියා තැනිතලාවට ගොස් සිටින විට අහසේ පුදුම දර්ශනයක් දිටීය.**

එකවරම ඇති වූ විදුලි කෙටීමකින් පසු දීප්තිමත් රශ්මිධාරාවක් ඔවුන් ඉදිරියේ විය. ඒ තුළින් ශෝභන කාන්තා රූපයක් දිස්විය. "මම ස්වර්ග යේ සිට පැමිණියෙමි"යි ඇය පිළිතුරු දුන්නාය. එතුමියගේ දර්ශනය වීම් වලදී පසුකලෙක ලොවට හෙළි කිරීමට පණිවුඩ කිහිපයක් ඔවුනට ප්‍රකාශ කෙරිණි. ලුසීගේ දූ කාර්යය ඉටුවනතුරු දිගු කලක් ජීවත්විය යුතු බවත්, ස්වල්ප කලෙක දී අනිත් දෙදෙනාව ස්වර්ගයට ගෙන යනු ලබන බවත් එතුමිය ලුසීට දන්වා සිටියා ය.

පසු කලෙක හෙළි කිරීමේ කොන්දේසිය මත මරියතුමී ඒ තිදෙනාට දුන් "පාතිමා රහස" කලින් හෙළි කරගැනීමට බොහෝ අය උත්සාහ දැරුවෝ ය. ඔවුනට මේ නිසා සිරගත වීමට පවා සිදුවිය. ඉතා අඩු වයසින් ස්වර්ගස්ථ වූ ජසින්තාගේ හා ෆ්‍රැන්සිස්කෝගේ දේහ දෙක වසර 1952 දී පාතිමාවේ අප ස්වාමිදූගේ බැසිලිකාවේ තැන්පත් කරන ලදි. ඔවුන් දෙදෙනාව භාග්‍යවන්ත තත්ත්වයට පත් කිරීමට කිතු උපතේ ජුබිලි වසර වන 2000 මැයි 13 වන දින පැවැත්විණ. මෙතෙක් කිතුනු සභාවේ ප්‍රකාශිත ලාබාලම භාග්‍යවතුන් දෙදෙනා වන්නේ ෆ්‍රැන්සිස්කෝ සහ ජසින්තාය. මොවුන් තරුණ හා ළමා පරපුරේ ආරක්ෂාකාරීන් ලෙස නම්කර ඇත. මේ මුනිවරුන් දෙදෙනාගේ වාර්ෂික මංගල්‍ය පෙබරවාරි 20 දා බව දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශයට පත් කරන ලදි.

1917 වර්ෂයේ දී මරියතුමිය ලුසීට දුන්, නියමිත කාල වකවානුවලදී හෙළි කරන ලද පාතිමා රහස් කොටස් 3 න් සමන්විත විය. පළමුව නිරයේ දර්ශනය ද, දෙවනුව සමස්ථ ධාර්මික වටිනාකම් පෙන්නුම් කිරීම ද, තෙවනුව මතුවට හෙළි කිරීමට ඇති දේ ලෙසයි. රහසේ පළමු කොටස නිරයේ දර්ශනයයි. ලුසී ඇයගේ "මතක" යන කෘතියේ සඳහන් කර ඇති ලෙස මරියතුමී ඔවුන්ට දකින්නට සැලැස් වූ නිරයේ භයංකර දර්ශනය මෙසේ ය. "පෘතුවිය යට විශාල ගිනි උඳුනක් අපි දුටිමු. ඒ තුළ මනුෂ්‍ය වෙසින් සිටි තඹ පැහැති විනිවිද පෙනෙන සුළු යක්ෂයන් හා භූතයන් නලියමින් ගින්නෙන් දැවෙමින් මරලතෝනි නගනවා අපි දුටුවෙමු. මේ දර්ශනයෙන් පසු මරියතුමී ඔවුන් වෙත කරුණාබර බැල්මක් හෙලා "අවාසනාවන්ත පව්කරුවන්ට හිමිවන නිරය ඔබ දැන් දුටුවා. ඔවුන් ගලවා ගැනීමට මාගේ නිර්මල හෘදයට භක්ති අභ්‍යාසයක් ඇරඹීම දේව අභිප්‍රායයි." පව්කරුවන්ගේ සිත් හැරීම වෙනුවෙන් නිතර ජපමාලය උච්චාරණය කරන ලෙසට ද ඔවුන්ට පැවසීය. තවද එතුමිය පාපයේ හේතුවෙන් ලොවට පැමිණෙන යුද්ධ, සාගත, ආගමික පීඩන හා ශුද්ධෝත්තම පියතුමාට පීඩා ඇති කිරීම් වැනි දේ ගැන ඔවුනට දැන්වීය. එතුමිය මෙලෙස ඉඟියක් දුන්නේ 1939 ඇරඹී දෙවන ලෝක සංග්‍රාමය ගැන ය.

පාතිමා රහසේ දෙවන කොටසින් දන්වන පරිදි, ජුනි මස 13 වන දින සිදුවූ මරිය තුමියගේ දෙවන දර්ශනයේ දී එතුමිය ලුසීට කතා කරමින් "මාගේ නිර්මල හෘදය කෙරේ භක්තිය ලොව පුරා පැතිර යාම උන්වහන්සේගේ ආශාව වේ" නැවත 1925 දෙසැම්බර් 10 වන දින මරියතුමී ජේසු බිළිඳුන් සමඟ ලුසීට දර්ශනය වී කටුවලින් වට වූ නිර්මල හෘදය පෙන්වන අතර ජේසු බිළිඳාණන් කතා කරමින් "මනුෂ්‍යයන්ගේ කෙලෙහිගුණ නැතිකම් නිසා නිතර පරිත්‍යාගි වන මේ පෙම්බර හෘදයට අනුකම්පා කරන්නැයි වදාළ සේක." එතුමිය පොරොන්දු වූ පරිදි "අන්තිමේදී මාගේ නිර්මල හෘදය ජය ගන්නේ ය., ලොවට එක්තරා සමාදාන කාලයක් දෙනු ලබන්නේය" යනුයි.

පාතිමාවේ අන්තිම දර්ශනයේ දී එතුමිය කාර්මෙල් මෑණියන් ලෙස දර්ශනය වී ඇත. සෑම කතෝලිකයකුම සළු ධාතුව පැළඳීම පාතිමා පණිවුඩයේ ඉල්ලීමකි. තවද එය පළඳින්නේ නැතිව එම පණිවුඩය අනුව ජීවත් විය නොහැකිය. තෙවන රහස පිළිබඳව ලුසීගේ මුවින් පවසන පරිදි 1917 ජූලි 13 වන දින තෙවන දර්ශනයේදී මේ එඬේර දරු තිදෙනාට මරියතුමිය එළිදරව් කළ තෙවන රහසේ දී "අප ස්වාමිදූගේ වම් පසින් ගිනිදැල් විහිදෙන කඩුවක් අමෝරා ගත් සුරදූතයෙකු අපි දුටිමු, එය ලෝකයට ගිනි ලන්නට දරන ප්‍රයත්නයක් බඳුවිය. නමුත් මරියතුමියගේ තේජස ඔහු මත පතිත වනවාත් සමඟම ඔහුගේ බල මහිමය බොඳව ගියේය. ඒ සමඟම තම දකුණත පෘථිවිය දෙසට දිගු කරමින් පශ්චත්තාපය, පශ්චත්තාපය, පශ්චත්තාපය කියා ගිගුරුම් දෙන ස්වරයෙන් ශබ්ද ඇති විය. ඒ සමඟම සුදු සැරසුන රදගුරු තුමකුගේ ඡායාවක් අප ඉදිරියේ දිස්විනි. රදගුරුතුමා අධික සිත් තැවුලෙන් වේදනාවෙන් පෙලෙමින්, යාච්ඤා කරමින් කඳු මුදුනක් වෙත දණින් වැටී ළඟා වුනු එතුමාව කුරුස පා මුල දී සෙබළ කණ්ඩායමක් වෙඩි වර්ෂාවකින් ඝාතනය කරන ලදි. මෙතෙක් හෙළි නොකළ මේ තෙවන රහස යනු ශුද්ධෝත්තම පියතුමකු ඝාතනයට ලක් කිරීමේ සිද්ධියක් යැයි, 2000 වසරේ මැයි 13 දින ෆ්‍රැන්සිස්කෝ හා ජසින්තා භාග්‍යවරයට එසැවීමේ දේව මෙහෙය අවසානයේ දී තෙවන රහස එළිදරව් කරමින් වතිකානයේ කාදිනල් තුමකු විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

මේ බේදවාචකය ඒ අයුරින්ම සිදුනොවුනත් 1981 මැයි 13 දා වතිකාන ශාන්ත පීතර චතුරශ්‍රයේ දී තුර්කි ජාතික මොහොමඩ් අලි අගකාගේ අසාර්ථක වූ දෙවන ජුවාම් පාවුළු සුදොතුම් පියතුමන්ගේ ඝාතන සැලැස්ම මෙය විය. මේ වෙඩි ප්‍රහාරයේ දී එතුමා ඝාතනයට ලක් නොවූවත් මරණයේ දොරටුව අසළටම ළඟා වූ බව එතුමා පවසා ඇත. "මරියතුමිය එම වෙඩි උණ්ඩයේ මාර්ගය වෙනස් කරමින් තම ජීවිතය බේරා දුන් බව" එතුමා මොහොමඩ් අලි මුණ ගැසීමට ගිය අවස්ථාවේදී පවසා ඇත.

ලුසී මේ තෙවන රහස එතුමියගේම අත් අකුරින් ලියා 1960 දී විවෘත කර ලොවට ප්‍රකාශ කරන ලෙස කියා තිබුණත් ඒ කාලය පසුවන තුරුත් එවකට පත් වූ විවිධ සුදොතුම් පියතුමන් රහසේ එය දැක බලා ගත්තත් වසර 2000 දක්වා කුමන හෝ හේතුවක් නිසා එහි අන්තර්ගත කරුණු ලොවට හෙළි නොකරන ලදි. මේ තෙවන රහස හෙළිකරනු ලැබූයේ එම දර්ශනලාභීන් තිදෙනාගෙන් දෙදෙනකු වන ෆ්‍රැන්සිස් හා ජසින්තා භාග්‍යවරයට එසැවූ සුවිශේෂී දිනයේදීයි. මේ රහසේ අනාගතයට බලපාන දිවැසිවර දර්ශනයක් අඩංගු වී ඇති බැවින් එය අවබෝධ කර ගැනීම අසීරුය. මේ රහසේ උච්චතම අවස්ථාව වන්නේ සුරදූත තෙවැදෑරීම් වන පශ්චාත්තාපය! පශ්චත්තාපය! පශ්චත්තාපය!යන හඬයි. පව්කරුවන්ගේ සිත්හැරීම මුල් කරගෙන යාච්ඤාවට යොමුවිය යුතු බවට ද මේ රහස මඟින් ඉඟියක් දෙනු ලැබේ. එසේම මරියතුමියගේ ජයග්‍රාහී ප්‍රකාශය වන "මාගේ නිර්මල හෘදය ජයගනු ලබන්නේය" යන වගන්තිය තුළින් අප තුළ නව බලාපොරොත්තුවක් ඇතිකර ගත හැකිවන්නේ ය. අප නිර්මල හෘදයේ භක්තියට ප්‍රධාන තැනක් දිය යුතු වන්නෙමු.

එසේම මරියතුමිය පාතිමාවේදී පවසා ඇති පරිදි සුදොතුම් පියතුමන් වෙනුවෙන් හා ලෝක සාමය වෙනුවෙන් ද එමෙන්ම පව්කරුවන්ගේ සිත්හැරීම වෙනුවෙන් ද දිනපතා ජපමාලය යදින ලෙස එතුමිය ඉල්ලීමක් කර ඇත. සත්‍ය වශයෙන්ම පාතිමා දර්ශනයේ අර්ථකථනය පූර්ණ ලෙසම ගත හොත් මෑණියන්ගේ මේ ඉල්ලීම් සමූහය ප්‍රධාන වේ.

("පාතිමා පුවත" ග්‍රන්ථයෙන් උපුටාගත් කරුණු ඇසුරිනි)

**ෂර්මිලා මධුෂානි පතිරණ**
අතුරුගිරිය

## මල්කාන්ති නන්දසිරි මැතිනියනි ඔබ ඉතා ශ්‍රේෂ්ඨයි

**ප්‍රසුගිය බදාදා ජාතික නාලිකාව විකාශය කළ "හිරු වියන" වැඩසටහනේ විශේෂ ආරාධිත ශිල්පිනිය ලෙස සහභාගි වූ ප්‍රවීන ගායිකා මල්කාන්ති නන්දසිරි මහත්මිය ඉතා සොඳුරු කතා බහක යෙදී සිටීම බොහෝ ප්‍රෙක්ෂකයන්ගේ පැසසුමට ලක්විය.**

ඉහත කී සාකච්ඡාව ආරම්භයේ සිටම පුන පුනා තමාගේ කිතුනු අනන්‍යතාව පිළිබඳ ඉතා එඩිතරව ප්‍රකාශ කළ ඇය ජීවිතය ජයගන්නට කිතුනු පාසල් අධ්‍යාපනය හා දේවස්ථාන ගායනා කණ්ඩායමෙන් ද, ගරු පියතුමන්ගෙන් ද ලද අනුශාසනා ඉතා අගය කොට සැලකීම ප්‍රවීනයකුගෙන් අප දුටු දුලභ අවස්ථාවකි. ඈ තුළ දේව මාතාවන්ට ඇති අප්‍රමාණ භක්තිය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමින් අදාළ වැඩසටහනේ තමාගේ ප්‍රියතම ගීතයක් ලෙස "නමෝ මරියනි" ගීය තෝරා ගැනීම ද කිතුනුවන් ගේ අගය කිරීමට ලක් විය යුතුමය.

තම නිලතල, උසස් වීම්, ඉදිරියේ කිතුනුකම සඟවා ගන්නා ප්‍රවීනයන් බහුතරයක් සිටින රටක මල්කාන්ති නන්දසිරි මහත්මියගේ ජීවිත සාක්ෂිය විශ්වාසය වසර තුළ අප බොහෝ දෙනෙකුට පරමාදර්ශයකි. ඉහත කී සාකච්ඡාව අතරතුර මිය ගිය කලාකරුවන් සිහිපත් කළ සැම විටම "මාගේ විශ්වාසය අනුව ඒ අයට මම ස්වර්ග රාජ්‍යය පතනවා" යැයි ඉතා බැහැපත්ව ඇය ප්‍රකාශ කිරීම සැබවින්ම අගය කළ යුතුය.

**ගරු අනුර ගම්ලත් පියතුමා**
අඟුණවිල මීසම

## "අම්මාවරුනේ"

ප්‍රවුලකට දියණියක් උපන් විට දෙමාපියන්ගේ සිත් තුළ විශාල වගකීමක් ඇති වීම අරුමයක් නොවේ. දියණිය මලක් සේ රැකබලා ගැනීම, නිසි අධ්‍යාපනයක් ලබා දීම, රැකියාවක් සොයා දීම හා අවසානයේ සුදුසු විවාහයක් කර දීම විශේෂයෙන් මවක් සතු විශාල වගකීම් සම්භාරයෙන් කීපයකි.

දියණියගේ විවාහය මවකට සුන්දර සිහිනයකි. විවාහ වුණ දියණිය ආදරණීය කැදැල්ලක සැපෙන් සතුටින් සිටීම දෙමාපියන්ගේ ඒකායන බලාපොරොත්තුවයි. එහෙත් එසේ සහනදායක හැඟීමෙන් යුතුව දිවි ගෙවීමට විවාහක දූ දරුවන් සිටින බොහෝ මව්පියන්ට හැකි වී ඇත්ද? සමහර විට මේ දෙමාපියන් විවාහය තුළ හැළ හැප්පීම් වලට භාජනය වෙමින් නීරස විවාහ ජීවිතයක් ගත කළ වැඩිහිටි යුවළක් විය හැකියි. ඔවුන්ගේ එකම ප්‍රාර්ථනාව "මාගේ දරුවාට මෙවන් දුකක් නොවේවා" කියා විය හැකියි. යහපත් විවාහ දිවියක් ගත කරන මව්පියන් පවා පතන්නේ, අපටත් වඩා සාමයෙන් පිරි විවාහ දිවියක් අත්විඳීමට දියණියට හැකිවේවා කියායි. එහෙත් ඇත්ත මොනතරම් තිත්තද?

කතෝලික විවාහය තුළ දික්කසාදයට අවසර නැති බව දැන දැනම, දික්කසාදයට ඉල්ලුම් කරන ප්‍රමාණය දිනෙන් දින වැඩිවෙමින් පවතින බව වාර්තා වනවා. වැඩිහිටි අපට කොතැන හෝ වැරදීමක් සිදුවී ඇති බව පිළිගත යුතුයි. එය නිවැරදි කර ගැනීමට හැකි සෑම උත්සාහයක් ගැනීම අපගේ යුතුකම වේ.

තම විවාහ දිවිය රැකගැනීමේ විශාල බරක් දරන්නේ කාන්තාව බව පැහැදිලියි. තරුණ උගත් දියණියන් මා හා එකඟ නොවීමට ඉඩ තිබෙනවා. ගැහැණිය හා පිරිමියා යන දෙදෙනාම විවාහයේ සම වගකීම් දැරිය යුතු බව විවාදයට හොඳ මාතෘකාවක් වුවත්, යථාර්ථය ගැන ඔබේම මවගෙන්, ආච්චිගෙන් හෝ වැඩිහිටි කාන්තාවකගෙන් අසා දැනගන්න.

දැනටමත් විවාහ වන වයසේ දූ දරුවන් සිටින මව්වරුනේ ඔබටයි මේ පණිවුඩය,

ඔබට මතකද, ඔබේ යුග දිවියේ සොඳුරු හා අඳුරු මතකයන්? ඔබ ඒවා ජයගත් ආකාරය හා අද ඔබේ දිවිය පවතින තත්ත්වයට පත්කර ගැනීමට කළ දුෂ්කර ක්‍රියා? කරුණාකර මේවා දූ දරුවන්ගෙන් සඟවන්න එපා. හේතුව බොහෝ විට දියණියන් ක්‍රියා කරන්නේ මවගේ ක්‍රියා කලාපය අනුගමනය කරමින් බව පැහැදිලි වී තිබීමයි.

උදාහරණයක් වශයෙන් ඔබට යොවුන් වියේදී පාන්දරින් අවදිවීමේ අපහසුවක් තිබුණා නම්, දැන් ඔබේ දියණියත් උදේ අවදි වීමට කම්මැලිකම් කරනවා ඇති. ඔබේ ආදරය නිසා, "පවු! වැඩට යන දරුවනේ, ඔහේ නිදාගත්තාවේ" යැයි සිතමින්, දහවල් වැඩට ගෙන යන බත් පාර්සලය ද සකසා තේ කෝප්පය ද සෑනදු පසුව දියණිය අවදි කරවනවා නම්, ඔබ යම් අනාගත වැරැද්දක් නිර්මාණය කරමින් සිටින්නියකි. ආදර නිසා ඇයගේ මුළු ජීවිතයම අඳුරු කරන්න එපා. ඔබ අවදි වන විට ඇයවද අවදි කරන්න. ආහාර සැකසීම ඇය හා එකතු වී කරන්න. යම් පුරුද්දක් ඇති වීමට යම් දෙයක් දවසක් දෙකක් කර බැහැ. ඇයද ගේ දොර වැඩ ඉගෙන ගත යුතුයි.

විවාහ ජීවිතයක් ගත කිරීමට උගත්කම හා රැකියාව පමණක් මදි බව ඇයට කියා දෙන්න. ඇයගේ කිළුටු රෙදි ඇයටම සෝදාගන්න ඉඩදෙන්න. ඇය ඇඳුම් පැළඳුම් වලට බොහෝ වියදම් කරනවා නම්, මේ පුරුද්ද විවාහයෙන් පසුවද කරගෙන යෑමට උත්සාහ කිරීමෙන් ප්‍රශ්න ඇති විය හැකියි. එයද ඔබට පෙන්වා දිය හැකියි.

වැඩ ඇරී ගෙදර ආ දියණියට ඔබ තේ එක සාදා ළඟට ගෙනිහින් දෙනවා වෙන්න පුළුවන්. එහෙත් දියණිය විවාහ වී විට ඇතිවන තත්ත්වය නම් කෙතරම් මහන්සි වී සිටියත්, තේ කෝප්පය සාදා සැමියාට පිළිගැන්වීම කළ යුත්තේ ඇයයි. එම ක්‍රියාව සේවිකාවට හෝ මවට පවරනවා නම් යම් ගැටළුවකට අවශ්‍ය පසුබිම සකස් වෙමින් පවතිනවා.

දියණියකගේ බොහෝ දුර්වලකම් ගැන දන්නේ මව නිසා, ඒවා නිවැරදි කරගන්න ඇයට උදව් වෙන්න. යුග දිවියේ අරුමය ඇයට ටිකෙන් ටික පහදන්න. යොවුන් දරුවන් විවාහය දක්වාම සිහින ලෝකවල ජීවත් වෙමිනුයි සිටින්නේ. ඔවුන්ට ඇත්ත තත්ත්වය පහදා දීම ඔබේ වගකීමයි.

විවාහ අපේක්ෂක සමුළු වලට සහභාගි වන දරුවන් සමඟ එම දේශන මෙහෙයවන දේශක මහත්ම මහත්මීන් තම අතිශයෙන් පෞද්ගලික කරුණු පවා බෙදා ගනු ලබනවා. එසේ කරන්නේ හුදෙක් විවාහ දිවියක ඇති යථාර්ථමය තත්ත්වය පෙන්වා දීමටයි. මෙය ඔවුන්ට තනිවම එක් දිනක් තුළ පැහැදිලි කිරීමට නොහැකි බව ඔබ ද පිළිගන්නවා ඇති. මව්වරුනි, ඇය දැනගත යුතු දේවල් පිළිබඳව නොසඟවා ඇයව දැනුවත් කරන්න. ඇයට තිබෙන ප්‍රශ්න විවාහයට පෙරම නිරාකරණය කර දෙන්න.

විවාහ වූ පසුව කරන අනවශ්‍ය බලපෑම් වලින් වළකින්න. විවාහයෙන් පසුවද සමහර දූවරුන් තම මව සමඟ දුක් වේදනා පවසන්න කැමතියි. ඇයට උදව් කළ යුත්තේ, ඇයටම ආවේනික පිළිතුරක් සොයා ගැනීමට මිස, ඔබේ විසඳුම් ඇගේ පවුලට බලෙන් පැටවීමට නොවන වග හොඳින් සිහි කල්පනාවට ගන්න. ප්‍රශ්නයක් නිර්මාණය වන බව දැනෙනවා නම් ඔවුන්ව පවුල් උපදේශනයකට යොමු කරන්න. බොහෝ විට උපදේශකයන් මතක් වෙන්නේ ප්‍රශ්න දුර දිග ගොස් දික්කසාද මට්ටමට ළඟා වූ පසුවයි.

විවාහ වන වයසේ සිටින පුතුන් සිටින මව්වරුන්ට ද යමක් මතක් කළ යුතුයි. ඔබේ පුතුන්වද කලින් කීවා සේම දැනුවත් කරන්න. පිරිමි දරුවන් ඔබේ ආදරය තුළ සිරකාරයන් කර නොගන්න. ඔහුගේ වැඩ තනිවම කරගන්න ඉඩ හැරීම බුද්ධිමත් මවකගේ සිරිතයි. විවාහ වූ දෙදෙනාම රැකියාවක් කරන්නේ නම්, ඇති විය හැකි ප්‍රශ්න පිළිබඳව සුහදව කතා කරන්න. ගේ දොර වැඩට ඇයට පුතුගේ සහාය අවශ්‍ය වන බව පවසන්න. ඔබේ ගෙදර වැඩ වලට සුළුවෙන් හෝ ඔහුව සහභාගි කරගන්න. එම අත්දැකීම් ඔහුගේ පවුල් ජීවිතයට හොඳ රුකුලක් වේවි.

පුතුගේ තරුණ බිරිඳ සමඟ කටයුතු කිරීමේදී විශේෂයෙන් සැළකිලිමත් විය යුතුයි. ඇයට ආවේනික ආකාරයට ඔවුන්ගේ පවුල ගොඩනගා ගනිවි පුතු ද ඇයට සරිලන පරිද්දෙන් ජීවිතය වෙනස් කර ගනීවි. මේ දෙස ඔබ උපේක්ෂාවෙන් බලන්න. ඇය අනුගමනය කරන ක්‍රම ඔබ අනුගමනය කළ ක්‍රම නොවීමට පුළුවන්. දුරින් සිට බලා සිටින්න. අවශ්‍ය වූවොත් පමණක් පරෙස්සමින් උපදෙස් දෙන්න. බිරිඳගේ සෙනෙහස මැද පුතු නව උපතක් ලබන බව ඔබට පැහැදිලි වේවි. ඇය ඔබගේ අනුරුවක් නොවේ. ඇයගේ අනන්‍යතාවයට නිතරම ගරු කරන්න.

මෙලෙස වැඩිහිටි සියලු දෙනා අපේ දරුවන්ගේ යුග දිවියන් සරුකර ගැනීමට හැකි පමනින් දායක වීමට අදිටන් කර ගතහොත් ලස්සන වන්නේ ඔවුන්ගේ ජීවිත පමණක් නොවේ. වැඩිහිටි අපේ ජීවිතයන් ද අවසන් කාලයේ සැනසීමෙන් හා සාමයෙන් ගත කළ හැකි වේවි.

**නිර්මලා ප්‍රියන්ති රොඩ්රිගෝ**
කැපුන්ගොඩ

හද පත්ලෙන්ම දරුවනට ආදරය, කරුණාව හා ආරක්ෂාව දෙමින් තම ජීවිත දරුවන් වෙනුවෙන් කැප කළත් දෙමාපියන්ගේ ගුණ ගායනා කරන කල හැම විටම තාත්තාව පිටුපස ආසනයට විසි වී මවට පමණක් මුල්තැන ලැබීම අද සමාජයේ සැමවිටම සිදුවන්නකි.

ගෘහ මූලිකයා හෝ පවුලේ ප්‍රධානියා පියාය යන්න හුදෙක් නීතියක් පමණක් වී අද දරුවන් හා පියා අතර ඇති සම්බන්ධතාවය ඉතා සුළු වන්නේ තාත්තා ගැනත් ඔහුගේ අමිල ආදරය ගැනත් පවුල තුළ කතා කිරීම, ගුණ ගැයීම හෝ ඇගයීම වෙනුවට, තාත්තා යනු විටක මුදල් ලබාදෙන බැංකුවක් හෝ දරුවන් වැරදි කරන විට තරවටු කිරීමට හෝ දඬුවම් ලබා දීමට බිහි වූ සෙන්පතියෙක් හෝ කෙටියෙන් කිවහොත් තාත්තා යනු ලෞකික දේ පමණක් දරුවනට ලබා දීමට සිටිනා පුද්ගලයෙකුත්, අම්මා පවුල තුළ ආදරයේ ප්‍රතිමූර්තිය ලෙසටත් අද සමාජය තුළ දරුවන් තේරුම් ගෙන සිටිති.

මවගේ ආදරය මහ මෙරක් ලෙස වර්ණනා කරමින් ලියවී ඇති දස දහස් ගණන් කවි, කතාන්දර, සිංදු හෝ ශ්‍රේෂ්ඨ කලාකෘති අතර පියාගේ ආදරය ඉතා සුළු තිතක් ලෙසටවත් උපමා කිරීමට කවියා සැමදා මැලිව සිටියි. තාත්තාගේ ගුණ ගැයෙන ගීත අතේ ඇඟිලි වලටත් වඩා අඩුය.

මේ පවුර බිඳිමින් ලියැවුන ටී. එම්. ජයරත්න මහතා ගායනා කරන "අම්මා සඳකි මා ඒ ලොව හිරුය රිදී" යන ගීතයෙහි තාත්තාගේ දරුවන් උදෙසා පිටාර ගලනා ගැඹුරු ආදරය, පිය සෙනෙහස ලස්සනට ගීතවත් වන විට ඇත්ත වශයෙන්ම තාත්තාගේ ලේ කිරි නොවුයේ මන්ද කෙරෙහි උපදින්නාවූ ඇල්ම මහා සාගරයටත් වඩා විශාල ගැඹුරු ආදරයකි.

තාත්තා බොහෝ විට ආදරය පුන පුනා දරුවනට මව මෙන් කියාපාන්නේ නැත. දරු සෙනෙහසින් උපන් හැඟීම් හදවතෙහි කැටි වී, මිරිකී තෙරපෙමින් ඔහු රැකගනී, බොහෝ විට ඔහු නිහඬය. දරුවන් සිප සනසමින් ඔවුන් තුරුළු කරගෙන, ඔවුන් කවා පොවා නහවා නිදි කරවන්නේ නැත. මව මේ දේවල් කරන විට දහඩිය හෙලමින් හෝ ශාරීරිකවත්, මානසිකවත් සටන් කරමින් දරුවන් රැක ගැනීමට වෙහෙසෙන තාත්තා බොහෝ විට අප දකින්නේ නැත. කිසිදිනක අපි ඔහුව අගයන්නේ ද නැත.

දරුවන්ගේ සැප තකා ඔවුන්ගේ සැප අත්හරිනා තාත්තලා කොතෙකුත් සිටී. එවැනි ආදර්ශමත් එක් තාත්තෙක් ගැන බිඳක් පවසන්නට අවසර පතමි.

පසුගිය පෙබරවාරි 16 වැනි දින මාගේ පියා වන පිලිප් පෙරේරා රාගම රෝහලේ දැඩි සත්කාරයේදී සදහටම දෑස් පියාගෙන අප නෙතග කඳුලක් ඉතිරිකර දෙවි පියාණන් අභියසට පිය නැගුවා.

වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම "තාත්තා" කියලා කියන්න පුළුවන්, මා ජීවිතයේ දුටු වටිනාම, උසස්ම නිහතමානි හා ශුද්ධවන්තම මනුෂ්‍යයා මගේ තාත්තා කියා කීවොත් එය අතිශයෝක්තියක් නොවෙයි.

පොත් 100 ක් ලීවත් ගුණ කියා නිම කරන්න බැරි රත්තරං හදවතක් තිබූ මේ පියාණන්ගේ ජීවිතයේ බිඳක් ඔබ ඉදිරියේ තබන්නේ සියළු ගුණදම් පිරිහුණ සමාජයක මෙවන් මිනිසුන් තවමත් ජීවත්වන බව බොහොමයක් අපි දන්නවා. ඒත් අප අතර ඉපදිලා ඉතා ශුද්ධවත් ජීවිත ගත කරලා කෙළින්ම ස්වර්ගයට ගිය නම් නොකළ සාන්තුවරයොත් මේ අතර ඉන්නවා. ඒ වගේ කෙනෙක් තමා මගේ තාත්තා.

# "ඔබ ඒ ලොව හිරැය රිදී"

ආදරවන්ත පියෙක් මිය යෑම දරුවකුට දරාගන්න බැරි දුකක්. විශේෂයෙන් දියණියකට තාත්තකුගේ වටිනාකම කියලා නිම කරන්න බෑ.

මට මතක ඇති පුංචි කාලේ ඉඳලම මගේ ජීවිතයේ වීරයා වුණේ මගේ තාත්තා. අයියලා 4 දෙනෙකුගේ බඩ පිස්සි වුණේ මං මම දඟ වැඩ කරනකොට තාත්තා හැම වේලාවේම කිව්වේ මට ඉන්නේ කොල්ලො 5 ක් මේක නම් කෙල්ලෙක් නෙමේ කියලා. ඇත්තටම පුංචි කාලේ මම හැදුනේ ගමේ කොල්ලෙක් විදිහට ගස් නගින්න, බයිසිකල් පදින්න, අගල්වල බැහැල මාළු අල්ලන්න, පොල්ලෙලි පිටේ බැඳගෙන ඇලේ පීනන්න අයියලා එක්ක තරගෙට දුවලා ජයගන්න මම හරි දක්ෂයි. අපේ ළමා කාලය ළමයින් විදියට ගත කරන්න සම්පූර්ණ නිදහස අපේ තාත්තා අපිට දුන්නා. ඔහු අපිට විටෙක යාළුවෙක් වුණා. අපේ තාත්තා කිසිදිනක මට ගහල නෑ. වැරැද්දක් කළොත් ජේසු ටැඹක් වේවා!

අපි පුංචි කාලේ ඉඳලම අපිට උගන්වන්න තාත්තා ගොඩක් මහන්සි වුණා. පාසල් යන කාලයේදීම පවුලේ ආර්ථිකයට උරදීමට අවශ්‍ය වූ නිසා වැඩිදුර අධ්‍යාපනය අතරමඟ නතර කර රැකියාවකට යන්න මගේ පියාට සිදුවූවත් ඔහු අධ්‍යාපනයට තිබූ ආශාව විවාහ වූ පසුවත් නතර කළේ නෑ. ඔහු සෙනසුරාදා ඉරිදා දිනවලත් දිනපතා රාත්‍රි පන්ති යමින් දිගටම අධ්‍යාපන කටයුතු වල නිරත වූ බව මගේ අම්මා සැමවිටම පවසනවා. රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ සාමාන්‍ය ලිපිකරුවකු ලෙස රැකියාව අරඹා එම දෙපාර්තමේන්තුවේම ඉහළම තනතුර වන සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තත්ත්වයට පත්වීම වාර්තාවක් බව මම පසුකලෙක දැනගත්තා.

පමුණුගම පල්ලියේ ඉතිහාසය, පරම්පරාවේ ඉතිහාසය, නාඩගම් කලාව ගැන හසල දැනුමක් තිබූ තාත්තාගෙන් යමෙක් ප්‍රශ්නයක් ඇසුවිට කරුණු සහිතව එය පහදා දීමට ඔහු තුළ තිබුණේ සහජ කුසලතාවයක්. බයිබලය සම්පූර්ණයෙන් කිහිප වරක් කියවා තිබූ ඔහුට ගීතාවලියේ බොහෝ කවි මතකයින් නිහතමානී, අවංක, දෙවියන්ට බිය ගුණගරුක දරුවකු වන්න යැයි ඔහු සැමවිටම අපට අවවාද කළා.

එඩිතර, නිර්භීත, අවංක පුද්ගලයකු වූ මගේ පියා ඉතා සත්‍යගරුක කෙනෙක්. ගමේ මඟුල් ගෙදර, මරණ ගෙදරත් පල්ලියේ පාසලේ උත්සවයකදීත් ලස්සන කෙටි හරවත් කතාවකින් එම සභාව පෝෂණය කළා. වැඩිම පූජක පුතුන් පිරිසක් ලක්මවට ගෙනදුන් පමුණුගම ග්‍රාමයට පැමිණෙන පූජාප්‍රසාදිවරුන් පිළිගනිමින් කතා පැවැත්වූයේ සැමදා ඔහුයි.

අපේ නිවස ආදරයෙන් පිරී ඉතිරී ගිය තැනක්. හැමවිටම හැමදේම මුල්තැන දෙවියන්ට දීම යුතු බවට ඔහු අපට කියා දුන්නා. හැකි සැම විටම අපි සියළු දෙනා එකට ආහාර ගැනීමේ අවශ්‍යතාවය ඔහු පෙන්වා දුන්නා. පවුල් ජීවිතයේ ප්‍රශ්න ඇතිවන විට දෙවියන් කෙරෙහි පමණක් විශ්වාස තබන්න යැයි මට හැම දිනකම අවවාද දුන්නා.

තාත්තා අපි පස්දෙනා ගැන ගොඩක් නිහතමානිව ආඩම්බර වුණා. ඒ ඔහුගේ සිහින සැබෑ කරන්න අපිට පුළුවන් වුණ නිසා. එක පුතෙකු දෙවිඳුන්ගේ මිදි උයනේ සේවයට බාරදීමට හැකිවූ නිසා දිනපතා දෙවිඳුන්ට ප්‍රශංසා කළා. ශු. ජුසේ මුනි තුමාටත්, ශ්‍රී ලේ ස්වාමින් වහන්සේටත් විශේෂ භක්ත්‍යාදරයක් තාත්තා තුළ තිබුණා.

තාත්තා නොමැති ගෙදර අද අපිට පාළු කාන්තාරයක්. ඔහුගේ කටහඬ, සිනාව හා ගීත රාවය සෑම බිත්තියක් තුළින්ම රැව්පිළි රැව්දෙනවා. එදා නිවසේ තිබූ සිරියාව සම්පූර්ණයෙන්ම අපට අහිමි වෙලා. වයසක දෙමාපියන් දරුවන්ටත් හිමිවේවි.

මහළු මගේ පියා මා නහවා පිරිසිදු කරන විට ඔහු මට පැවසුවේ "පුතේ ඔයා ඔයාගේ ණය යුක්තිය ඉටුකරලා අවසානයි. මගෙ දුවට හරියනවා. ජුසේ මුනින්ද්‍රයගෙ පිහිටයි" කියලා. මගේ තාත්තාගේ ඒ ආශිර්වාදාත්මක වචන උදේ හවා මගේ දෙසවන තුළ දෝංකාර දෙනවා.

තාත්තා මට දුන් අවවාදයක් ඔබටත් කියන්නම්. "මම ගමේ හොඳින් උන්න නිසා කවුරුත් මට සලකනවා. ඊට වැඩියෙන් ඔයාලා හොඳින් සිටින්න ඕනෑ බව වටහා ගන්න. මතක තබා ගන්න". මෙය සැමවිටම ඔහු දරුවන්ට දුන් අවවාදයක්.

ඉතිං සොයුර සොයුරිය ඔබේ වයස්ගත දෙමාපියන් මහළු නිවාස වලට යොමු කරන්න එපා. ඔබ සුර සැප විඳිනා විට අසරණව තනිව පැලේ හෝ මහා සුවිසල් මන්දිරවල කඳුළු හෙලන අම්මා හා තාත්තා සිහි කරන්න. ඔවුන්ට ආදරය දක්වන්න.

මේ කාර්ය බහුල ජීවන රටාව තුළ ඔබට විවේකය නැතිබව මම දනිමි. දිනකට විනාඩි 2 න් දුරකතනයෙන් හෝ මවට පියාට අම්මා තාත්තා කියා අමතන්න. ඔවුන්ට අවශ්‍ය මිල මුදල් නොව ඔබේ ආදරය පමණයි. අද ඔබ දෙමාපියන්ට සලකන කල ඒ දකින ඔබේ දරුවන් යම් දිනක ඔබව ද ආදරයෙන් රැකබලා ගනු නොඅනුමානයි.

"මේ සියල්ල ඉහළ සිට දකින ආදර දෙව්පියාණන් ඔබටත් ඔබ පවුල් වලටත් වරප්‍රසාද නොඅඩුව වස්වාලන බව මා ස්ථිරයෙන්ම ඔබට පවසමින් නිහඬ වන්නෙමි.

**වෛද්‍ය රෝෂිණි පෙරේරා**

---

# මම තනි නැහැ චූටි දුවේ

මගේ ආදර චූටි දුව, තුෂාරි සමන්තිකා, ඔබ දෙවි මව් තුරුළට ගොස් මෙවර ලංකාවේ අප ස්වාමිදූගේ මංගල්‍ය දිනය වූ පෙබරවාරි 04 දා ට වසර 23 කි. වසර එකහමාරක් පමණ වෛද්‍යවරුන් ගේ මතය අනුව එම වයසේ ළමුන්ට වැළඳෙන ඉතාම දරුණු වේදනාත්මක පිළිකා රෝග යකින් දැඩි වේදනා වින්දේ කිසිදු මැසිවිල්ලකින් තොරව සිනහමුසු මුහුණින් ය.

මහරගම පිළිකා රෝහලෙහි සිටියදී ඔබේ සියලු වේදනා ඉවසීමෙන් දරා ගනිමින් ඒවා ඔබ අවට වූ රෝගීන් වෙනුවෙන් ජේසුට ඔප්පු කළේ, ඔබ ළඟ නිතරම සිටි මා පුදුමයට පත් කරවමිනි. දිනක් ඔබ, "අම්මා මේ මොහොතේ මා විඳින වේදනා අපතේ හරින්නේ නැහැ. ඒවා අර පණ අදින ආන්ටි වෙනුවට ඔප්පු කරනවා"යි කියද්දී මා පුංචි ඔබේ වීරවන්තකම ගැන ජේසු සමිඳුන්ට තුති පිදුවා. කුඩා කල මා කියා දුන් දේ ඔබ එම අවස්ථාවේදී ක්‍රියාවට නැංවූවා. දැඩි වේදනා විඳිමින් දිනපතා ජපමාල පංති 15 ම කීවා. පැයක් පාසා එකම වේලාවට නමෝ මරිය යාච්ඤාව කීමට මට මතක් කළේ ඔබමයි.

ඔබ කන බොන දේත්, බෙහෙත් සහ වතුර පවා ඔබට මා දුන්නේ ජේසුගේ අමිල වූ ශ්‍රී ලෙයින් බිඳක් එයට එක් කරන ලෙස ජේසු සමිඳුන් යදිමිනි. එම අවස්ථාවල දී ඔබ මට විහිළු කළා. "අම්මා හරිම අසාධාරණයි. ජේසුගේ ශ්‍රී ලේ සැම විටම මට ඉල්ලා දෙන කොට අනෙක් ලෙඩුන්ට කෝ?" කියමින්.

ඔබට තිබුණ මද රැළි වැටුණ ලස්සන දිග ඝණ විශාල කෙස් කළඹ සම්පූර්ණයෙන්ම හැලී යද්දී, දුටුවන් දුක්වුවද ඔබ දුක් නොවී "මම තමයි අඟුරුකාරමුල්ලෙ පන්සලේ පොඩි සාදු" කියමින් තමාටම විහිළු කර ගත්තා. ඔබව බලන්නට පැමිණි අසල්වැසි කාන්තාවක් ඔබේ හිස දැක කම්පා වී සිහිසුන්ව බිම වැටුණා. ටික දිනකට පසු ඔබට පැපොල රෝගය වැළඳී හිස පුරාමත් තුවාල ඇති වූ අවස්ථාවේ ඔබ දෙවිඳුන්ට ප්‍රශංසා කළා. "මගේ හිසකෙස් සියල්ල නැති එක මට කොතරම් සහනයක් ද? මගේ විශාල කොණ්ඩය තිබුණා නම් මට කොතරම් කරදර වන්නට තිබුණාද? ජේසු මට ආදරේ නිසා හරි වෙලාවට හිසකෙස් නැති කළා" කියමින් දෙවිඳුන්ට තුති පිදුවා. පසුව ක්‍රමයෙන් ලස්සන කෙටි කෙස් කළඹක් වැවුණ විට, "දැන් මම හරි මොඩ්" කියා සෑහීමට පත්වුණා.

ඔබව පිළිකා රෝහලට ඇතුල් කළේ, එවකට රෝහලේ චැප්ලන්ව සිටි ගරු ටෝනි මාටින් පියතුමා ඔබට විශේෂ ආශිර්වාදයක් දී යාච්ඤා කර ශුද්ධවූ පෙරිග්‍රිනු මුනිඳුන්ගේ පදක්කමක් පැළඳුවාය. පසු දිනක ශිරානි සොයුරිය ඇතුළු "කුර්සිලිස්ටාස්ලා" කීප දෙනෙකු සමඟ ගරු ටෝනි මාටින් පියතුමා දිව්‍ය පූජාවක් ද රෝහලෙහි පැවැත්තුවා. වේදනාව උත්සන්න වීමෙන් ඔබට සිහිය නැති වූ අවස්ථාවල (ඇතැම් විට මැදියම් ට රැයේ පවා) ගරු ටෝනි මාටින් පියතුමා පැමිණ යාච්ඤා කළ විට ඔබට සිහිය ආවා. තවද මගේ ඥාති සොහොයුරු ගරු ප්‍රියන්ත සිල්වා පියතුමා නිතර පැමිණ ඔබට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන්නට දී එතුමාගේ පිට කොන්දේ වේදනාත්මක අත්දැකීම් බෙදා ගනිමින් ඔබට ආධ්‍යාත්මික පෝෂණයක් ලබා දුන්නා.

ටික කලකට පසු රෝහල් වැඩ වර්ජනයක් නිසා අපට ඔබව ගෙදර ගෙන එන්නට සිදුවුණා. ඔබ පාසලේ දී ගුරුවරුන් ගේ සහ මිතුරියන්ගේ ඉමහත් ආදරයට පාත්‍ර වී සිටියා. අසරණයින් ගැන උණුවන හදවතකි ඔබට තිබුණේ. ආර්ථිකයෙන් අපත් ඉතා දුර්වල තත්ත්වයක සිටියත්, පන්තියේ දුගී මිතුරියන්ට උදය ආහාරය ගෙදරින් ගෙන ගොස් රහසිගතව දුන්නා. අනෙක් යෙහෙළියන් සමඟ මුදල් සම්මාදම් කර දුගී සිසුවියන්ට උපන් දිනේට අප්‍රසිද්ධව ඇඳුම් තෑගි කළා. ඔබ ගිලන්ව සිටියදී ඔබව බැහැදැකීමට පැමිණි මවක් මට කී කතාවක්. "මගේ දුව දිනක් උදය පාසල් යාමට පෙර මගේ සිත රිදෙව්වා. ඒ බව ඈ තුෂාරිට කියා තිබුණා. තුෂාරි ඇයට අවවාද කරමින් කියා තිබුණා. "ඔයා දන්නවා නේද, අම්මා කෙනෙකු දරුවකු හදන්න කොපමණ මහන්සි වෙනවද කියල. අද ඔයා ගෙදර ගිය හැටියෙම අම්මාගෙන් සමාව ඉල්ලා මට හෙට උදේම ඒ බව කියන්න ඕනෑ." ඉදින් මගේ දුව එසේම කළා.

ඔබේ රෝගය පටන් ගනිද්දි, පියා ජේසු වෙතට ගොස් හත් වසරකි. ඔබේ අයියා, (පවුලේ එකම පුතා) ගුවන් හමුදාවට බැඳුනා විතරයි. සොහොයුරියන් දෙදෙනා ගෙදර තනිකර අසනීප වූ ඔබ සමඟ මව රෝහල් ගතවිය යුතු නිසා, දෙව්පියාණෝ මගේ මල්ලිත්, බිරිඳත් එකම දරුවාත් අපේ ගෙදර පදිංචි කළ සේක. එය හිතා ගන්නටත් බැරි දෙයක්. ඔබේ සොයුරියන් දෙදෙනා ආරක්ෂාවට ඒ පවුලට වඩා සුදුසු පවුලක් මුළු ලොවෙහිවත් නොවීය. දෙවියන් වහන්සේ පුදුමාකාරයි. ප්‍රශංසා වේවා!

දෙව් මහෝත්තමයාණෝ අප සමඟම සිටි සේක. දිව්‍ය සංරක්ෂණය දෝරේ ගලා ගියා. ගේ පිරිල උදව් කරන අය. ආර්ථිකව ඉතාම දුර්වල තත්ත්වයක සිටි අපට මුදල් පරිත්‍යාග කළ අය, වෛද්‍යවරුන් වෙත ගෙන යාමට වාහන, ඕනෑම උදව්, ගෙදර දොරේ උදව් - අදහා ගන්නට නොහැකි තරම් උදව් ගලා ආවා. අප නාඳුනන පුද්ගලයන් පවා, ලෙඩුන්ට සුදුසු ආහාර වර්ග බරට බරේ (නත්තල් සීයලා වාගේ) රැගෙන ඒ අයව හඳුන්වා දෙමින් ගෙට ගොඩ වී, උදව් කරන්නට පටන් ගත්තා. ඕනෑම ඉහළ පෙළේ රෝහලක හෝ සාත්තු නිවාසයක නතර කර ප්‍රතිකාර කළ යුතු නම් සම්පූර්ණ වියදම් දරන්නට ඉදිරිපත් වූ අයද වූහ. උදව්කරුවන් ගෙන්, පරිත්‍යාගශීලි අයගෙන් ගෙය පිරිලා. ඔබේ ඥාන මවද, මගේ ඥාතින් ද නිතරම අප සමඟ සිටියා. ඒ සියල දෙන දිවා රෑ නොබලා යාච්ඤා කළා. අපේ නිවස පුංචි දෙව්මැඳුරක් මෙනි. දවල් 12 ට රෑ දොළහට ශුද්ධවූ පැය පැවැත්තුවා ඒ අවස්ථාවල දී දැඩි වේදනා විඳිමින්ම, බොහෝ විට පැය කාල් හතරම ඔබ කියෙව්වා. මා නිතර ශුද්ධවූ සෙබස්තියන් මුනිඳුන්ගේ නොවානය පොතෙන් කියවද්දී ඔබ බොහෝ කොටස් නොනවත්වා කඩපාඩමෙන් කීවා.

ඔබ දෙවි පිය හමුවට යාමට දින තුනකට පමණ පෙර අපෙන් ඇසුවා, "අම්මල මාව කොඩි දෙකක් මැද පෙට්ටියක තියල අඬන්නෙ ඇයි?" කියා. මා කීවා "ජේසු එහෙම දෙයක් මගෙ දුවට වෙන්නට ඉඩ දෙන්නෙ නැහැ" කියා.

ඉතා අලංකාර ලෙස ඒකාලෝක කළ සුවිසල් මන්දිරයක ඔබේ වයසේ, සුදු දිග ගවුම් ඇඳගත් ළමුන් සමඟ අත් අල්ලාගෙන ඔබ ඩාන්ස් කළා යැයි කීවා. ඔබ මිහිදන් කළ දින රාත්‍රියේ අපේම පවුලේ අය මෙන් අපට උදව් කළ අල්ලපු ගෙදර පවුලේ ළමයෙක් එම දේම හීනෙන් දුටුවා. අප එය ඔවුනට කියා තිබුණෙත් නැහැ. තවද ඔබව විශාල පියාපත් සහිත පක්ෂියෙක් උස් කන්දක් මුදුනට නිතර ගෙන යන බව මට කීවා. දිනක් ඔබ "කුරුල්ලෝ කුරුල්ලෝ, මාව කන්ද මුදුනට ගෙනයන්න එපා. අපේ අම්මිය මාව හොයයි." යනුවෙන් ඉතා සිහින් හඬින් ඔබ කියනු, ඔබ ළඟම සිටි මට ඇසුණා. "කුරුල්ලට ගෙන යන්න දෙන්නේ නැහැ. අම්මා දුව ළඟ ඉන්නවා යැ"යි මා කීවා. දිනක් ඔබ කීවා, "අම්මා, මම දැන් ලස්සන මල් වත්තක හරිම සතුටින් සිටියායැ"යි. මා වටහා ගත්තේ මොහොතකට හෝ ඔබට දැඩි වේදනාවෙන් සහනයක් ලබා දීමට කරුණාබර දෙවි පියාණන් එසේ කළ බවයි. ප්‍රශංසා වේවා!.

ඔබේ දෑත දෙවි සමිඳුන් කෙතරම් ආශිර්වාදකර තිබුණාද යත් ඒවායින් නිම වූ සෑම දෙයක්ම ඉතා උසස් තත්ත්වයක් දැරුවා. ඔබ සෑදූ තැඹිලි වයින් වල රස බැලූ ගෙදරට පැමිණි අමුත්තන් ඒවා රට වයින්දැයි ඇසුවා. මෙය එක නිදසුනක් පමණි. ඔබේ මැදහත්කමින් ජේසු සමිඳුගෙන් අප ලැබූ පිහිට බොහෝ ය. ඒවායින් දෙකක් පමණක් මෙහි සඳහන් කරමි.

ඔබේ නැගණිය විවාහ වී නොබෝ දිනකින් ඇගේ සැමියාගේ ඇඟිල්ලේ තිබූ මංගල මුදුව නැති බව දැනුණා. කාර්යාලයේ සිට ගෙදර පැමිණි විට බොහෝ වේලා සෑම තැනම සොයා, පසුව ඔහු මඟදී ගිය සාප්පුවලද මොටෝරියෙහිද සොයා සම්භ නොවූ තැන ඔබේ නංගී ඔබට යාච්ඤා කළ විට, මොහොතකින්, කළිසම් සාක්කුවේ පිටත රෙදි නූලකින් එල්ලෙමින් තිබුණා. මුදුව දැක සියලු දෙන මවිත වුණා. දෙවි සමිඳුන්ට ප්‍රශංසා කළා. ඔබේ ඥාති සොහොයුරියක් පිළිකා රෝගයෙන් අසාධ්‍යව සිටියදී ඔබ ලස්සන, ධවල වර්ණ මැක්සියකින් සැරසී, හැලෙන්නට පෙර තිබූ අලංකාර ඝණ කෙස් කළඹ සහිතව ඉතා සුරූපීව ඇයට දර්ශනය වී ඇගේ වේදනා සහිත අත පිරිමදිද්දී වේදනාව පහව ගියා. ඔබ ඇය ළඟ සිටිද්දී තද පිච්ච මල් සුවඳ විහිදුනා. "අක්කේ, අඬන්න එපා. වේදනාව ඉවසා ගන්නැ"යි දිරි ගැන්වූවා. මෙලෙස ඔබේ මැදහත්කමින් සිදුවූ ප්‍රාතිහාර්යය ගණනකි. දෙවි සමිඳුන්ට ප්‍රශංසා වේවා!.

දුක් වේදනා දරා ගැනීමට ඔබට ශක්තිය, ධෛර්යය, ඉවසීම දානය කළ දේව තාත්තාටත්, ඔබව දැහැමි මඟ ගෙන ගිය ශුද්ධාත්මයාණන් වහන්සේටත්, ඔබව තම සළු සෙවනෙහි රැක ගත් නිමල මරි මවුන්ටත් ඔබ දිවි ගමනේ දී ඔබට දානය කළ වරප්‍රසාද සමුදාය ගැන සහ සදාතනික ජීවිතය ගැන දෙවි සමිඳාණන්ටත් අප පවුලේ සැවොම අප මුළු දිවිය පුරා තුති පුදන්නෙමු.! ප්‍රශංසා වේවා!

**ෆ්ලොරන්ස් වෙත්තසිංහ**
මීගමුව

කකුළෙන් සාමාන්‍ය පෙළ.... 01 පිටුවෙන්

"මාක් ශ්‍රී" සරණ සේවයේ නිර්මාතෘ රීටා පෙරේරා ගුරු මාතාවගේ සෙනෙහස තුළ හැදී වැඩුණු ඈ චතුර ලෙස ඉංග්‍රීසි කථනයට හා ඕගනය වාදනයට දක්ෂකම් දක්වයි. "සමනළ තටු" චිත්‍රපටයේ ප්‍රධාන චරිතයක් රඟපාමින් ඇය උපහාර සම්මාන රැසක් ද දිනා ඇති අති දක්ෂ දැරියකි. සෝමරත්න දිසානායකගේ එම චිත්‍රපටය සඳහා දුලාංජලී ආර්යතිලක දැරියව හඳුන්වා දෙනු ලැබුවේ ප්‍රදීපය කර්තෘ මණ්ඩලයේ කුමර නයනජිත් මහතා ය.

බාහිර ක්‍රියාකාරකම් වලටත් එකසේ දස්කම් පාන දුලාංජලී සැබවින්ම කතෝලික ළමා නිවාසවල විශිෂ්ට ප්‍රමිතිය ගැන නිහඬවම දේශයට ගෙන එන්නේ විශාල පණිවුඩයකි.

2013 - ශ්‍රී ලංකා .... 01 පිටුවෙන්

**මහජන සම්බන්ධතා -**
අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ,

**ශීල ධර්ම හා සසුන් නීති උපදේශක** - අති උතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි. රදගුරු හිමි,

**මිසියෝ ශිෂ්‍යත්ව මණ්ඩලය** - අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා (සා.බෙ.නි.) රදගුරු හිමි (සභාපති) - අති උතුම් පොන්නයියා ජෝශප් රදගුරුහිමි (උප සභාපති)

**මාර්ගෝපදේශ අධ්‍යයන පිළිබඳ රදගුරු ආයතනය**
අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරුහිමි (අනුශාසක)
ගරු ටෝනි මාටින් පියතුමා (අධ්‍යක්ෂ)

**ජුසේ වාස් කාර්යංශය**
අති උතුම් වියානි ප්‍රනාන්දු රදගුරුහිමි

**ජුසේ වාස් භාරකාර අරමුදල**
අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ

# ජා-ඇල කලාපයේ බයිබල් නොමැති දහම් ගුරුවර ගුරුවරියන්ට ශුද්ධවූ බයිබලය නොමිලේ ප්‍රදානය කිරීම



ජා-ඇල කලාපයේ දහම් පාසල් හා බයිබල් අපෝස්තලික සේවා අධ්‍යක්ෂ ගරු ලෙස්ටර් නෝනිස් පියතුමන්ගේ මඟ පෙන්වීම යටතේ විශ්වාසයේ වසර නිමිතිකොට ගෙන ජා-ඇල කලාපීය දහම් ගුරු කමිටුවේ සංවිධානයෙන් එම කලාපයේ ශුද්ධවූ බයිබලය නොමැති දහම් ගුරුවර ගුරුවරියන් 1000 කට ශු. බයිබලය බෙදා දීමේ විශේෂ උත්සවයක් පසුගිය දා කණුවන සා. ජෝශප් දෙව්මැඳුරු ශාලාවේදී අති උත්කර්ෂවත්ව පැවැත්විණි.

එම උත්සවය කොළඹ පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සහ ජා-ඇල කලාපීය අනුනායක අතිගරු ශාන්තිකුමාර් වැලිවිට පියතුමාගේ සහභාගිත්වයෙන් මෙය සිදුකෙරුණු අතර මේ සඳහා කලාපයේ දිසානායක පියතුමන් ද, දහම් පාසල් දිසා අධ්‍යක්ෂ පියතුමන්ද, මීසම් සේවක පියවරුන් ද, ශුද්ධවූ බයිබල් නොමිලේ ප්‍රදානය කළ පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් මයිකල් පෙරේරා මහතා ද පළාත් සභා මන්ත්‍රී ශ්‍රී නාත් පෙරේරා මහතා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීන්, පළාත් සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීන් ද, ජා- ඇල කලාපයේ සියලුම දහම් ගුරුවර ගුරුවරියන් ද සහභාගි වූහ.

## අගරදගුරු පදවි සමිති කොඩි දිනය

අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ පූර්ණ අනුග්‍රහය ඇතිව කොළඹ අගරදගුරු පදවි ශා. වින්සෙන්ති පාවුලා සමිති මධ්‍යම මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන කොඩි දිනය අප්‍රේල් 28 දා පැවැත්වේ. දිළිඳු අය හා රෝගී අයට ආධාර කිරීමටත් දිළිඳු අයගේ නිවාස පිළිසකර කර දීමටත්, දිළිඳු පාසල් ළමුන්ට ආධාර කිරීමටත් මූල්‍ය ආධාර බලාපොරොත්තුවෙන් පැවැත්වෙන මෙම කොඩි දිනය පදවිය පුරා පිහිටුවා ඇති ශා. වින්සෙන්ති පාවුලා කොන්ෆරන්ස 126 ම ක්‍රියාකාරිත්වයෙන් සිදු කෙරේ. කොන්ෆරන්ස මට්ටමින් උපයා ගන්නා එම ආධාර අදාළ කොන්ෆරන්සයේ කරනු ලබන පරිත්‍යාග සඳහා යොදා ගැනීමට නියමිතය. **(එන්. මුතුකුඩආරච්චි)**



මීරිගම ශුද්ධවූ ජපමාල දේවමාතා දෙව්මැඳුරේ මීසම් සේවක ගරු අනුර ශ්‍රී කමල් පියතුමාගේ මඟ පෙන්වීම යටතේ තරුණ සමිතිය සහ වැඩිහිටි දායකත්වයෙන් 60 කට ආසන්න චරිත ඇතුළත් කරමින් අලංකාර සහ අර්ථවත් ලෙස පාද නමස්කාරය හා තුන් පැය ධ්‍යානය සිදු කළහ. මේ සඳහා කතෝලික සැදැහැවතුන් මෙන්ම බොදුනු පිරිසගේ ද සහයෝගය නොමඳව ලැබිණි. බෞද්ධ පරිසරයක් තුළ මෙවන් භක්ති අභ්‍යාසයක් කිරීම ධර්මදූතික මෙහෙවරට විශාල පිටුවහලක් වූ බව බොහෝ දෙනා පැවසූහ.

**(සේයා - තෙහාන් සැමුවෙල්, සටහන - වයලට් සෝමලතා)**

## ගුරුවරුන්ගේ සිසුන්ගේ නාම සාන්තුවරයා



ගුරුවරුන්ගේ සිසුන්ගේ නාම සාන්තුවරයාණන් වන සාන්ත ජෝන් බැප්ටිස් ද ලාසාල් තුමා රදළ වංශවත් පවුලක ඉපිද හැදී වැඩුනු නමුත් දෙවිඳු හඬට අවනත වී තම පවුල තුළින් සහ සමාජය තුළින් එල්ල වූ සියලු අභියෝග යාච්ඤාවේ සහ භාවනාවේ ජීවිතය තුළින් ජයගෙන අති විශිෂ්ට අධ්‍යාපනඥයකු වී සුව හසක් දුවා දරුවන් මඟක් නැතිව අතරමං වී සිටින විට ඔවුන්ගේ ප්‍රඥා ප්‍රදීපය දැල්වීමේ දූත කාර්යයට උර දෙමින් නායකත්වය දීම දෙවිඳු පැසසීමට ගත් අභීත තීරණයකි.

මෙහිදී ඔබතුමාගේ සියලු නම්බු නාම , නිලතල ඉවතලා සියලු ධනය, දේපල වස්තුව දිළිඳුන්ට බෙදා දී සැබෑ දිළින්දකු වී දෙවිඳුන් තුළ මාංශ ගත වී සිසු හදවත් කිතු ප්‍රේමයෙන් ස්පර්ශ කර දෙවිඳුන් හමුවන මඟකියා දෙමින්, දූ දරුවන් අධ්‍යාපනය තුළින් සන්නද්ධ කරන්නට, ප්‍රංශයේ රීම්ස් නගරයෙන් ඇරඹි යුග මෙහෙවර අද රටවල් 81 දක්වා ව්‍යාප්ත වී ඇත.

ද ලාසාල් තුමනි, ඔබ තුමා මෙන් සියලු අභියෝග දෙවිඳු තුළ ජය ගනිමින් සත්‍ය ලෙසම දෙවිඳුන් තුළ මාංශගත වෙමින් දෙවිඳුන්ට පමණක් සාක්ෂි දරමින් සැබෑ ලසාලියානු අනුග ාමිකයන් ලෙස දිවි ගෙ වන්නට අපේ හදවත සහ ප්‍රඥාව අවදි කළ මැනව

**ලාසාල් ගිහි සහයිකා**
**ආචාරිණී ජී. ඒ. නිමාලි ප්‍රනාන්දු**

## ප්‍රදීප ලේඛක සග සුව දිනයි



කළුතර කලමුල්ල කන්‍යාරාමය අසල පදිංචිව සිටි ඥානාර්ථ ප්‍රදීපය ලේඛක ඩබ්ලිව් ඇන්ටනි ප්‍රනාන්දු මහතා සග සුව දිනීය. අවසන් කටයුතු සිදු කෙරුනේ කලමුල්ල ජේසු බිළිඳු දෙව්මැඳුරට අයත් සුසාන භූමියේදීය. එතුමාගේ ආත්මයට නිත්‍ය සුවය ප්‍රදීප පාඨක ලේඛක සැම ප්‍රාර්ථනා කරති.

**(ඇන් ප්‍රනාන්දු)**

## ඉරබඩගම මීසම් ජනතාව, මහ සිකුරාදා දින තඹකන්ද පුදබිමේ



ඉරබඩගම මීසම් සැදැහැවතුන් එක්ව මහ සිකුරාදා දින එළිමහන් පාද නමස්කාරය තඹකන්ද නව මීසමක් බවට පත්වීමෙන් පසුව හතරවෙනි වරටත් තඹකන්ද කල්වාරි පුදබිමට පැමිණ සිදු කරන ලදි.

තඹකන්ද, ඉරබඩගම, නාලවලාන, හා අවට ප්‍රදේශවල සැදැහැවතුන් රාශියකගෙන් සමන්විත වූ මෙම මෙහෙයට කුරුණෑගල පදවි පරිපාලක අතිගරු පියල් ජානක ප්‍රනාන්දු, ගරු තිලකසිරි ප්‍රනාන්දු, ඉරබඩගම මීසම් සේවක ගරු හිලරි රූපස් තෑලිස් ඇතුළු පියතුමන්ද, ගරු පැට්‍රික් සොයුරියන් ද රාශියක් ද එක්ව සිටියහ.

තඹකන්ද සිද්ධස්ථාන පරිපාලක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමාගේ මඟ පෙන්වීම යටතේ තඹකන්ද මීසම් සංඝය විසින් මෙය සංවිධානය කර තිබිණි. **(ජී. බී. එච්. ලිවේරා)**



බෝලවලාන ශුද්ධවූ කානික්ක දේවමාතා දෙව්මැඳුරේ මීසම් සේවක ගරු සුජීව අතුකෝරල පියතුමාගේ මඟ පෙන්වීම යටතේ දේව දයාවේ පින්තූරය දේවස්ථානයට රැගෙන ගොස් සිංහාසනාරූඪ කර දේව දයාවේ මංගල්‍ය මෙහෙය මීසම් වාසීන්ගේ සහභාගිත්වයෙන් පසුගිය දේව දයාවේ ඉරුදිනදී සිදු කරන ලදි. දේව දයාවේ පින්තූරය සිංහාසනාරූඪ කිරීම සඳහා පෙරහරින් රැගෙන යාම සේයාරුවෙන් දිස්වේ.



මත්තුමගල ශ්‍රී හෘදය දෙව්මැඳුරේ ප්‍රථම වරට ශ්‍රී කුරුස ප්‍රතිමාවක් උපයෝගී කරගනිමින් මහා සිකුරාදා දුක්ප්‍රාප්ති මෙහෙය පැවැත්විණි. මීසම් සේවක ගරු ශිරාන් පියතුමාගේ මඟ පෙන්වීම යටතේ මීසම් සභාවේ සහයෝගයෙන් එම කටයුතු මැනවින් සංවිධානය කළ අතර ගරු ලක්මිත් ප්‍රසංග පියතුමා විසින් හරවත් දෙසුමින් ජනතාව පොහොණි කළේය. විශාල සැදැහැවතුන් පිරිසක් මේ සඳහා සහභාගි වූහ. **(ටී. ක්‍රිෂාන් ප්‍රනාන්දු)**

## සේවා ඇගයුම් ප්‍රණාම



කුරුකුලාව උතුර / දකුණ, හීන්කෙන්ද, තුඩුවේගෙදර, හොරපේ, හොරපේතුඩුව ග්‍රාම සේවා වසම් තුළ දීර්ඝ කාලයක් සේවය කරන ලද ග්‍රාම සේවා නිලධාරි මහත්ම මහත්මීන් හයදෙනකු වෙත; උපහාර තිළිණ පිදීමේ උත්සවයක්, පසුගිය ඉරුදින සවස වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඇන්ටනි කුරේ මහත්මාගේ සහ වත්තල පළාත් සභා මන්ත්‍රී ජානක සූරියබණ්ඩාර මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් විහාරස්ථාන සතරක විහාරාධිපති ගරු ස්වාමීන් වහන්සේගේ "සෙත් පිරිත්" සහ ආගමික වතාවත් පවත්වා ප්‍රදේශවාසීන් රැසකගේ සහභාගිත්වයෙන් කුරුකුලාව සා. ලාසරස් දහම් පාසල් උත්සව ශාලාවේදී සිදුකරන ලදි.

**(සේයා සටහන - එච්. ඒ. කල්දේරා)**

## අඩු පහසුකම් සහිත විදුහලින් 2012 උසස් පෙළ විශිෂ්ට ප්‍රතිඵල

2012 අ.පො.ස. උසස් පෙළ විභාගයේ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂය සඳහා දිවයිනේම එකම "ඒ" සාමාර්ථය ඉතා අඩු පහසුකම් මැද ඉගෙනුම ලබන බප/ මීග/ ඒකල මහා විද්‍යාලයේ ශිෂ්‍යාවක විසින් ලබා ගෙන ඇතැයි "ප්‍රදීපය"ට වාර්තා වෙයි.

එම විෂය සඳහා විදුහලෙන් පෙනී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් දස දෙනාම සාමාර්ථය ලබා ඇත.

ආර්ථික අසීරුතා ඇති පවුල්වල දරුවන් වන මොවුන් ඉගෙනුම ලබනුයේ තහඩු මඩුවක ය. පංතියට ස්ථිර මේස පුටු නොමැත. තම ප්‍රධාන පංතියෙන් පුටු රැගෙන විත් අභ්‍යාස පොත් අත මත තබාගෙන මොවුන් පාඩම් සටහන් ලියති.

මෙම විදුහලේ කිතුනුවකු නොවන විදුහල්පති ඒ. වික්‍රමසිංහ මහතා හැකි උපරිම ලෙස සහය දෙන අතර දුෂ්කරතා මැද නිර්මලී පීරිස් ගුරු මහත්මිය විෂය භාරව කටයුතු කරයි. මීට කලකට පෙර "ගස් යට උසස් පෙළ පංති" යනුවෙන් මෙම පංතිය පිළිබඳව "ප්‍රදීපයේ" පළ කළ පුවතක ප්‍රතිඵලයක් ලෙසින් එම පංතිය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් බ. ප. මන්ත්‍රී මෙරිල් පෙරේරා මහතාගේ ප්‍රතිපාදන වලින් ලබා දීමට සූදානම් බව දැනගන්නට ඇත. මෙම විදුහලේ අදාළ පංතිය සඳහා අවශ්‍ය ආධාර පහසුකම් ලබාදීමට පරිත්‍යාග ශීලි සැදැහැවතුන්ට අවස්ථාව ඇත. **(සී. ආර්. ඩික්සන් ඇන්ටනි)**